HARTI



# වාර්ෂික වාර්තාව
# ஆண்டு அறிக்கை
# ANNUAL REPORT
# 2023

Hector Kobbekaduwa Agrarian Research and Training Institute

# පටුන


| | | |
|---|---|---|
| **පරිච්ඡේදය - 01** | | |
| ආයතන පැතිකඩ/විධායක සාරාංශය | | 1-9 |
| 1.1 | හැඳින්වීම | 01 |
| 1.2 | සංවිධාන ව්‍යුහය | 02 |
| 1.3 | පාලක මණ්ඩලය | 04 |
| 1.4 | පාලක මණ්ඩල රැස්වීම් | 05 |
| 1.5 | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් | 05 |
| 1.6 | විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයින් | 05 |
| 1.7 | පර්යේෂණ හා පුහුණු කමිටුව | 05-07 |
| 1.8 | විධායක සාරාංශය | 08-09 |
| පරිච්ඡේදය- 02 | | |
| ප්‍රගතිය සහ අනාගත දැක්ම, විශේෂ ජයග්‍රහණ අභියෝග සහ අනාගත ඉලක්ක | | 11-44 |
| 2.1 | පර්යේෂණ අංශ | 12 |
| 2.2 | පර්යේෂණ ප්‍රගතිය | 13 |
| 2.3 | අධ්‍යාපන හා පුහුණු අංශය | 27 |
| 2.4 | දත්ත කළමනාකරණ අංශය | 32 |
| 2.5 | තොරතුරු හා සන්නිවේදන අංශය | 33 |
| 2.6 | පුස්තකාලය | 37 |
| 2.7 | බාහිර සහයෝගිතාවන් | 38 |
| **පරිච්ඡේදය- 03** | | |
| **වාර්ෂික මූල්‍ය කාර්යසාධනය** | | |
| 3.1 | අවසන් ගිණුම | 45 |
| 3.2 | විගණන නිරීක්ෂණ | 62 |
| 3.3 | විගණන පිළිතුරු | 68 |
| **පරිච්ඡේදය- 04** | | |
| **කාර්යසාධක දර්ශක** | | **73** |
| **පරිච්ඡේදය- 05** | | |
| **තිරසාර සංවර්ධන ඉලක්ක සපුරාලීමේ කාර්යසාධනය** | | **75-78** |
| **පරිච්ඡේදය- 06** | | |
| **මානව සම්පත් පැතිකඩ** | | 79 -80 |
| **පරිච්ඡේදය- 07** | | **81-87** |
| අනුකූලතා වාර්තාව | | |

# පරිච්ඡේදය - 01
# ආයතන පැතිකඩ/විධායක සාරාංශය

## 1.1 හැඳින්වීම

### අප ගැන

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය (Hector Kobbekaduwa Agrarian Research and Training Institute - HARTI) 1972 අංක 05 දරණ පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද කෘෂිකර්ම අමාත්‍යාංශයට අනුබද්ධිත ව්‍යවස්ථාපිත ආයතනයකි. ගොවිකටයුතු සහ ග්‍රාමීය සංවර්ධනයට අදාළ සමාජ - ආර්ථික පර්යේෂණ සිදුකිරීම සහ එම පර්යේෂණයන්හි සොයා ගැනීම්, ප්‍රතිපත්තිමය තීරණ ගැනීම පිණිස ප්‍රතිපත්ති සම්පාදකයින් වෙත යොමු කිරීම ආයතනයේ ප්‍රධාන කාර්යභාරයකි. සමාජ - ආර්ථික හා ග්‍රාමීය සංවර්ධනයේ කෘෂිකාර්මික පැතිකඩ පිළිබඳ විමර්ශනය කිරීමට බලය පැවරී ඇති එකම ආයතනය ද අප ආයතනය වේ. වසර 52ක ඉතිහාසය පුරා රාජ්‍ය සහ පුද්ගලික අංශ, පර්යේෂකයන් සහ පොදු ජනතාව වෙනුවෙන් උසස් තත්ත්වයේ දත්ත හා තොරතුරු ලබා දීමේ වැදගත් කාර්යභාරයක් අප ආයතනය විසින් ඉටු කර ඇත. වැඩමුළු සංවිධානය කිරීම තුළින් සියලුම පාර්ශ්වකරුවන්ට පර්යේෂණවල සොයා ගැනීම් හුවමාරු කිරීම සඳහා පහසුකම් සැපයීම අනෙකුත් ක්‍රියාකාරකම් අතර වේ. එක් එක් ක්ෂේත්‍රයන්ට අදාළව සංවිධානය කෙරෙන පුහුණු වැඩසටහන් තුළින් ආකල්ප සංවර්ධනය, ගොවීන්, නිලධාරීන් ඇතුළු අනෙකුත් පාර්ශ්වයන්ගේ කුසලතා සහ දැනුවත්භාවය ඉහළ නැංවීම අප ආයතනයෙන් ඉටු කෙරෙන තවත් වැදගත් කාර්යභාරයන් වේ.

### දැක්ම

- තිරසාර ගොවිජන හා ග්‍රාමීය සංවර්ධනය සඳහා දැනුම ජනනය කර බෙදා හැරීමේ ප්‍රමුඛයා වීම.

### මෙහෙවර

- පර්යේෂණ හා පුහුණු කිරීම් තුළින් ගොවිජන හා ග්‍රාමීය ක්ෂේත්‍රය ශක්තිමත් කිරීම.

### ඉලක්ක

- දැනුම උත්පාදනය කිරීම සහ කාලෝචිත ලෙස ව්‍යාප්ත කිරීම තුළින් ප්‍රතිපත්ති ක්‍රියාවලිය වඩාත් ඵලදායී බවට පත් කිරීම.
- ජාතික ප්‍රතිපත්තිමය ගැටලු සම්බන්ධයෙන් ස්වාධීන තක්සේරුවක් ලබා දීමෙන් මහජනතාව දැනුවත් කිරීම.
- ආයතනයේ කාර්ය මණ්ඩලය සහ ආයතනයේ දැනුමේ පදනම සඳහා ආයෝජනය කිරීම මගින් සමාජ-ආර්ථික ප්‍රතිපත්ති විශ්ලේෂණය සඳහා ඇති හැකියාව ශක්තිමත් කිරීම.
- පුහුණුව තුළින් ග්‍රාම සංවර්ධන පාර්ශ්වකරුවන්ගේ ධාරිතාව වැඩි කිරීම.

### අරමුණු

- ප්‍රතිපත්ති සම්පාදකයින්, ගොවීන් සහ වෙළඳුන් වෙත වෙළඳපොළ තොරතුරු කාලෝචිත ලෙස බෙදා හැරීම.
- ගොවිජන ප්‍රතිපත්ති ඉදිරි දර්ශන හඳුනාගැනීම.
- කෘෂිකාර්මික ගැටලු සම්බන්ධයෙන් පර්යේෂණ සැලසුම් කිරීම හා ප්‍රමුඛතා සැකසීම.

- රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සංවිධාන, විශ්වවිද්‍යාල, ජාත්‍යන්තර සහ කලාපීය පර්යේෂණායතන / නියෝජිතායතන සමඟ සබඳතා ගොඩනඟා ගැනීම
- කැප වූ, දක්ෂ හා තෘප්තිමත් සේවක කණ්ඩායමක් සම්බන්ධ කර ගැනීම

## උපාය මාර්ග

- පර්යේෂණ හා පුහුණු කමිටුව (Research and Training Committee - RTC) ශක්තිමත් කිරීම.
- තේමාත්මක ක්ෂේත්‍ර පිළිබඳ එකඟත්වය ලබා ගැනීම.
- විවිධ වර්ගයේ ප්‍රකාශනවල ඒකාකාරීත්වය සහතික කිරීම.
- පර්යේෂණ යෝජනාවක් සකස් කිරීමේ දී සාහිත්‍ය සමාලෝචනය වැඩි දියුණු කිරීම.
- ප්‍රකාශයට පත් කිරීමට පෙර සියලු ම පර්යේෂණ වාර්තා සම-සමාලෝචනයෙන් පසු බාහිර සමාලෝචනයක් වෙත යොමු කිරීම.
- ආයතන සභරාවේ සෑම කලාපයක ම වගකීම අදාළ අංශයට පැවරීම.
- වෘත්තීය සංස්කාරකවරුන්ගේ සේවාවන් සුරක්ෂිත කිරීම සඳහා අනුශාසකවරුන්ගේ සහාය ලබා ගැනීම.
- සිංහල සහ දමිළ භාෂාවෙන් පර්යේෂණ ප්‍රකාශයට පත් කිරීම් වැඩි කිරීම.
- ජ්‍යෙෂ්ඨ මට්ටමේ පර්යේෂකයන් බඳවා ගැනීම.
- එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) හරහා විදේශීය පර්යේෂකයන් සම්බන්ධ කර ගැනීමේ හැකියාව සොයා බැලීම.
- විශ්වවිද්‍යාල සමඟ සම්බන්ධතා ඇති කර ගැනීම.
- වසර අවසානයේදී පර්යේෂණ සොයා ගැනීම් තුළින් ලබා ගත් දැනුම බෙදා හැරීම සඳහා ශාස්ත්‍රීය සම්මන්ත්‍රණයක් පැවැත්වීම.
- කාර්ය සාධනය මත පදනම් වූ මැනිය හැකි ඇගයීම් පද්ධතියක් හඳුන්වා දීම.
- ධාරිතාවයන් හා පහසුකම් වැඩි දියුණු කිරීම.
- මුද්‍රිත ප්‍රකාශනවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම

## 1.2 සංවිධාන ව්‍යුහය




HECTOR KOBBEKADUWA AGRARIAN RESEARCH & TRAINING INSTITUTE
ORGANIZATION CHART 2015
HARTI
DIRECTOR
ADDITIONAL DIRECTOR
REGISTRAR
HEAD / RF MFPA
HEAD / RF HRID
HEAD / RF APPE
HEAD / RF ARM
HEAD / RF EWRM
SRO
RO
SSO
SO
SA
ACCOUNTANT
ASST. REGR. (ADMIN)
AO
IA
IAA
PA
TA
BK
HK
AR(P)
EDITOR
SIPO
LIBRARIAN
SDA
SAP
IPO
ASST. LIBRARIAN
DA
AP
VAT
LIBRARY ASST.
CTA
MANAGEMENT ASST.
DRIVERS
CBK
BINDING OPERATOR
OFFICE AIDE/LABOURS/CONFERENCE HALL ATTENDENT/HOSTEL ATTENDENT/PRINTING AIDE/LIBRARY ATTENDENT

## 1.3. පාලක මණ්ඩලය - 2023

| | | |
|---|---|---|
| ගුණදාස සමරසිංහ මහතා | **පාලක මණ්ඩල සභාපති** | ලේකම් - කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, (2023 ජනවාරි සිට ඔක්තොම්බර් දක්වා) |
| ජානක ධර්මකීර්ති මහතා | පාලක මණ්ඩල සභාපති | ලේකම් - කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, (2023 ජනවාරි සිට ඔක්තොම්බර් දක්වා) |
| ආචාර්ය ජී.ජී. බන්දුල මහතා | | අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී - හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය |
| පී. මාලතී මහත්මිය | පාලක මණ්ඩල සාමාජික | කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| කේ.ඩී. බන්දුල ජයසිංහ මහතා | එම | ඉඩම් කොමාසාරිස් ජනරාල් -ඉඩම් කොමාසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව |
| ජ්.එච්.එම්.එල්. අබේරත්න මහතා | එම | ගොවිජන සංවර්ධන කොමාසාරිස් ජනරාල් - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව |
| ඉංජි. ඩී.පී. ත්‍රිමහවිතාන මහත්මිය | එම | වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් - වාරිමාර්ග දෙපාර්තමේන්තුව . (2023 ජනවාරි සිට ජුනි දක්වා) |
| ඉංජි. අජිත් ගුණසේකර මහතා | එම | වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් - වාරිමාර්ග දෙපාර්තමේන්තුව (2023 ජුලි සිට) |
| ඩී. ජීවනාදන් මහතා | එම | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් (2023 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා) |
| එච්.ඒ. ආශා හපුආරච්චි මෙනවිය | එම | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් (2023 ඔක්තොම්බර් සිට) |
| ජී.ඩී.එස්.එන්. චන්ද්‍රසේන මහතා | එම | අතිරේක ලේකම් - (කෘෂිකර්ම සංවර්ධන- 1) කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය |
| පුබුදිකා එස්. බණ්ඩාර මහත්මිය | එම | ජ්‍යේෂ්ඨ සහකාර ලේකම්, (පරිපාලන) ඉඩම් අමාත්‍යාංශය |
| ඩී.ජී. නිලුකා කුමාරි මෙනවිය | එම | අධ්‍යක්ෂ - මුදල් ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය |
| අරුණි රණසිංහ මහත්මිය | එම | අතිරේක ලේකම් (පරිපාලන) - වැවිලි අමාත්‍යාංශය |
| එච්.අයි.ඩී.ඩී. හෙට්ටිආරච්චි මහත්මිය | එම | අධ්‍යාපන අධ්‍යක්ෂ - (කෘෂිකර්ම සහ පරිසර) අධ්‍යාපන අමාත්‍යාංශය |
| ඕ.එම්. ජබීර් මහතා | එම | අතිරේක ලේකම් - (පරිපාලන) වාරිමාර්ග අමාත්‍යාංශය |
| ඊ.ජී. ඒකනායක මෙනවිය | එම | සහකාර ලේකම් - වෙළඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය |
| එන්.ජී.ජී. විජේසිරි මහතා | එම | ප්‍රාදේශීය කළමනාකරු- මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාලය |
| මහාචාර්ය කේ.ජී.එස්.එස්. කොඩිතුවක්කු | එම | පීඨාධිපති - කෘෂිකර්ම පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය |

## 1.4. පාලක මණ්ඩල රැස්වීම් - 2023

| රැස්වීම පැවැත් වූ දිනය | | සහභාගී වූ සාමාජිකයින් ගණන |
|---|---|---|
| 1. | 2023 පෙබරවාරි 28 | 14 |
| 2. | 2023 මැයි 11 | 12 |
| 3. | 2023 ජුනි 27 | 15 |
| 4. | 2023 අගෝස්තු 29 | 15 |
| 5. | 2023 සැප්තැම්බර් 26 | **13** |
| 6. | 2023 නොවැම්බර් 28 | **15** |

## 1.5 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් - 2023

රැස්වීම ගණන - 04

රැස්වීම පැවැත් වූ දිනය - 2023 පෙබරවාරි 27
2023 ජුලි 26
2023 අගෝස්තු 11
2023 නොවැම්බර් 27

## 1.6. විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයින්

| | | |
|---|---|---|
| ඩී.ජී. නිලුකා කුමාරි මහත්මිය | සභාපති | අධ්‍යක්ෂ - මුදල් ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය |
| ගිල්මා දහනායක මහත්මිය | සාමාජික | අතිරේක ලේකම් - වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය - (2023 පෙබරවාරි |
| ඊ.ඒ. ඒකනායක මෙනවිය | සාමාජික | අතිරේක ලේකම් - වෙළඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය - (2023 ජුලි සිට) |
| අරුණි රණසිංහ මහත්මිය | සාමාජක | අතිරේක ලේකම් - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය |
| ඊ.ඩබ්.ජී.කේ. ප්‍රියදර්ශන මහතා | නිරීක්ෂක | ප්‍රධාන අභ්‍යන්තර විගණක - කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය |
| එම්.අයි. වේලාරත්න මෙනවිය | නිරීක්ෂක | විගණන අධිකාරී - විගණකාධිපති දෙපාර්තමේන්තුව |

## 1.7. පර්යේෂණ හා පුහුණු කමිටුව

| අනු අංකය | නම | තනතුර / ආයතනය |
|---|---|---|
| 01 | ගෞරවනීය මහාචාර්ය විජිතපුර විමලරත්න හිමි | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය<br>ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුව<br>කලා පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය |
| 02 | මහාචාර්ය එල්.එම්. අබේවික්‍රම | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය<br>කෘෂිකාර්මික ආර්ථික සහ ව්‍යාප්ති දෙපාර්තමේන්තුව<br>කෘෂිකර්ම පීඨය, රුහුණු විශ්ව විද්‍යාලය |
| 03 | එම්.එම්.එම්. අහියර් මහතා | පර්යේෂණ නිලධාරි<br>ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනය |
| 04 | මහාචාර්ය ඩී.පී.එස්. චන්ද්‍රකුමාර | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය<br>ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුව<br>මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය |

| | | |
|---|---|---|
| 05 | මහාචාර්ය එන්.ඩී.කේ. දයාවංශ | මහාචාර්ය<br>කෘෂිකාර්මික ඉංජිනේරු දෙපාර්තමේන්තුව<br>කෘෂිකාර්මික පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය |
| 06 | ආචාර්ය පී.බී. ධර්මසේන | ප්‍රධාන විද්‍යාඥ<br>පර්යේෂණ සහ සංවර්ධනය සඳහා ජාත්‍යන්තර මධ්‍යස්ථානය |
| 07 | දිලීපා එම්. ඇදගමගේ මහත්මිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය<br>තීරණ විද්‍යා දෙපාර්තමේන්තුව<br>කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ පීඨය<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය |
| 08 | ආචාර්ය ඒ.පී.එස්. ප්‍රනාන්දු | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය<br>කෘෂිකාර්මික පද්ධති දෙපාර්තමේන්තුව<br>කෘෂිකාර්මික පීඨය, රජරට විශ්ව විද්‍යාලය |
| 09 | ආචාර්ය ෆ්‍රැන්ක් නිරංජන් | උපදේශක<br>හිටපු අතිරේක අධ්‍යක්ෂ<br>කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සඳහා ශ්‍රී ලංකා කවුන්සිලය |
| 10 | ආචාර්ය ෆ්‍රෙඩ්රික් අබේරත්න | උපදේශක<br>හිටපු කෘෂිකාර්මික ආර්ථික විද්‍යාඥ<br>එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන |
| 11 | මහාචාර්ය එච්.එම්. ගුණතිලක | උපදේශක<br>හිටපු අධ්‍යක්ෂ (පරිසරය සහ ආරක්ෂිත ආරක්ෂක |
| 12 | මහාචාර්ය ඊ.ආර්.එන්. ගුණවර්ධන | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය<br>කෘෂිකාර්මික ඉංජිනේරු දෙපාර්තමේන්තුව<br>කෘෂිකාර්මික පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය |
| 13 | මහාචාර්ය කේමින්ද හේරත් | මහාචාර්<br>කෘෂි ව්‍යාපාර කළමනාකරණ දෙපාර්තමේන්තුව<br>කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය<br>වයඹ විශ්ව විද්‍යාලය |
| 14 | ආචාර්ය පී.එච්.ඒ.පී.සී. ගිරිහගම | ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ<br>කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සඳහා ශ්‍රී ලංකා කවුන්සිලය |
| 15 | මහාචාර්ය මංජුල පී. සුමිත් මාගමගේ | මහාචාර්ය<br>පශු සම්පත් නිෂ්පාදන දෙපාර්තමේන්තුව<br>කෘෂිකාර්මික විද්‍යා පීඨය<br>සබරගමුව විශ්ව විද්‍යාලය |
| 16 | ඉංජිනේරු ඩී.ඩී. ප්‍රභාත් විතාරණ | උපදේශක<br>හිටපු ප්‍රධානී - ජල කළමනාකරණ අංශය<br>කෘෂිකාර්මික සංවර්ධන දෙපාර්තමේන්තුව |
| 17 | මහාචාර්ය ඩී.වී.පී. ප්‍රසාද | මහාචාර්ය<br>කෘෂිකාර්මික ආර්ථික හා ව්‍යාපාර කළමනාකරණ<br>දෙපාර්තමේන්තුව, කෘෂිකාර්මික පීඨය<br>පේරාදෙණිය විශ්ව විද්‍යාලය |
| 18 | මහාචාර්ය ප්‍රසාන්ති ගුණවර්ධන | මහාචාර්ය<br>වන හා පරිසර විද්‍යා දෙපාර්තමේන්තුව<br>ව්‍යවහාරික විද්‍යා පීඨය<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය |
| 19 | ආචාර්ය ප්‍රියංග දුණුසිංහ | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය<br>ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුව<br>කලා පීඨය<br>කොළඹ විශ්ව විද්‍යාලය |
| 20 | ආචාර්ය එල්.පී. රූපසේන | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය<br>කෘෂිකාර්මික පද්ධති දෙපාර්තමේන්තුව<br>කෘෂිකාර්මික පීඨය<br>රජරට විශ්ව විද්‍යාලය |

| | | |
|---|---|---|
| 21 | ආචාර්ය කේ. සූරියකුමාර | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය<br>කෘෂිකාර්මික ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුව<br>කෘෂිකාර්මික පීඨය, යාපනය විශ්ව විද්‍යාලය |
| 22 | ආචාර්ය එම්. සමාඩ් | උපදේශක<br>හිටපු ප්‍රධානී - දකුණු ආසියා කාර්යාලය<br>ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනය |
| 23 | මහාචාර්ය එච්.එම්.සමන් කේ. හේරත් | මහාචාර්ය<br>පීඨාධිපති<br>සත්ත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්ම පීඨය<br>ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය |
| 24 | ආචාර්ය ශාන්ත විජේසිංහ | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය<br>භූගෝල විද්‍යා දෙපාර්තමේන්තුව<br>මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය |
| 25 | ආචාර්ය තිවහාරි ගෙරෙතරන් | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>කෘෂිකාර්මික ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුව<br>කෘෂිකර්ම පීඨය<br>නැගෙනහිර විශ්ව විද්‍යාලය |
| 26 | මහාචාර්ය ටියුඩර් සිල්වා | සම්මානනීය මහාචාර්ය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව<br>පේරාදෙණිය විශ්ව විද්‍යාලය |

## 1.8. විධායක සාරාංශය



2022 වර්ෂය තුළ රට තුළ පැවති අයහපත් සමාජ ආර්ථික තත්ත්වය සියලුම ගොවි ප්‍රජාවන්ට සැලකිය යුතු අභියෝගයක් එල්ල කළේය. මෙම තත්ත්වය හඳුනා ගනිමින් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය විසින් ප්‍රධාන කෘෂිකාර්මික ගැටලු විසඳීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරන ලදී.

මෙම සැලැස්මට පර්යේෂණ වාර්තා, ප්‍රතිපත්ති සංක්ෂිප්ත (Policy briefs), පුහුණු වැඩසටහන් සහ ගොවි සහ ව්‍යවසායක ප්‍රජාවන්ගේ අවශ්‍යතාවලට ගැළපෙන ලෙස නිර්මාණය කළ මාධ්‍ය අන්තර්ගතයන් ඇතුළත් විය. 2023 වර්ෂය තුළ, ඒකාබද්ධ අරමුදල් භාවිතා කරමින් පර්යේෂණ අධ්‍යයන 11ක් සිදු කරන ලදී.

රට තුළ ඒ වන විට වර්ධනය වෙමින් පැවති ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ ගැටලු සොයා බැලීම ඉලක්ක කර ගත් අධ්‍යයන ද ඒ අතර විය. මීට අමතරව, ශ්‍රී ලංකාවේ පලතුරු සහ එළවළු අපනය ක්ෂේත්‍රයට සහ කුකුළු ආහාර නිෂ්පාදන ක්ෂේත්‍රයට ආර්ථික අර්බුදයේ බලපෑම ඇගයීම සඳහා අධ්‍යයන දෙකක් සිදු කරන ලදී. ශ්‍රී ලංකාවේ දේශගුණික සුහුරු කෘෂිකර්මාන්තය ඉලක්ක කර ගත් අධ්‍යයන තුනක් ද මෙම වර්ෂය තුළ සිදු කර ඇත. මෙම අධ්‍යනයන්හි අරමුණ වූයේ දේශගුණික සුහුරු කෘෂිකර්මාන්තයෙහි සාර්ථකත්වයන් සහ අභියෝග අවබෝධ කර ගැනීම, දේශගුණික අවදානමට ලක්විය හැකි ගොවීන් සවිබල ගැන්වීම සහ දේශගුණික සුහුරු විසඳුම් ඵලදායී ලෙස ක්‍රියාවට නැංවීමයි. ශ්‍රී ලංකාවේ මල් වගා ක්ෂේත්‍රය ඉහළ නැංවීමට ඇති විභවයන් සහ බාධාවන් පිළිබඳ පුළුල් පරීක්ෂණයක් සමඟින්, සකස් කළ පලතුරු සහ එළවළු කර්මාන්තය කෙරෙහි අවධානය යොමු කරන ලද අතිරේක අධ්‍යයන දෙකක් ද මෙම වර්ෂයේ සිදුකළ අතර විය. සත්ත්ව පාලනය සහ නිෂ්පාදනය කේන්ද්‍ර කරගත් අධ්‍යයන දෙකක් ද මෙම වර්ෂය තුළ සිදු කරන ලද අතර ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ කිරි නිෂ්පාදනයේ තාක්ෂණික කාර්යක්ෂමතාව මෙන්ම බ්‍රොයිලර් කුකුල් මස් සහ බිත්තර නිෂ්පාදන පිරිවැය කෙරෙහි බලපාන සාධක පිළිබඳව මෙම අධ්‍යයනයන්හි අවධානය යොමු විය.

තවද, වෙළෙඳපොළ බුද්ධි තොරතුරු ව්‍යාපෘතියේ (Market Intelligence projects) කොටසක් ලෙස , දෛනික වෙළඳපළ මිල ගණන් එකතු කිරීම සහ සතිපතා සහ මාසික විවරණිකා සම්පාදනය කිරීම සිදු කරන ලදී. භෞතික ප්‍රගතිය 100%ක් ලෙස සනිටුහන් කරමින් 2023 වර්ෂය පුරාවට ආහාර ද්‍රව්‍ය විවරණිකාව දෛනිකව, සතිපතා සහ මාසික පදනමින් සම්පාදනය කර බෙදා හරින ලදී. මෙම ව්‍යාපෘතිය මීට අතිරේකව රාජ්‍ය ආයතන සහ පුද්ගලයන්ගේ දත්ත, විශ්ලේෂණ සහ සමාලෝචන සඳහා වන ඉල්ලීම්වලට නිරන්තරයෙන් සහ කඩිනමින් ප්‍රතිචාර දැක්විය.

ග්‍රාමීය සහ අර්ධ නාගරික ප්‍රජාවන්ගේ ගෘහස්ථ ආහාර සුරක්ෂිතතාව ඉහළ නැංවීම අරමුණු කරගත් දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා ප්‍රතිලාභීන් 1394 දෙනකු සහභාගි වූහ. මුලතිව්, කිලිනොච්චි, මොනරාගල සහ නුවරඑළිය දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 30ක් තුළ මෙම වැඩසටහන් 30ක් සංවිධානය කරන ලද අතර පුළුල් ප්‍රජා සහභාගීත්වයක් දක්නට ලැබුණි. මීට අමතරව, කෘෂිකර්මාන්තයේ ව්‍යවසායකත්වය දිරිගැන්වීම සඳහා කාන්තා සහ තරුණ ගොවීන් ඉලක්ක කර ගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහන් 33ක් හම්බන්තොට, ගාල්ල, මාතලේ, පොළොන්නරුව සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල ප්‍රතිලාභීන් 1,386 දෙනෙකුගේ සහභාගීත්වයෙන් සාර්ථකව නිම කරන ලදී.

ආයතනයේ දැනුම ව්‍යාප්ත කිරීමේ උපාය මාර්ග ලෙස මූලික වශයෙන් ජනමාධ්‍ය සහ ආයතන ප්‍රකාශන භාවිතා කිරීමට ඉහළ වැදගත්කමක් ලබා දී ඇත. මෙම කාල සීමාව තුළ පර්යේෂණ වාර්තා හයක් ප්‍රකාශයට පත් කරන ලද අතර මුද්‍රණ පිරිවැය අවම කිරීම සඳහා සියලුම පර්යේෂණ වාර්තා ආයතනික වෙබ් අඩවිය උඩුගත කරන ලදී. 2023 වර්ෂය සඳහා වන 'Sri Lanka Journal of Agrarian Studies' පළමු කලාපය සහ එහි සිංහල

ප්‍රකාශනය වන "ගොවිකටයුතු අධ්‍යයන" සාර්ථකව ප්‍රකාශයට පත් කිරීමට හැකි විය. මීට අමතරව, ‘ගොවි ජනතා’ සඟරාවේ පළමු කලාපය සහ ‘ගොවිකටයුතු පුවත්හසුනෙහි’ කලාප හතරක් නිකුත් කෙරිණි.

කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සිංහල මාධ්‍ය ජාතික පුවත්පත වන 'ගොවිමිණ' මාසික කලාප හයක් ප්‍රකාශයට පත් කරන ලද අතර 'ගොවිමිණ' දෙමළ සඟරාවේ කලාප තුනක් විශේෂයෙන් රටේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල ගොවීන් අතර බෙදා දෙන ලදී. තව ද, ආයතනය විසින් සිදු කරන ලද නවතම පර්යේෂණ මත පදනම් වූ සාකච්ඡාමය වැඩසටහන් 26ක් "ගොවිජන කතිකාවත" නාමය යටතේ ආයතනික යූටියුබ් නාලිකාව හරහා නිෂ්පාදනය කර ප්‍රචාරය කරන ලදී.

භාණ්ඩාගාර අරමුදල්වලට අමතරව, ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO), ලෝක ආහාර වැඩසටහන (WFP), වර්ල්ඩ් විෂන් ආයතනය (World Vision), නිපෝන් කොයි (Nippon Koie) (JICA විද්වත් කණ්ඩායම) සහ DevPro Guarantee Ltd, ඔක්ස්ෆෑම්, ඕස්ට්‍රේලියානු ආධාර සංවිධානය, (OXFAM/Australian Aid) වැනි ජාත්‍යන්තර සංවිධාන සමඟ සහයෝගී පර්යේෂණ අධ්‍යයන සහ උපදේශන සේවා ලබා දෙන ලදී. 2023 වර්ෂය තුළ මෙම සංවිධාන සාමූහිකව රුපියල් මිලියන 52ක පමණ දායකත්වයක් ලබා දී ඇත. මෙම සම්බන්ධතා සහ සහයෝගීතාවයන්, හවුල්කාරිත්වයන් තුළින් ආයතනයේ විෂයපථය තවදුරටත් වැඩිදියුණු කිරීමේ හැකියාව ඇත.

ආයතනයේ කාර්යයන් ජවසම්පන්න ලෙස ඉටු කිරීම වෙනුවෙන් ලබා දුන් අතිමහත් සහයෝගය සඳහා සියලු ම කාණ්ඩවලට අයත් සමස්ත කාර්ය මණ්ඩලයට මගේ අවංක කෘතඥතාව පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. පර්යේෂණ ක්‍රියාවලිය සංකල්පීයකරණයේ සිට පර්යේෂණ වාර්තා ප්‍රකාශයට පත් කිරීම දක්වා පර්යේෂණ ක්‍රියාවලිය අධීක්ෂණය කරන පර්යේෂණ හා පුහුණු කමිටුව අපගේ කාර්යයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට ද සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇති බවද මෙහිදී සිහිපත් කළ යුතුය.

ආයතනයෙහි කටයුතු ඉහළ ම ප්‍රමිතීන්ට අනුකූලව සිදු කිරීම සඳහා පාලක මණ්ඩලය විසින් සපයන ලද සහයෝගය සහ මඟපෙන්වීම පිළිබඳව ද මම කෘතඥ වෙමි. අවසාන වශයෙන්, 2023 වසරේ යම් යම් අභියෝගාත්මක තත්ත්වයන් එළැඹිය ද පර්යේෂණ සහ සහායක කාර්ය මණ්ඩලය විසින් පෙන්නුම් කළ අසීමිත කැප කිරීම් හේතුවෙන් 2023 වර්ෂය සාර්ථක වර්ෂයක් කර ගැනීමට හැකිවීම අප ආයතනය ලද සුවිශේෂී ජයග්‍රහණයක් බව සඳහන් කළ යුතුය.

ආචාර්ය ජී.ජී. බන්දුල
අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී

# 02 වන පරිච්ඡේදය
## ප්‍රගතිය සහ අනාගත දැක්ම, විශේෂ ජයග්‍රහණ
## අභියෝග සහ අනාගත ඉලක්ක



## 2.1. පර්යේෂණ අංශ

### 01.ආහාර පද්ධති අංශය

චක්‍ර ආර්ථික දෘෂ්ටිකෝණයකින්, ආහාර පද්ධති අත්‍යවශ්‍යයෙන්ම ඒකාබද්ධ පරිභෝජනය, නිෂ්පාදනය, සැකසීම, ශ්‍රමය සමඟ බෙදා හැරීම, බලශක්තිය සහ අපද්‍රව්‍ය චලනයන් ලෙස සහ ප්‍රතිපත්ති සහ දේශගුණය හැඩගස්වන්නන් ලෙස ඒකාබද්ධ වේ. කෙසේ වෙතත්, ආහාර පද්ධති අංශය අරමුණු තුනක් දක්වා අඩු කර ඇති අතර ඒවා අදාළ අංග හරහා ඒකාබද්ධ විය. ඒවා නම්, ආහාර භාවිතය. ආහාර සඳහා ප්‍රවේශය. ආහාර ලබා ගැනීමේ හැකියාව ය.

### 2. පරිසර අංශය

විද්‍යාව පොදුවේ ලෝකය මෙහෙයවයි. කෘෂිකාර්මික සමාජ, විශේෂයෙන් එම සමාජයේ පැවැත්ම සඳහා සංරක්ෂණය නැඹුරු, කුඩා පරිමාණ ගොවිතැන සහ නව්‍ය ජල කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම සඳහා එහි කෘෂිකාර්මික ආදර්ශය ඉක්මනින් නැවත සකස් කිරීමට කැමති ය. එබැවින් නැගී එන දේශගුණ විද්‍යාවට ප්‍රතිචාර දැක්වීම සඳහා දිගුකාලීන නියැලීමක් පිළිබඳ මෙම සිතුවිල්ල සමඟ පරිසර අංශය එහි අධිකාරිය වෙත ළඟා වේ.

### 3. ග්‍රාමීය සංවර්ධන අංශය

ග්‍රාමීය සවිබල ගැන්වීම සිදු විය යුත්තේ ඒකාබද්ධ ප්‍රවේශයන් සහ සාකල්‍ය ක්‍රියාවන් තුළින් වන අතර, ග්‍රාමීය සංවර්ධන අංශය දැනට පවතින ග්‍රාමීය තත්ත්වයන්ගේ ප්‍රතිඵල මෙන්ම එයට හේතු වූ පාදක වූ හේතු සහ සාධක යන දෙකම පිළිබඳව සිය විමසීම් යොමු කරයි. සමාජයේ සෑම ස්ථරයකට ම පහර දෙන සමාජ, ආර්ථික හා පාරිසරික ව්‍යසනවල බලපෑම තුළ මෙම ප්‍රවේශය ඊටත් වඩා වැදගත්කමක් ගෙන ඇති අතර ඉහත දක්වන ලද ව්‍යසනවල සෘණාත්මක බලපෑම් මුලින් ම දැනෙන්නේ ග්‍රාමීය අංශයට වන අතර එය දරිද්‍රතාවයටත් වඩා වැදගත් ප්‍රශ්නයකි.

### 4. අධ්‍යාපන සහ පුහුණු අංශය

ලෝකයේ අස්ථාවරත්වය කුමන මට්ටමක හෝ අනාවැකිමය සාර්ථකත්වයක් සහිතව කෙටි කාලීන සිදුවීම් සඳහා පවා වෙනත් කිසිවෙකු සූදානම් කළ නොහැකි බව අධ්‍යාපන හා පුහුණු අංශයේ පුහුණු කණ්ඩායම් අවබෝධ කර ගෙන සිටී. එබැවින්, කෘෂිකර්මාන්තයට අදාළ අධ්‍යාපන ක්ෂේත්‍රවල සම්භාව්‍ය වෙන්කිරීමේ දෘෂ්ටිකෝණයෙන් එය ක්‍රියාත්මක වන අතර, එහි ප්‍රවේශය තුළ එය සුවිශේෂී වේ. සෑම විටම අන්තර් විනය ක්ෂේත්‍රවල භාවිතා කළ හැකි මෙවලම් ලබා දීමට තෝරා ගැනීම සහ නිරීක්ෂණ කුසලතා පමණක් නොව තනි විෂයයන් බවට පත් කිරීම ද වැගත් වේ.

### 5. දත්ත කළමනාකරණ අංශය

දත්ත කළමනාකරණ අංශය විසින් බිම් මට්ටමේ සිට ඉහළට ප්‍රවාහය වන දත්ත ග්‍රහණය කර ගත හැකි මධ්‍යස්ථානයක් නිර්මාණය කිරීම මෙන් ම නිශ්චිත ප්‍රේක්ෂකයින් ඉලක්ක කර ගනිමින් තීරණාත්මක තත්‍ය කාලීන දත්ත සහ තොරතුරු ඒකාබද්ධ කිරීමට, විශ්ලේෂණය කිරීමට සහ ප්‍රසිද්ධ කිරීමට අන්තර් ක්‍රියාකාරී ප්‍රවාහ කළමනාකරණය සහ ප්‍රශස්ත කිරීමට කටයුතු කරයි. එබැවින් HARTI හි දත්ත කළමනාකරණ කණ්ඩායම් අමු දත්ත පිරිසිදු කිරීම, නැවත හැඩතල ගැන්වීම සහ ව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියට පමණක් නොව අත්පත් කර ගැනීමේ සංරචකයට ද සම්බන්ධ වන අතර, සාමාන්‍ය ජනතාව, පර්යේෂණ සහෝදරත්වය සහ ප්‍රතිපත්ති සම්පාදකයින් සඳහා ප්‍රමුඛ පෙළේ තොරතුරු බෙදා හැරීමේ පද්ධති නිර්මාණය කිරීම සඳහා පර්යේෂණ කණ්ඩායම් සහ අනෙකුත් අභ්‍යන්තර සහ බාහිර පාර්ශ්වකරුවන් සමඟ සෘජුවම ක්‍රියා කරයි.

### 6. තොරතුරු සහ සන්නිවේදන අංශය

තාක්‍ෂණික රැල්ලට හසු වූ විවිධ සන්නිවේදන උපකරණ සමඟ ලෝකය කුඩා වී ඇති බව HARTI හඳුනා ගෙන ඇති අතර බොහෝ විට තොරතුරු අනියම්, අධි බර සහ වැරදි සහගත බවින් පෙළෙන බව ද තේරුම් ගෙන ඇත. එබැවින්, තොරතුරු සහ සන්නිවේදන අංශය, එහි ප්‍රතිවිපාක අවබෝධ කරගනිමින්, ඉලක්කගත, පැහැදිලි, පහසුවෙන් ප්‍රවේශ විය හැකි සහ භාවිත කළ හැකි, නිශ්චිත පරිශීලක ඉලක්කවලට අනුව නිමැවුම් සැකසීමට සහ සැලකිය යුතු ලෙස ස්වයංක්‍රීය සන්නිවේදන මාර්ග ඔස්සේ පුළුල් පරාසයක සන්නිවේදන මාර්ග හරහා බෙදා හැරීමට එහි තොරතුරු සහ දත්ත අලෙවිකරණ පද්ධති ක්‍රමවේද ගොඩනගා ඇත. මෙම පද්ධති සහ ඒවා ගොඩනගා ඇති අලෙවිකරණ පදනම කාලයට ගැළපෙන තිරසාර පදනමකින් සකස් කර ඇති අතර ඒ සඳහා තොරතුරු අංශය සමඟ එක්ව ක්‍රියා කරයි.

## 2.2. පර්යේෂණ ප්‍රගතිය

වර්ෂ 2022 තුළ පහත සඳහන් සමාජ - ආර්ථික අධ්‍යයන සිදු කරන ලද අතර එහි ප්‍රකාශන ක්‍රියාවලිය 2023 වර්ෂයේ අවසන් කරන ලදී.

01. ශ්‍රී ලංකාවේ පලතුරු අපනයනයේ සංසන්දනාත්මක වාසිය. (Comparative Advantage of Fruit Exports in Sri Lanka)

02. ශ්‍රී ලංකාවේ තුළ රසායනික පොහොර සහ අනෙකුත් කෘෂි රසායන ආනයනය තහනම් කිරීම වී වගාවට සිදුකරන ලද කෙටි කාලීන බලපෑම් පිළිබඳ අධ්‍යයනය. (Import Ban of Fertilizers and Other Agrochemicals: Assessing short-term effects on the Paddy Sector).

03. ශ්‍රී ලංකාවේ තුළ රසායනික පොහොර සහ අනෙකුත් කෘෂි රසායන ආනයනය තහනම් කිරීම එළවළු වගාවට සිදුකරන ලද කෙටි කාලීන බලපෑම් පිළිබඳ අධ්‍යයනය. (Import Ban on Chemical Fertilizers and Other Agrochemicals: Short-term Impacts on Vegetables).

04. ශ්‍රී ලංකාව තුළ රසායනික පොහොර සහ අනෙකුත් කෘෂි රසායන ආනයනය තහනම් කිරීම තෝරාගත් වෙනත් ක්ෂේත්‍ර බෝග සහ අර්තාපල් වගාවට සිදුකරන ලද කෙටි කාලීන බලපෑම් පිළිබඳ අධ්‍යයනය. (Import Ban on Chemical Fertilizers and Other Agrochemicals: Short-term Impacts on Selected OFCs and Potato Crop).

05. ශ්‍රී ලංකාව තුළ රසායනික පොහොර සහ අනෙකුත් කෘෂි රසායන ආනයනය තහනම් කිරීම විසිතුරු පැළ සහ කැපුම් මල් වගා කරන ගොවි ප්‍රජාවන්ට ඇති කරන ලද කෙටි කාලීන බලපෑම් පිළිබඳ අධ්‍යයනය. (Import Ban on Chemical Fertilizers and Other Agro Chemicals: Effects on Floriculture).

06. ආහාර ද්‍රව්‍යවල මිල ඉහළ යාම ග්‍රාමීය, නාගරික සහ වතු අංශයේ ගෘහ ඒකකවල ආහාර සුරක්ෂිතතාව කෙරෙහි ඇති කරන බලපෑම. (Study on the Impact of the Current Economic Crisis on Household Food Security in Sri Lanka; Rural, Estate and Urban sectors).

07. ග්‍රාමීය සංවර්ධනය සඳහා තිරසාර ජීවනෝපාය මාර්ගයක් ලෙස ආදායම විවිධාංගීකරණය: ප්‍රශස්ත තත්ත්වයන් හඳුනාගැනීම. (Income Diversification as a Sustainable Livelihood Strategy for Rural Development: An Assessment of Optimal Conditions).

08. ශ්‍රී ලංකාවේ ප්‍රධාන පලතුරු වර්ග අපනයන විභවය පිළිබඳ අධ්‍යයනය. (Export Potential of Major Fruits in Sri Lanka).

09. දේශගුණික සුහුරු කෘෂිකාර්මික විසඳුම් ක්‍රියාවට නැංවීම: සාක්ෂි මත පදනම් වූ ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශයකි. (Putting Climate Smart Solutions into Action: A guide to evidence-based implementation).

පහත සඳහන් පර්යේෂණ අධ්‍යයන 2023 වර්ෂයේ සම්පූර්ණ කරන ලදී.

## 01. ශ්‍රී ලංකාවේ සැකසූ පලතුරු සහ එළවළු කර්මාන්තය: විභවයන්, බාධක සහ අපේක්ෂාවන්

**මූල්‍ය ප්‍රභවය:** භාණ්ඩාගාර අරමුදල්

**පර්යේෂණ කණ්ඩායම:**

| | |
|---|---|
| ඒ.කේ.ඒ. දිසානායක | - සම්බන්ධීකාරක |
| පී. විජේසිංහ | - සහය පර්යේෂක |
| එස්.පී. ප්‍රනාන්දු | - සහය පර්යේෂක |
| යූ.ඩී.ආර් උදාරි | - සහය පර්යේෂිකා |
| දිලිනි පෙරේරා | - සහය පර්යේෂිකා |

**පර්යේෂණයට අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක :** කුසගින්න නිමා කිරීම, ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය වැඩි දියුණු කිරීම සහ තිරසාර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම (SDG 2)

**පර්යේෂණ අරමුණ :**

ශ්‍රී ලංකාවේ පලතුරු හා එළවළු කර්මාන්තය නංවාලීම සඳහා ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග යෝජනා කිරීම සඳහා දේශීයව සැකසූ පලතුරු සහ එළවළු අංශය සඳහා පවතින වත්මන් තත්ත්වය, සැකසුම් විභවයන්, බාධාවන්, අලෙවිකරණ පද්ධතිය සහ පාරිභෝගික ඉල්ලුම විශ්ලේෂණය කිරීම.

**ප්‍රමුඛ සොයා ගැනීම්**

සමීක්ෂණය කරන ලද දිස්ත්‍රික්කවල සුපිරි වෙළඳසැල්වල සහ විශේෂ අලෙවිසැල්වල දේශීය වෙළඳ නාම 172ක් සහ සැකසූ පලතුරු සහ එළවළු නිෂ්පාදන කාණ්ඩයේ ආනයනික සන්නාම 110ක් පමණ දැකගත හැකිය. අන්නාසි (47%), අඹ (40%), කොස් (27%), පැපොල් (17%), දෙල් (13%), සහ දිවුල් (13%) පලතුරු හා එළවළු සැකසුම් කර්මාන්තයේ භාවිතා වන ප්‍රධාන බෝග වේ

සමීක්ෂණයට ලක් කරන ලද සැකසුම්කරුවන්ගෙන් බහුතරයක් (93%) දේශීය සහ අපනයන වෙළෙඳපොළ තුළ ඉහළ ඉල්ලුමක් ඇති නිෂ්පාදන කාණ්ඩවල තම නිෂ්පාදනය පුළුල් කිරීමට කැමැත්තෙන් සිටින බව ප්‍රතිඵලවලින් හෙළි විය. උදාහරණයක් ලෙස, ප්‍රතිචාර දැක්වූවන්ගෙන් බහුතරයක් පලතුරු බීම සහ ඖෂධීය පාන (53%) පසුව විජලනය කළ පලතුරු සහ එළවළු නිෂ්පාදන (40%) නිෂ්පාදනය පුළුල් කිරීමට කැමැත්ත දක්වති. නැවුම් අමුද්‍රව්‍ය ලබා ගැනීම, පාරිභෝගිකයින් අතර ඉහළ ඉල්ලුමක් සහ නිෂ්පාදනවලින් ලැබෙන ලාභය නුදුරු අනාගතයේ දී ඔවුන්ගේ නිෂ්පාදනය පුළුල් කිරීමේ අභිප්‍රාය සඳහා ප්‍රධාන උත්තේජනයන් වේ.

පවුලේ සාමාජිකයින්ගේ මනාපය (68%), පහසුව (48%) සහ රසය (43%) සැකසූ පලතුරු සහ එළවළු නිෂ්පාදන ගෘහස්ථ පරිභෝජනය සඳහා ප්‍රධාන හේතු වේ. සැකසූ පලතුරු සහ එළවළු නිෂ්පාදන වර්ග කිහිපයක් මිල දී ගැනීමෙන් කුටුම්භයන් වළක්වන ප්‍රධාන සාධක දෙක වන්නේ දියවැඩියාව (69%) සහ ඇතැම් එළවළු හා පලතුරු දියවැඩියාව වැනි සමහර රෝග සඳහා සුදුසු නොවන බවට විශ්වාස කිරීම සහ  කල් තබා ගන්නා ද්‍රව්‍ය, කෘත්‍රිම වර්ණ සහ රසකාරක එකතු කිරීම නිසා සෞඛ්‍ය ආරක්ෂාවක් නොමැති යැයි (67%) විශ්වාස කිරීම ය.

**ප්‍රධාන නිර්දේශ**

01. ගොවීන්ට සාධාරණ මිලක් සහතික කිරීම සහ දේශීය වෙළඳපොළට හෝ අපනයන ගමනාන්තවලට ගුණාත්මක නිෂ්පාදන සැපයීම සඳහා ගොවීන් සහ සැකසුම්කරුවන් අතර සමීප සම්බන්ධතාවයක් ඇති කිරීම.

02. පලතුරු සහ එළවළු ගොවීන්, එකතුකරන්නන් මෙන්ම සැකසුම්කරුවන්ගෙන් සමන්විත දත්ත ගබඩාවක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, අපනයන සංවර්ධන මණ්ඩලය, කාර්මික සංවර්ධන මණ්ඩලය සහ වාණිජ දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යාම.

03. සැකසූ පලතුරු හා එළවළු කර්මාන්තයේ දී ප්‍රමිතිය ඉතා වැදගත් සාධකයකි. මෙම නිෂ්පාදන ප්‍රමිති ගත කිරීම සඳහා නිශ්චිත ක්‍රමවේදයක් සකස් කිරීම වැදගත් වේ. ඒ සඳහා ආරම්භක දැනුවත් කිරීමේ වැඩසටහන්, පුහුණු හා අධීක්ෂණ වැඩසටහන් රජයේ මැදිහත්වීම යටතේ ක්‍රියාත්මක කළ යුතුය.

04. ලෝකයේ අගය එකතු කළ පලතුරු සහ එළවළු නිෂ්පාදන සඳහා වැඩි ඉල්ලුමක් පවතින බැවින් සැකසූ පලතුරු සහ එළවළු නිෂ්පාදන අපනයනය කිරීමට නිෂ්පාදකයන් පෙළඹවිය යුතුය.

05. එළවළු හා පලතුරු සකස් කිරීමේ කර්මාන්තයට යොමු වීමට කැමති ව්‍යවසායකයෙකුට නිවැරදි අමුද්‍රව්‍ය තෝරා ගැනීමේ සිට නිශ්චිත වෙළෙඳපොළ හඳුනා ගැනීම දක්වා නිවැරදිව යොමු කිරීම සඳහා සැකසුම් ක්ෂේත්‍රය සම්බන්ධ ආයතන සියල්ල එක්ව විධිමත් යාන්ත්‍රණයක් ගොඩනැඟීම.

## 02. ශ්‍රී ලංකාවේ දේශීය කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ නියැළි ගොවීන්ගේ මූල්‍ය සාක්ෂරතාවය පිළිබඳ අධ්‍යයනය

**මූල්‍ය ප්‍රභවය:** රජයේ ඒකාබද්ධ අරමුදල

**පර්යේෂණ කණ්ඩායම:**

පී.සී.ජේ. සිල්වා
එන්.පී.ජී.සමන්ත
සාගරිකා හිටිහාමු
එම්.ඩී.එස්. ලූර්දු

**පර්යේෂණ අරමුණ:**

දේශීය කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ නියැළි ගොවීන්ගේ මූල්‍ය සාක්ෂරතාවය තක්සේරු කිරීම.




**පර්යේෂණයට අදාළ තිරසර සංවර්ධන ඉලක්කය:** තිරසර ඉලක්ක අංක 1, දුප්පත්කම තුරන් කිරීම

**ප්‍රමුඛ සොයා ගැනීම්:**

01. ශ්‍රී ලංකාවේ දේශීය කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ නියැළි ගොවීන්ගේ මූල්‍ය සාක්ෂරතාවය 52%කි.

02. මූල්‍ය සාක්ෂරතාවය සහ ගෘහ ඒකකයේ ආදායම අතර සංඛ්‍යාමය වශයෙන් පිළිගත හැකි ධනාත්මක සම්බන්ධතාවයක් පවතී.

03. මූල්‍ය සාක්ෂරතා මට්ටම තීරණය වීම කෙරෙහි අධ්‍යාපනය සහ ආදායම ධනාත්මක බලපෑමක් සිදුකරයි.

04. මූල්‍ය සාක්ෂරතා මට්ටම තීරණය වීම කෙරෙහි ස්ත්‍රීපුරුෂභාවය බල නොපායි.

**ප්‍රධාන නිර්දේශ**

01. අධ්‍යාපන මට්ටම සහ මූල්‍ය සාක්ෂරතාවය අතර ධනාත්මක සම්බන්ධතාවයක් පවතින හෙයින් මෙරට කෘෂිකාර්මික ප්‍රජාවගේ අධ්‍යාපන මට්ටම වර්ධනය සහ පාසල් අධ්‍යාපනය තුළින් මූල්‍ය සාක්ෂරතාවය වර්ධනයට කටයුතු කිරීම.

02. පුද්ගල ආදායම ද මූල්‍ය සාක්ෂරතාවය කෙරෙහි ධනාත්මක සම්බන්ධතාවයක් දක්වන බව අධ්‍යයනයේ දී සනාථ වූ අතර ඒ අනුව කෘෂිකාර්මික ජනතාවගේ ආදායම් මාර්ග වර්ධනය සඳහා සහ නිෂ්පාදන වියදම් අවම කිරීම සඳහා කටයුතු කළ යුතුය. මේ සඳහා නව ආයොජන සහ ව්‍යවසාය අවස්ථා හඳුන්වාදීම, නව තාක්ෂණ ක්‍රමවේද භාවිතය හඳුන්වා දී, නව තාක්ෂණය සඳහා යොමුවීම සඳහා ඇති බාධක ඉවත් කිරීම, ආයෝජන සහ ආර්ථික ක්‍රියාකාරකම් සිදුවන ස්ථායි ආර්ථික තත්ත්වයක් පවත්වා ගැනීමට පසුබිම නිර්මාණය කිරීම.

03. ගොවි සංවිධාන ශක්තිමත් කිරීම හරහා ගොවිජනතාවට ණය, යෙදවුම්, වෙළෙඳපොළ සහ උපදේශන ආදී ක්ෂේත්‍රවල ගැටලු නිරාකරණය සහ ගොවි සංවිධාන ව්‍යාපාරික අයතන ලෙස ගොඩනංවා ගොවි ජනතාවට ඒ තුළ ආයෝජනයෙන් ලාභ ලැබීමේ අවස්ථා ඇති කිරීම.

## 03. පලතුරු සහ එළවළු නිෂ්පාදන හා අලෙව ක්ෂේත්‍රයට ආර්ථික අර්බුදයේ බලපෑම් ඇගයීම.

**මූල්‍ය ප්‍රභවය :** රජයේ ඒකාබද්ධ අරමුදල

**පර්යේෂණ කණ්ඩායම :**

| | | |
|---|---|---|
| පී.ඒ.ජේ. චම්පිකා | - | සම්බන්ධීකරණ නිලධාරිනි |
| අයි.පී.පී.එම් .විජේසිංහ | - | සම පර්යේෂක |
| එන්.පී.ජී සමන්ත | - | සම පර්යේෂක |
| ආර්.එම්.එම්.එච්.කේ. රඹුක්වැල්ල | - | සම පර්යේෂක |
| එස්.පී. ප්‍රනාන්දු | - | සම පර්යේෂක |

**තිරසාර සංවර්ධන ඉලක්ක:** කුසගින්න නිමා කිරීම, ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය වැඩිදියුණු කිරීම සහ තිරසාර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම (SDG 2)

**ප්‍රධාන සොයා ගැනීම් :**

1. බෝංචි, බටු, කෙසෙල් (එම්බුල්), කෙසෙල් (කෝලිකුට්ටු) සහ ගස්ලබු ඇතුළුව සලකා බලනු ලබන සියලුම බෝග, බෝංචි 30%ක්, වම්බටු 25%ක්, කෙසෙල් (ඇඹුල්) 45%ක්, කෙසෙල් (කෝලිකුට්ටු) 60%ක් සහ ගස්ලබු 20%ක් වශයෙන් වගා කරන ලද අක්කර ප්‍රමාණයේ සැලකිය යුතු අඩුවීමක් දක්නට ලැබිණි. කෙසේ වෙතත් වගාව සම්පූර්ණයෙන් අත් හරින ලද ගොවීන්ගේ ප්‍රතිශතය 5%කට වඩා අඩු විය.

2. මෙම අඩුවීම හේතු සාධක කිහිපයක එකතුවක් නිසා ඇති වී තිබේ: නිෂ්පාදන පිරිවැය තුන් ගුණයකින් වැඩි වීම, රෝපණ ද්‍රව්‍ය හිඟය, යෙදවුම්වල අඩු ගුණාත්මක බව, ඉල්ලුම අඩුවීම, විකුණුම් පරිමාව අඩුවීම සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් ලාභය අඩු වීම.

3. වගා බිම් ප්‍රමාණය අඩුවීමත් සමඟ සියලුම බෝගවල කුලී ශ්‍රමයේ සිට පවුලේ ශ්‍රමය දක්වා මාරුවීමක් සිදු විය. GAP - බෝංචි වගාව අඩුම ප්‍රතිශතයක් වාර්තා කළ අතර සලකා බලන බෝගවල මුළු පිරිවැයෙන් 10% - 77%ක් ශ්‍රමය සමන්විත වේ. කෙසේ වෙතත්, අර්බුදයට පෙර මහා පරිමාණ ගොවියෙකු වූ (අක්කර 05ට වැඩි) කෙසෙල් ගොවීන්ගෙන් 42%ක් සිටි අතර කුලී වැඩ මත දැඩි ලෙස විශ්වාසය තැබූ කෙසෙල් ගොවීන් කුඩා පරිමාණ ගොවියෙකු බවට පරිවර්තනය වී ඇති අතර කුලී ශ්‍රමය (60%) පවුලට සැලකිය යුතු ලෙස ආදේශ කිරීම දැකගත හැකි විය.

4. ප්‍රමාණයෙන් (10-45% කින්) සහ වාර ගණන අනුව පොහොර යෙදීම අඩුවී ම සියලුම බෝගවල නිරීක්ෂණය විය. ආනයනික බීජ සහ කෘෂි රසායනවල මිල තුන් ගුණයකින් ඉහළ යාම සියලු බෝග සඳහා අභියෝගාත්මක ගැටලුවක් විය.

5. කෙසේ වෙතත්, සාම්ප්‍රදායික වගාකරුවන් හා සසඳන විට GAP ගොවීන් කෘෂි රසායන යෙදීම් මට්ටම අඩු කර තිබේ. බෝංචි සම්බන්ධයෙන් ගත් කල, කෘෂි රසායන සහ අකාබනික පොහොර සඳහා වන වියදම GAP වගාවේ දී සම්ප්‍රදායික වගාවට වඩා 20% කින් පමණ අඩුය.

6. බදුල්ල දිස්ත්‍රික්කයේ බෝංචි නිෂ්පාදන වියදම සාම්ප්‍රදායික ක්‍රමය යටතේ 2023 අවසාන කාර්තුව වන විට කිලෝවකට රුපියල් 73.70ක් විය. මෙම අගය පෙන්නුම් කරන්නේ 2019 බදුල්ලේ වාර්තාගත අගයට සාපේක්ෂව කිලෝවකට රුපියල් 7.85ක වැඩි වීමකි. අනුරාධපුර දිස්ත්‍රික්කයේ බටු කිලෝග්‍රෑම් එකක් නිෂ්පාදනය කිරීම සඳහා වැය වන මුදල රුපියල් 82.55ක් වන අතර මෙම අගය 2019/යල කන්නයේ වාර්තා වූ කිලෝවකට රුපියල් 20.62ක් වූ අගයට වඩා හතර ගුණයකින් වැඩිය,

7. සලකා බැලූ එළවළු සහ පලතුරු සඳහා ප්‍රධාන අලෙවිකරණ මාර්ග නො වෙනස්ව පවතී. පෙර පැවති අර්බුදකාරී තත්ත්වයට සමානව, සමස්ත එළවළු නිෂ්පාදනයෙන් 75%ක් පමණ විශේෂ ආර්ථික මධ්‍යස්ථාන හරහා අලෙවි කිරීම සිදුවේ.

8. එහෙත්, කෙසෙල් සඳහා වාර්තා වී ඇති ඉහළම පහත වැටීමත් සමඟ එක් එක් අලෙවිකරණ නාලිකාවට සම්බන්ධ විකුණුම් පරිමාව සහ ප්‍රවාහනය කරන්නන් සහ විකුණුම්කරුවන් සංඛ්‍යාව 15-40% පරාසයකින් පහත වැටී ඇත.

9. අර්බුදයට පෙර (BC) සහ පසු (AC) වෙළඳපළ ආන්තිකය තක්සේරු කිරීමෙන් පෙන්නුම් කළේ, කෙසෙල් හැර ගොවීන් 4.4% සිට 10% දක්වා ආන්තිකය වැඩි වී ඇති බවයි. අනෙක් අතට, පැපොල් හැර, තොග වෙළෙන්දන්ගේ ආන්තිකය 2.7% සහ 29.4% අතර ඉහළ ගිය අතර සිල්ලර වෙළෙන්දෝ 2.5% සිට 19.5% දක්වා ආන්තික අඩුවීමක් දක්නට ලැබුණි. අලෙවිකරණ නාලිකාව රැඩිකල් වෙනස්කම්වලට භාජනය නොවන්නේ නම්, සිල්ලර මිල ඉහළ යාමත් සමඟ ගොවීන්ගේ ආන්තිකය වැඩි වීම සාමාන්‍ය දෙයකි.

**ප්‍රධාන නිර්දේශ:**

1. ආනයනික බීජ, පොහොර සහ කෘෂි රසායන වෙළඳපොළේ මිල හා ගුණාත්මක බව නියාමනය කිරීමට අදාළ බලධාරීන්ගේ කඩිනම් මැදිහත්වීමක් අවශ්‍ය වේ.

2. නීති විරෝධී හෝ අනවසර කෘෂි රසායන වෙළෙඳපොළෙන් ඉවත් කිරීමට වහා පියවර ගත යුතුය.

3. ගොවීන් අතර GAP පුළුල් ලෙස භාවිතා කිරීම දිරිමත් කිරීම තුළින් නිෂ්පාදන පිරිවැය අඩු වීම (කෘෂි රසායන ද්‍රව්‍යවල පිරිවැය සැලකිය යුතු ලෙස අඩු වේ) සහ ඵලදායිතාව වැඩි කිරීමෙන් ඔවුන් සවිබල ගැන්වීමට හැකි වන අතර එමගින් ඉහළ යන යෙදවුම් පිරිවැයේ ඍණාත්මක බලපෑම් වලට ප්‍රතිරෝධය දැක්වීමට උපකාරී වේ.

4. රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් ආනයනික යෙදවුම්වල මිල ඉහළ යාමේ අවාසි අවම කිරීම සඳහා පලතුරු අගය එකතු කළ නිෂ්පාදන අපනයනය ප්‍රවර්ධනය කිරීම ශක්‍ය විසඳුමකි. භාණ්ඩ අපනයනකරුවන් සඳහා දැනුම කේන්ද්‍රස්ථානයක් ස්ථාපිත කිරීම, තීරණාත්මක තොරතුරු ඉදිරිපත් කිරීම සහ කර්මාන්තයට අලුතින් පැමිණෙන නවකයින් සමඟ ප්‍රායෝගික අත්දැකීම් බෙදාගැනීම සඳහා වේදිකාවක් කාලීන අවශ්‍යතාවයකි.

5. අපනයන අපේක්ෂාවන් හඳුනා ගැනීම, දේශීය ව්‍යවසායකයින් දිරිමත් කිරීම, වත්මන් කර්මාන්ත සඳහා ඇති ඉල්ලුම ඉහළ නැංවීම සඳහා ජාත්‍යන්තර ගැනුම්කරුවන් සමඟ දිගුකාලීන ගිවිසුම් ඇති කර ගැනීමේ අවස්ථා වර්ධනය කිරීම සහ ඉහළ විදුලි පිරිවැයට විසඳුම් සෙවීම සඳහා තිරසාර, ලාභදායී ක්‍රමවේද ක්‍රියාවට නැංවීම ඉතා වැදගත් බව පෙනේ.

6. බෝංචි වගා කරන ගොවීන් සඳහා අඩු වියදම්, කල් පවතින සහ ආධාරක ඉණි හඳුන්වා දීම බෝංචි වල නිෂ්පාදන පිරිවැය අඩු කිරීම සඳහා කාලෝචිත මැදිහත්වීමකි.

## 04. ශ්‍රී ලංකාවේ කුකුළු ආහාර නිෂ්පාදනය: ආර්ථික අර්බුදයේ බලපෑම, ප්‍රතිචාරය සහ ඉදිරි ගමන

මූල්‍ය ප්‍රභවය : භාණ්ඩාගාර අරමුදල

පර්යේෂණ කණ්ඩායම :

රුවිනි විදානපතිරණ
රෝෂිණි රඹුක්වැල්ල
රවීනා උදාරි
දිලිනි පෙරේරා
සංගීත් ප්‍රනාන්දු

පර්යේෂණ අරමුණු :

කුකුළු ආහාර නිෂ්පාදන අංශය ශක්තිමත් කිරීම සඳහා ප්‍රතිපත්තිමය ඇඟවුම් යෝජනා කිරීම සඳහා ආර්ථික පසුබෑමේ දී කුකුළු ආහාර නිෂ්පාදකයින් විසින් අනුගමනය කරන ලද තත්ත්වය, බලපෑම් සහ අර්බුද කළමනාකරණ උපාය මාර්ග පරීක්ෂා කිරීම.




**තිරසර සංවර්ධන ඉලක්ක** : කුසගින්න නිමා කිරීම, ආහාර සුරක්ෂිතතාව ළඟා කර ගැනීම සහ වැඩිදියුණු කළ පෝෂණය, තිරසර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම

**ප්‍රධාන සොයා ගැනීම් :**

1. වත්මන් ආර්ථික අර්බුදය වාණිජ ආහාර නිෂ්පාදකයින්ගේ (93%) සහ ස්වයං-මිශ්‍ර (Self-mixed) නිෂ්පාදකයින්ගේ (97%) කර්මාන්ත ක්‍රියාකාරිත්වයට බලපා ඇත. බොහෝ කුකුළු ආහාර නිෂ්පාදකයින් තම සමාගමේ අවශ්‍යතා (මස් සහ බිත්තර නිෂ්පාදනය) සඳහා වන ඉල්ලුම සපුරාලීම සඳහා තමන්ගේ ම ආහාර මිශ්‍ර කිරීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමට තීරණය කළ බැවින් සංයෝග ආහාර වෙළඳපොළේ අඩුවීමක් නිරීක්ෂණය විය. ඒ අනුව වාණිජ මට්ටමේ ආහාර නිෂ්පාදනය සියයට 25-50 කින් අඩු වී තිබේ.

2. අමුද්‍රව්‍යවල ඉහළ මිල සහ හිඟය, විදේශ විනිමය අර්බුදය, බදු ප්‍රතිපත්තිය, අමුද්‍රව්‍යවල දුර්වල තත්ත්වය ආහාර කර්මාන්තය මුහුණ දෙන ප්‍රධාන ගැටලු වේ. කුකුළු ආහාරවල සියලු ම ප්‍රධාන අමුද්‍රව්‍යවල මිල සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති අතර (ඉරිඟු සඳහා 300%) සහ කුකුළු ආහාර මිල 2019 ට සාපේක්ෂව සියයට 180-200 කින් ඉහළ ගොස් ඇත.

3. වාණිජ ආහාර නිෂ්පාදකයින්ගෙන් බහුතරයක් (80%) සහ ස්වයං-මිශ්‍ර නිෂ්පාදකයින් (67%) විකල්ප අමුද්‍රව්‍ය භාවිතයෙන් ඔවුන්ගේ කුකුළු ආහාර සංගුව වෙනස් කළහ. ඔවුන් ඒහිදී බොහෝ විට වැදගත් මූලද්‍රව්‍යවල අනුපාතය වෙනස් කළහ.

4. දැනට සියලුම වාණිජ කුකුළු ආහාර නිෂ්පාදන කර්මාන්තශාලා ඔවුන්ගේ ස්ථාපිත ධාරිතාවට වඩා අඩු මට්ටමකින් ක්‍රියාත්මක වීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ, නිෂ්පාදනයට ඇති අඩු ඉල්ලුම නිසා, එකතු කළ අගය මත බදු ගාස්තු, අමුද්‍රව්‍ය හිඟය සහ විදුලි සැපයුමේ නොගැළපීම හේතුවෙන් කර්මාන්තශාලා මිශ්‍ර සංයෝග ආහාරවල මිල ඉහළ යාම වැනි හේතු ය.

**ප්‍රධාන නිර්දේශ :**

1. පශු සම්පත් නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා, ආහාර සැපයුම වැඩි කිරීම, සලාක සූත්‍රගත කිරීම් වැඩිදියුණු කිරීම සහ දේශීයව පවතින ආහාර සම්පත් ප්‍රයෝජනය මත පදනම්ව පෝෂණ උපාය මාර්ග සංවර්ධනය කිරීම සඳහා නිසි මැදිහත්වීම් අවශ්‍ය වේ. ඒමෙන්ම රටේ විවිධ කෘෂි පාදක කර්මාන්තවලින් අතුරු නිෂ්පාදන ලෙස නිපදවන ඌන උපයෝගිතා විකල්ප (සාම්ප්‍රදායික නොවන) ආහාර සම්පත් අලෙවි කිරීම පිළිබඳව ද සලකා බැලිය හැකිය.

2. ණය සහ ඉඩම් වැනි දිරිගැන්වීම් ලබා දීමෙන් බඩඉරිඟු සහ සෝයා බෝංචි වැනි අමුද්‍රව්‍ය තමන් විසින් ම නිෂ්පාදනය කිරීමට ආහාර නිෂ්පාදකයින් දිරිමත් කිරීම සහ සහාය දීම.

3. විභවතාවක් සහිත ආහාර නිෂ්පාදන ආයතන සහ කුකුළු ගොවීන් සඳහා බඩඉරිඟු සඳහා සුරක්ෂිත සැපයුමක් සැපයිය යුතුය. මුළු අවශ්‍යතාවය දේශීයව නිෂ්පාදනය කළ නොහැකි බව මෙහිදී අනාවරණය වී ඇති බැවින් ආහාර මෝල් හිමියන්ට බඩඉරිඟු ආනයනය කිරීමට ඉඩ ලබාදීමට ප්‍රතිපත්තිමය තීරණ ගත යුතුව ඇත.

## 05. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ කිරි නිෂ්පාදනයේ තාක්ෂණික කාර්යක්ෂමතාවයට බලපාන සාධක

**මූල්‍ය ප්‍රභවය :** ඒකාබද්ධ අරමුදල

**පර්යේෂණ කණ්ඩායම :**

එච්.එම්.එස්.ජේ.එම් හිටිහාමු
ජී.වී.එන් අයෝමි
ජේ.ඒ.යූ.පී ජයසිංහ

**පර්යේෂණ අරමුණ :**

ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ කිරි නිෂ්පාදනයේ තාක්ෂණික කාර්යක්ෂමතාව සඳහා බලපාන සාධක තේරුම් ගැනීම

**විශේෂිත අරමුණු :**

1. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ කිරි නිෂ්පාදන හේතු වූ සාධක තීරණය කිරීම.
2. කිරි ගොවීන්ගේ තාක්ෂණික අනුවර්තනය වීමේ මට්ටම අධ්‍යයනය කිරීම.
3. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ප්‍රදේශවල කිරි නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සඳහා ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සැපයීම.

**පර්යේෂණයට අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක :** කුසගින්න නිමා කිරීම, ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය වැඩිදියුණු කිරීම සහ තිරසාර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම (SDG 2)




**ප්‍රධාන සොයා ගැනීම් :**

1. අධ්‍යයන නියැදියට අනුව වියළි කලාපීය කිරි ගොවිපොළවලින් 0.5%ක් මහා පරිමාණ කිරි ගොවිපොළ වන අතර 46.3%ක් මධ්‍ය පරිමාණ ගොවිපළවල් සහ 53.2%ක් කුඩා පරිමාණ ගොවිපළවල් වේ.

2. වියළි කලාපයේ කිරි නිෂ්පාදනය සඳහා සැලකිය යුතු ලෙස දායක වූ ගොවිපොළ සාධක අතර අභිජනන වර්ගය, සාන්ද්‍ර ආහාර ප්‍රමාණයේ කිරි දෙන එළදෙනුන් සංඛ්‍යාව, ඇති දැඩි කිරීමේ ක්‍රමය, අභිජනන වර්ගය සහ කිරි දෙන සතුන්ගේ වාර ගණන ඇතුළත් වේ. කිරි නිෂ්පාදනය කෙරෙහි ගොවියාගේ සාධක ලෙස සැලකිය යුතු ලෙස බලපානු ලබන්නේ පුහුණුව, අධ්‍යාපනය සහ කුසලතා ය.

3. කිරි දෙන එළදෙනුන් සංඛ්‍යාව සහ ගන්නා ආහාර ප්‍රමාණය කිරි නිෂ්පාදනයේදී සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරයි. සෑම අතිරේක ගවයෙකු සඳහා ම කිරි නිෂ්පාදනය ලීටර් 0.49කින් වැඩි වේ. මෙයින් අදහස් කරන්නේ සාමාන්‍යයෙන් එක් අමතර එළදෙනක් මුළු කිරි නිෂ්පාදනයට අමතර කිරි ලීටර් 0.49ක් පමණ දායක වන බවයි. එක් එක් අතිරේක ආහාර කිලෝග්‍රෑමයක් සඳහා (ආහාර ප්‍රමාණයේ ඒකක වැඩිවීමක්), සම්පූර්ණ කිරි නිෂ්පාදනයේ ලීටර් 0.72කින් වැඩි වීමක් දක්නට ලැබේ. මෙයින් ගම්‍ය

වන්නේ එළදෙනුන්ට යම් ප්‍රමාණයකට සුදුසු ආහාර ප්‍රමාණයක් ලබා දීමෙන් කිරි නිෂ්පාදනය ඉහළ යන බවයි.

4. නියැදියට අනුව වියළි කලාපයේ කිරි ගොවිතැනෙහි තාක්ෂණික කාර්යක්ෂමතාව 0.61ක් වන අතර එයින් ගම්‍ය වන්නේ ලබා දී ඇති යෙදවුම් නිසි ලෙස භාවිතා කරමින් පවතින සම්පත් තුළ කිරි නිෂ්පාදනය 39%කින් වැඩි කළ හැකි බවයි. කුරුණෑගල, හම්බන්තොට, අනුරාධපුර සහ යාපනය වැනි වියළි කලාපීය අධ්‍යයන ක්ෂේත්‍රවල තාක්ෂණික කාර්යක්ෂමතාව පිළිවෙළින් 65%, 55%, 64% සහ 59% ලෙස පෙන්නුම් කරයි. බොහෝ ගොවීන් පුළුල් කිරි ගොවිතැනක් සිදු කරන බැවින් හම්බන්තොට දිස්ත්‍රික්කය අඩු ම තාක්ෂණික කාර්යක්ෂමතාවයක් පෙන්නුම් කරයි.

5. අත්‍යවශ්‍ය කිරි තාක්ෂණයන් බොහොමයක් ගොවීන් විසින් අනුවර්තනය කර ගෙන ඇති නමුත්, කිරි ගොවීන්ගෙන් 50%ක් පමණ කිරි දෙන සතුන් සඳහා නිවැරදි ආහාර ප්‍රමාණයට සහ පැය 24ම ජලය සැපයීමට අනුවර්තනය වී නොමැති බව සටහන් වේ.

**ප්‍රධාන නිර්දේශ :**

1. පවතින සම්පත් තුළින් කිරි නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සඳහා කිරි ගොවීන් නිවැරදි සාන්ද්‍ර ආහාර ප්‍රමාණය පිළිබඳ දැනුවත් කිරීම වැදගත් වේ. තව ද, රංචුවේ සිටින කිරි ගවයින් සංඛ්‍යාව සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරයි. එබැවින් කිරි ගොවීන්ට වසරේ ඕනෑම වේලාවක කිරි දෙන එළදෙනුන් සිවු දෙනකුට වඩා ඇති කර ගැනීමට පහසුකම් සැලසීම පිණිස දැනුම හා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම ඉතා වැදගත් වේ.
2. කිරි නිෂ්පාදන කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා වියළි කලාපීය කිරි ගොවීන් දැනුවත් කිරීම සහ සුදුසු අභිජනන වර්ගය, සාන්ද්‍ර ආහාර ප්‍රමාණයේ කිරි දෙන එළදෙනුන් සංඛ්‍යාව, ඇති දැඩි කිරීමේ ක්‍රමය සහ සතුන් කිරි දෙන වාර ගණන පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම සඳහා පුහුණු කිරීම් වැඩි කළ යුතුය.

## 06. ශ්‍රී ලංකාවේ විසිතුරු මල් කර්මාන්තයේ සංවර්ධනය සඳහා ඇති විභවයන් හා සීමාවන් : විසිතුරු මල් කර්මාන්තය පිළිබඳ විස්තීර්ණ විශ්ලේෂණය

**මූල්‍ය මූලශ්‍රය : ඒකාබද්ධ අරමුදල**

**පර්යේෂණ කණ්ඩායම :**

උත්පලා ජයසිංහ
නොරිකා අයෝමි
සාගරිකා හිටිහාමු

අධ්‍යයනයට අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක : දිළිඳුකම තුරන් කිරීම (අංක 01) / තිරසාර ආර්ථික වර්ධනය, පූර්ණ හා ඵලදායී රැකියා සහ සියලු දෙනාටම යහපත් රැකියාවක් ප්‍රවර්ධනය කිරීම අංක 8).




**පර්යේෂණ අරමුණු :**

01. දේශීය සහ අපනයන වෙළෙඳපොළ යන දෙකටම අදාළ ව ශ්‍රී ලංකාවේ මල් වගා අංශය පුළුල් කිරීමට ඇති විභවයන් සහ බාධාවන් හඳුනා ගැනීම
02. ශ්‍රී ලංකාවේ අපනයන ඉලක්ක කරගත් මල් වගා කර්මාන්තය ඉහළ නැංවීම හා සම්බන්ධ විභවයන් සහ බාධාවන් හඳුනා ගැනීම.
03. ශ්‍රී ලංකාවේ ගෘහස්ථ මල් වගා කර්මාන්තය ඉහළ නැංවීම හා සම්බන්ධ විභවයන් සහ සීමාවන් හඳුනා ගැනීම.
04. ශ්‍රී ලංකාවේ දේශීය හා අපනයනය ඉලක්ක කරගත් මල් වගා කර්මාන්තය ඉහළ නැංවීම සඳහා පුළුල් ව්‍යාපාරික ආකෘතියක් සංවර්ධනය කිරීම.

**ප්‍රධාන සොයාගැනීම් :**

1. දේශීය වෙළඳපළ ඉලක්ක කරගත් මල් වගා අංශය හා සම්බන්ධ ප්‍රධාන බාධක.
    a. අධික නිෂ්පාදන පිරිවැය (පොහොර, පළිබෝධනාශක, ඉන්ධන සහ ප්‍රවාහන පිරිවැය, මව් ශාක).
    b. මල් වගාව සම්බන්ධ නිෂ්පාදන සඳහා දේශීය ඉල්ලුම අඩු වීම.
    c. උසස් තත්ත්වයේ රෝපණ ද්‍රව්‍ය සහ මව් ශාක නොමැතිකම.
    d. නව වගා ක්‍රම පිළිබඳ තාක්ෂණික දැනුම නොමැතිකම.
2. විදේශ වෙළඳපළ ඉලක්ක කරගත් මල් වගා අංශය හා සම්බන්ධ ප්‍රධාන බාධක
    a. අධික නිෂ්පාදන පිරිවැය (පොහොර, පළිබෝධනාශක, ඉන්ධන සහ ප්‍රවාහන පිරිවැය, මව් ශාක).
    b. සැපයුම්දාම කළමනාකරණයේ ගැටලු.
    c. ආයතනික ගැටලු සහ රජයේ සහයෝගය නොමැතිකම
    d. මල් වගාව ආශ්‍රිත පර්යේෂණ හා සංවර්ධන ගැටලු

**ප්‍රධාන නිර්දේශ :**

1. මල් වගා අංශයේ සංවර්ධනය පිළිබඳ සලකා බැලීමේ දී දේශීය හා විදේශීය වෙළෙඳපොළ යන වෙළෙඳපොළ වර්ග දෙකකට අදාළ ගැටලු විසඳීම ඊට ඇතුළත් වේ. මුලින්ම අවධානය යොමු කළ යුත්තේ දේශීය වෙළෙඳපොළ වෙත ය. දේශීය වෙළෙඳපොළ ඉල්ලුමෙන් ස්වයංපෝෂිත වීම සහ දේශීය වෙළෙඳපොළ ඉලක්ක කරගත් නිෂ්පාදකයින්ගේ ව්‍යාපාර වැඩිදියුණු කිරීම පළමු ප්‍රමුඛතාවයයි. මෙම ක්‍රියාවලිය සඳහා නිර්දේශ කිහිපයක් ඇතුළත් වේ.

    a) මල් වගාකරුවන්ගේ ඉල්ලුම සපුරාලීම සඳහා නව ප්‍රභේද, ගුණාත්මක පටක රෝපණ පැළ, පුහුණු හා තාක්ෂණ හුවමාරුව සහ හොඳ තත්ත්වයේ මව් පැළ නිෂ්පාදනය කිරීම සඳහා දේශීය පර්යේෂණ හා සංවර්ධනය ශක්තිමත් කිරීම.

    b) මල් වගා අංශය සුපරීක්ෂණය සඳහා මෙන් ම පාර්ශ්වකරුවන්ගේ ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීමට වෙනම නියාමන ආයතනයක් පිහිටුවීම.

    c) වගාකරුවන්ට අත්‍යාවශ්‍ය යෙදවුම් ද්‍රව්‍ය අඩු මිලට (පොහොර, හරිතාගාර සඳහා අමුද්‍රව්‍ය) ලබාදීම සඳහා සහනාධාර ක්‍රමයක් හඳුන්වාදීම.

    d) සෑම පළාතකට ම/ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශයකට ම මල් වගා නිෂ්පාදන අලෙවි කිරීම සඳහා ආර්ථික මධ්‍යස්ථානවලට සමානව විශේෂ ස්ථානයක් පහසු පිරිවැයක් යටතේ ලබාදීමට නිර්දේශ කරනු ලබන අතර එමඟින් වගාකරුවන්ට වැඩි පාරිභෝගිකයින් ආකර්ෂණය කර ගැනීමට සහ කරදරයකින් තොරව තම නිෂ්පාදන අලෙවි කිරීමට හැකි වේ.

2. අපනයනය ඉලක්ක කරගත් මල් වගා අංශය දියුණු කිරීම සඳහා වන නිර්දේශ කිහිපයකි.

    a) වෙළෙඳපොළ ඉලක්ක කරගත් නව ප්‍රභේද සංවර්ධනය කෙරෙන මල් වගා අංශයේ පර්යේෂණ හා සංවර්ධනය ශක්තිමත් කිරීම.

    b) අපනයනයට හිතකර වන පරිදි මල් අපනයනයට අදාළ ආයතනික ගැටලු නිරාකරණය කිරීම.

    c) රජයට මැදිහත්විය හැකි ක්‍රියාකාරකම් සමඟ නිෂ්පාදනයේ ගුණාත්මකභාවය පවත්වා ගැනීම සඳහා ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීම. (උදා: දුම්රියේ ශීත කාමර පහසුකම්).

    d) මල් අපනයනය සඳහා ගුවන් තොටුපළ පහසුකම් වැඩිදියුණු කිරීම.

    e) අපනයනය ඉලක්ක කරගත් නිෂ්පාදනය සඳහා තීරණාත්මක සාධකයක් වන සමාන ගුණාත්මක භාවයක් පවත්වා ගනිමින් මහා පරිමාණයෙන් වගා කිරීමට ඉඩ සලසන ගොවි සමාගම් පිහිටුවීම සහ බද්දු ගිවිසුම් මත වගා කළ හැකි ඉඩම් ලබා දීම.

## 07.අනාගත මැදිහත්වීම් සඳහා අවබෝධයක් ලබා ගැනීමට ශ්‍රී ලංකාවේ දේශගුණ සුහුරු කෘෂිකාර්මික මැදිහත්වීම්හි සාර්ථකත්වයන් සහ අභියෝග අධ්‍යයනය කිරීම

**මූල්‍ය ප්‍රභවය :** ඒකාබද්ධ අරමුදල

**පර්යේෂණ කණ්ඩායම :**

ටී.පී මුණවීරගේ - සම්බන්ධීකරණ නිලධාරි
ආර්.එම්.ඩී.එච් රත්නායක - සම පර්යේෂක
ඩී.ටී.පී.එස් ධර්මවර්ධන - සම පර්යේෂක

**තිරසාර සංවර්ධන ඉලක්ක: කුසගින්න නිමා කිරීම, ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය වැඩිදියුණු කිරීම සහ තිරසාර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම (අංක 2)**

**ප්‍රධාන අරමුණ:** කෘෂිකාර්මික අංශයේ අනාගත මැදිහත්වීම් සඳහා වටිනා මගපෙන්වීමක් ලබා දීමේ අරමුණ ඇතිව, ශ්‍රී ලංකාවේ දේශගුණික සුහුරු කෘෂිකර්මාන්තය (Climate Smart Agriculture (CSA) ක්‍රියාත්මක කිරීමේ සාර්ථකත්වය සහ අභියෝග විමර්ශනය කිරීම.

**ප්‍රධාන සොයාගැනීම් :**

1. ශ්‍රී ලංකාවේ දේශගුණික සුහුරු කෘෂිකර්මාන්තය හා සම්බන්ධ මුල පිරීම් කෘෂිකාර්මික ඔරොත්තු දීමේ හැකියාව සහ ඵලදායිතාව ඉහළ නැංවීම අතින් කැපී පෙනෙන සාර්ථකත්වයන් පෙන්නුම් කර ඇත.

2. දේශගුණයට ඔරොත්තු දෙන බෝග ප්‍රභේද සහ විවිධාංගීකරණය වූ ගොවිතැන් පිළිවෙත් අනුගමනය කිරීමෙන් අස්වැන්න වැඩි දියුණු වී ඇති අතර දේශගුණය ආශ්‍රිත පාත්‍රියතාව අඩු වී ඇත.

3. ධාරිතා ගොඩනැගීමේ ප්‍රයත්නයන් සහ දැනුම හුවමාරු කිරීමේ වැඩසටහන් මඟින් තිරසාර දේශගුණික සුහුරු කෘෂිකර්මාන්තය හා සම්බන්ධ තාක්ෂණික ක්‍රම ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට ගොවි ප්‍රජාවන් සවිබල ගන්වා ඇත.

4. මූල්‍ය සම්පත් සහ තාක්ෂණික සහාය සඳහා සීමිත ප්‍රවේශය දේශගුණික සුහුරු කෘෂිකර්මාන්තය හා සම්බන්ධ භාවිතයන් පුළුල්ව ක්‍රියාත්මක කිරීම සඳහා සැලකිය යුතු බාධාවක් ලෙස පවතී.

5. ප්‍රමාණවත් යටිතල පහසුකම් සහ සැපයුම් සහාය දුරස්ථ ග්‍රාමීය ප්‍රදේශවලට දේශගුණික සුහුරු තාක්ෂණයන් සහ භාවිතයන් ව්‍යාප්ත කිරීමට බාධා කරයි.

6. ඵලදායි ව්‍යාප්ති සේවා සහ ගොවියාගෙන් ගොවීන් අතර දැනුම හුවමාරුව බිම් මට්ටමේ දී දේශගුණික සුහුරු කෘෂිකර්මාන්තයට අදාළ භාවිතයන් ප්‍රවර්ධනය කිරීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

**ප්‍රධාන නිර්දේශ :**

1. ශ්‍රී ලංකාවේ විවිධ කෘෂි-පාරිසරික කලාපවලට ගැළපෙන සන්දර්භ-විශේෂිත විසඳුම් සංවර්ධනය කිරීම සඳහා දේශගුණික සුහුරු කෘෂිකර්මාන්ත පරිචයන් අනුගත කිරීම සහ දේශගුණික සුහුරු කෘෂිකර්මාන්ත පර්යේෂණ සහ නවෝත්පාදන සඳහා ආයෝජනය වැඩි කිරීම සඳහා ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් පෙනී සිටීම.

2. නව්‍ය විසඳුම් පර්යේෂණ සහ සංවර්ධනය සඳහා අරමුදල් ඇතුළුව, දේශගුණික සුහුරු කෘෂිකර්මාන්තය ක්‍රියාත්මක කිරීම සඳහා සම්පත් බලමුලු ගැන්වීම සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් දිරිමත් කිරීම.

3. දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දීමේ හැකියාව සහ ඵලදායිතාව ඉහළ නැංවීම සම්බන්ධයෙන් ඒවායේ ප්‍රතිලාභ අවධාරණය කරමින් දේශගුණික සුහුරු කෘෂිකර්මාන්තයට අදාළ භාවිතයන් පිළිබඳ දැනුවත්භාවය සහ දැනුම වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාප්ති සේවා සහ ගොවි පුහුණු වැඩසටහන් පුළුල් කිරීම.

4. දේශගුණික සුහුරු කෘෂිකර්මාන්තයට අදාළ මැදිහත්වීම්වල ප්‍රගතිය සහ බලපෑම නිරීක්ෂණය කිරීම සඳහා ශක්තිමත් අධීක්ෂණ සහ ඇගයීම් යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීම, සාක්ෂි මත පදනම් වූ තීරණ ගැනීම සහ අනුවර්තනය කළමණාකරණය සඳහා ඉඩ සැලසීම

## 08. දේශගුණික අවදානමට ලක් විය හැකි ගොවීන් සවිබල ගැන්වීම : වත්මන් අවදානම් තත්ත්වය

**මූල්‍ය ප්‍රභවය :** ඒකාබද්ධ අරමුදල

**පර්යේෂණ කණ්ඩායම :**

| | | |
|---|---|---|
| එම්.ඒ.සී.එස් බණ්ඩාර | - | සම්බන්ධීකරණ නිලධාරී |
| ජී.ජී.ද.එල්.ඩබ්.සමරසිංහ | - | සම පර්යේෂක |
| ඩබ්.එච්.ඒ ශාන්ත | - | සම පර්යේෂක |
| ආර්.එම්.ඩී.එච් රත්නායක | - | සම පර්යේෂක |

**තිරසාර සංවර්ධන ඉලක්ක අංක 2 : කුසගින්න නිමා කිරීම, ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය වැඩිදියුණු කිරීම සහ තිරසාර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම**

**ප්‍රධාන අරමුණ :**

අධ්‍යයන ක්ෂේත්‍රයේ කෘෂිකර්මාන්තයට සහ ගොවිජන ප්‍රජාවට දේශගුණික විපර්යාස සහ ග්‍රාමීය සමාජ-ආර්ථික අස්ථාවරත්වයේ බලපෑම් සවිස්තරාත්මකව ඇගයීම අපේක්ෂා කරන අතර **මෙහිදී** අභියෝග, ප්‍රතිවිපාක සහ අවදානම් හඳුනා ගැනීම මෙන්ම පවතින කෘෂිකාර්මික භාවිතයන් සහ පද්ධති පිළිබඳ අවබෝධය ද ඇතුළත් වේ.

**ප්‍රධාන සොයාගැනීම් :**

1. ගොවීන්ගෙන් බහුතරයක් පිරිමි සහ අවුරුදු 50 ට වැඩි අය වූ අතර මෙම අංශයේ කාන්තා සහ තරුණ ගොවීන්ගේ නියෝජනයක් නොමැති බව සොයාගැනීම් මගින් ඉස්මතු කරයි. මීට අමතරව, ප්‍රධාන ගොවීන්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් 11 ශ්‍රේණියට පහළ පාසල්වලට ගොස් ඇති අතර, එමගින් ඔවුන්ගේ තොරතුරු සඳහා ප්‍රවේශය සීමා වීම, අවබෝධය සහ නවීන ගොවිතැන් පිළිවෙත් සඳහා තෝරා ගැනීම සීමා වීම සිදු විය හැකිය.

2. කුඹුරු-ගොවි ප්‍රජාව තුළ කුඩා පවුල් ඒකක කෙරෙහි වැඩෙන ප්‍රවණතාවක් අධ්‍යයනයෙන් හෙළිදරව් වන අතර එය ශ්‍රම ලබා ගැනීමේ හැකියාව, ගොවිපළ කළමනාකරණ පිළිවෙත් සහ සම්පත් වෙන් කිරීම කෙරෙහි බලපෑම් ඇති කරයි.

3. බොහෝ ගොවීන්ගේ ප්‍රධාන රැකියාව වන්නේ බෝග වගාවයි. අවදානම් අවම කර ගැනීමට සහ ජීවනෝපාය පවත්වා ගැනීම සඳහා වෙනත් අවස්ථා ගවේෂණය කිරීමට ආදායම් මූලාශ්‍ර විවිධාංගීකරණය කිරීමේ අවශ්‍යතාවයක් පවතී. මෙයට හේතුව කුඩා පවුල් ඒකක බෝග අසාර්ථක වීම හෝ මිල උච්චාවචනයන් වැනි ආර්ථික කම්පනවලට ගොදුරු වීමේ වැඩි අවදානමක් ඇති බැවිනි. තම ආදායම් ප්‍රභවයන් විවිධාංගීකරණය කිරීමෙන් ගොවීන්ට බෝග වගාව මත යැපීම අවම කර ගත හැකි අතර ඔවුන්ගේ සමස්ත මූල්‍ය සුරක්ෂිතතාව වැඩිදියුණු කළ හැකිය.

**ප්‍රධාන නිර්දේශ :**

1. ගොවීන්ගේ මූල්‍ය සුරක්ෂිතභාවය ඉහළ නැංවීම සහ අවදානම් අවම කිරීම සඳහා ආදායම් මූලාශ්‍ර විවිධාංගීකරණය කෙරෙහි සැලකිය යුතු අවධානයක් අවශ්‍ය වේ. සාම්ප්‍රදායික බෝග වගාවෙන් ඔබ්බට විකල්ප ආදායම් මාර්ග ගවේෂණය කිරීම මෙයින් සිදුවේ.

2. කෘෂිකාර්මික අංශයේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රවර්ධනය කරන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම: කාන්තා ගොවීන්ට ඉඩම් සඳහා සුරක්ෂිත ප්‍රවේශය, ණය පහසුකම් සඳහා ප්‍රවේශය සහ ඔවුන්ගේ කුසලතා සහ දැනුම වැඩි දියුණු කිරීම සඳහා ඉලක්කගත පුහුණු වැඩසටහන් මෙයට ඇතුළත් විය හැකිය.

3. කෘෂිකාර්මික අංශයට සහභාගී වීමට තරුණ ගොවීන් සවිබල ගැන්වීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය. ඉඩම්, ණය පහසුකම්, වෙළඳපොළ අවස්ථා සහ ඉලක්කගත පුහුණුව සඳහා ප්‍රවේශය ලබා දීමෙන් ඔවුන්ගේ ක්‍රියාකාරී නියැලීමට සහ අනාගත සාර්ථකත්වයට හිතකර පරිසරයක් නිර්මාණය කළ හැකිය.

## 09. දේශගුණික සුහුරු කෘෂිකාර්මික විසඳුම් ක්‍රියාවට නැංවීම: දත්ත මත පදනම් වූ ක්‍රියාත්මක කිරීම

**මූල්‍ය ප්‍රභවය : ඒකාබද්ධ අරමුදල**

**පර්යේෂණ කණ්ඩායම :**

| | |
|---|---|
| ජී.ජී.ද. එල්.ඩබ්. සමරසිංහ | - සම්බන්ධීකරණ නිලධාරි |
| එච්.ජේ.සී. ජයසූරිය | - සම පර්යේෂක |
| ඩී.ටී.පී.එස්. ධර්මවර්ධන | - සම පර්යේෂක |
| ටී.පී මුණවීරගේ. | - සම පර්යේෂක |

**තිරසාර සංවර්ධන ඉලක්ක අංක 2 : කුසගින්න නිමා කිරීම, ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය වැඩිදියුණු කිරීම සහ තිරසාර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම**




**ප්‍රධාන අරමුණ:**

සහයෝගීතාව, සාක්ෂි මත පදනම් වූ තීරණ ගැනීම සහ ආධාරක ප්‍රතිපත්ති රාමු අවධාරණය කරමින් දේශගුණික සුහුරු කෘෂිකාර්මික මුලපිරීම් ක්‍රියාවට නැංවීම සඳහා පුළුල් උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීම.

**ප්‍රධාන සොයාගැනීම් :**

1. සහභාගීත්ව ග්‍රාමීය ප්‍රවේශය යටතේ විසඳුම් සඳහා ආයෝජනය කිරීමට මූල්‍ය හිඟය සහ ප්‍රාදේශීය/පළාත් රාජ්‍ය අනුග්‍රහය නොමැතිකම ප්‍රධාන බාධකයක් බව හඳුනා ගනු ලැබුණි. ව්‍යාපෘති මුලපිරීම්වල ධනාත්මක අනුවර්තන බලපෑම් රජයේ පාර්ශ්වකරුවන් සමඟ බෙදාගත් පසු සහ ප්‍රතිඵල ප්‍රකාශිත සහ දෘශ්‍යමාන වූ පසු, දිරිගැන්වීම, තාක්ෂණික සහාය සහ සම-මූල්‍යකරණය සපයන ශක්තිමත් හවුල්කරුවෙකු බවට රජයට පත්විය හැකිය.

2. දේශගුණික විපර්යාස හේතුවෙන් ජීවනෝපාය කෙරෙහි ඇති වන බලපෑම් පිළිබඳව ගොවීන් අතර දැනුවත්භාවය නොමැතිකම, බොහෝ ප්‍රදේශවල කෘෂිකර්ම ව්‍යාප්ති පහසුකම් නොමැතිකම, බෝග ප්‍රභේද සහ තේරීම් පිළිබඳ සීමිත තාක්ෂණික උපදෙස් සහ ජල කළමනාකරණයට බලපෑම් කිරීමේ සීමිත හැකියාව හඳුනාගෙන ඇත.

3. රජයේ බලධාරීන්ගෙන් තත්‍ය කාලීන තොරතුරු සහ උපදෙස් ලබා ගැනීම පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ගම්වාසීන්ට නොමැත.

**ප්‍රධාන නිර්දේශ :**

a) ගොවීන්ට නිවැරදි කාලීන කාලගුණ අනාවැකි සහ දේශගුණික තොරතුරු සපයන දේශගුණික තොරතුරු සේවා පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීම ඔවුන්ගේ කෘෂිකාර්මික කටයුතු පිළිබඳ දැනුවත් තීරණ ගැනීමට ඔවුන්ට සහාය වනු ඇත.

b) ප්‍රමාණවත් ජල සැපයුමක් සහතික කිරීම සඳහා වාරිමාර්ග පද්ධති වැඩිදියුණු කිරීම, වඩා හොඳ බෝග කළමනාකරණ ක්‍රම ක්‍රියාත්මක කිරීම සහ වනසතුන්ගේ වගාවන්ට වන හානිය පාලනය කිරීමට නිසි ක්‍රමවේද සකස් කිරීම, ස්වයං රැකියා සඳහා පුහුණු කිරීම, රැකියා අවස්ථා නිර්මාණය කිරීම සහ ව්‍යාප්ති සේවාව ශක්තිමත් කිරීම ආදිය යෝජනා කළ හැකි විසඳුම් කිහිපයකි.

c) පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් දිරිමත් කිරීම: සූර්ය හා සුළං බලය වැනි පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් භාවිතය ප්‍රවර්ධනය කිරීම හරිතාගාර වායු විමෝචනය අවම කිරීමට සහ දේශගුණික විපර්යාසවල බලපෑම් අවම කිරීමට උපකාරී වේ.

## කෘෂිකර්ම අමත්‍යාංශය විසින් භාර දුන් අධ්‍යයන

## 01. බිත්තර සහ කුකුළු මස් වල නිෂ්පාදන වියදම - 2023

කෘෂිකර්ම අමාත්‍යාංශයේ පශු සම්පත් අංශයේ අතිරේක ලේකම් (පශු සම්පත් සංවර්ධන) විසින් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයෙන් කරන ලද ඉල්ලීමකට අනුව, මෙම සමීක්ෂණය සිදු කරන ලදි. මෙම අධ්‍යනයේ ප්‍රධාන අරමුණ වූයේ බිත්තර හා කුකුල් මස්වල නිෂ්පාදන වියදම කුඩා, මධ්‍යම සහ මහා පරිමාණ නිෂ්පාදකයන් අනුව ගණනය කිරීම ය. දත්ත එක්රැස් කිරීම සඳහා බස්නාහිර හා වයඹ පළාත් තෝරාගත් අතර වයඹ පළාතේ කුරුණෑගල හා පුත්තලම යන දිස්ත්‍රික්ක දෙකේම නිෂ්පාදකයන්ගෙන් සමීක්ෂණය සඳහා අවශ්‍ය දත්ත එක්රැස් කරන ලදි. පන්නල, දුම්මලසූරිය, කටුපොත, බිංගිරිය, පඩුවස්නුවර, වාරියපොල සහ කොබෙයිගනේ යන පශු වෛද්‍ය නිලධාරී කාර්යාල බලප්‍රදේශයන් කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් ද, මහකුඹුක්කඩවල, පුත්තලම හා ආනමඩුව යන පශු වෛද්‍ය නිලධාරී කාර්යාල බලප්‍රදේශයන් පුත්තලම දිස්ත්‍රික්කයේ ද තෝරාගන්නා ලදි. කොස්ගම හා අවිස්සාවේල්ල පශු වෛද්‍ය නිලධාරී කාර්යාල බලප්‍රදේශයන් කොළඹ දිස්ත්‍රික්කයෙන්ද තෝරා ගන්නා ලදි.

එම සමීක්ෂණයට අනුව, හම සහිත කුකුල් මස් කිලෝග්‍රෑම් එකක් නිෂ්පාදනය කිරීම සඳහා විශාල පරිමාණයේ නිෂ්පාදකයකුට රුපියල් 863.69ක් ද මධ්‍යම පරිමාණයේ නිෂ්පාදකයකුට රුපියල් 794.95ක් ද කුඩා පරිමාණයේ නිෂ්පාදකයකුට රුපියල් 731.99ක් ද වැයවී තිබිණ. සම රහිත කුකුල් මස් කිලෝග්‍රෑම් එකක් නිෂ්පාදනය කිරීම සඳහා මහා පරිමාණ නිෂ්පාදකයකුට රුපියල් 912.59ක් ද, මධ්‍යම පරිමාණයේ නිෂ්පාදිතයකුට රුපියල් 840.12ක් ද වැයවී තිබුණු අතර රුපියල් 773.14ක් කුඩා පරිමාණයේ නිෂ්පාදිතයකුට වැය වී තිබිණ. කුඩා පරිමාණයේ නිෂ්පාදිතයකුගේ හා මධ්‍යම පරිමාණයේ නිෂ්පාදිතයකුගේ නිෂ්පාදන වියදමෙන් 58%ක් සහ මහා පරිමාණ නිෂ්පාදිතයකුගේ නිෂ්පාදන වියදමෙන් 74%ක් සත්ත්ව ආහාර සඳහා වැයවී තිබුණි. පැටව් මිලදී ගැනීම සඳහා දරන වියදම දෙවැනියට වැඩිම වියදම් කාණ්ඩය වූ අතර ඒ සඳහා කුඩා පරිමාණ නිෂ්පාදකයෙක්ට මුළු වියදමෙන් 33%ක් ද මධ්‍යම පරිමාණ නිෂ්පාකයෙක්ට 34%ක් ද හා මහා පරිමාණයේ නිෂ්පාදකයක් 19%ක් ද වැය කොට ඇත .

බිත්තරයක් නිෂ්පාදනය කිරීම සඳහා යන වියදම සලකා බැලීමේදී කුඩා පරිමාණයේ නිෂ්පාදකයෙකුට රුපියල් 43.81ක් ද මධ්‍යම පරිමාණයේ නිෂ්පාදකයෙකුට රුපියල් 39.51ක් ද විශාල පරිමාණයේ නිෂ්පාදකයෙකුට රුපියල්34.82ක් ද වැය වී ඇත. බිත්තර නිෂ්පාදකයන්ගේ මුළු වියදමෙන් වැඩිම කොටසක් වැය වී තිබුණේ සත්ත්ව ආහාර මිල දී ගැනීම සඳහා වන අතර එය මුළු නිෂ්පාදන පිරිවැයෙන් 90%ක් විශාල පරිමාණ නිෂ්පාදකයෙකුට ද 86%ක් මධ්‍යම පරිමාණයේ නිෂ්පාදකයෙකුට ද 75%ක් කුඩා පරිමාණයේ නිෂ්පාදකයන්ට ද වැය වී තිබිණි.

## 2. ගාල්ල දිස්ත්‍රික්කයේ සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ ගෘහස්ථ ආහාර සුරක්ෂිතතාව තක්සේරු කිරීම - 2023

**පර්යේෂණ කණ්ඩායම**

ඒන්.පී.ජී. සමන්ත
ප්‍රසන්න විජේසිංහ
සංගීත් ප්‍රනාන්දු
රවීනා උදාරි
දිලිනි පෙරේරා

ආර්ථික අර්බුදය හේතුවෙන් දැඩි ලෙස පීඩාවට පත් ජනතාවගේ පවතින ජීවන තත්ත්වය පිළිබඳව සොයා බැලීම සඳහා සමෘද්ධි දෙපාර්තමේන්තුව සමඟ එක්ව අධ්‍යයනයක් කරන ලෙස කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයෙන් නිල වශයෙන් ඉල්ලා සිටියේ ය. තව ද, පළමු අදියර ලෙස ගාල්ල දිස්ත්‍රික්කයේ සමීක්ෂණය සිදුකිරීමට ඔහු යෝජනා කළේය. අධ්‍යයනය සම්බන්ධීකරණය කිරීම, ප්‍රශ්නාවලිය සකස් කිරීම, දත්ත් රැස් කරන්නන් පුහුණු කිරීම, දත්ත විශ්ලේෂණය කිරීම සහ වාර්තාව ලිවීමේ වගකීම හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය විසින් වගකීම දරන අතර ඒ සම්බන්ධයෙන් ආයතන දෙකම එකඟ විය. සමෘද්ධි දෙපාර්තමේන්තුවට ඔවුන්ගේ ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන් යොදා ගනිමින් දත්ත රැස්කිරීමේ වගකීම පැවරී ඇත.

අධ්‍යයනයේ අරමුණ වූයේ ගාල්ල දිස්ත්‍රික්කයේ කුටුම්භවල ආහාර සුරක්ෂිතතා මට්ටම කෙරෙහි ආර්ථික අර්බුදයේ බලපෑම තක්සේරු කිරීම යි. සුදුසු ආහාර සුරක්ෂිතතා ජාල වැඩසටහන් හරහා ඵලදායී මැදිහත්වීම් තුළින් පහසුකම් සැලසීම සඳහා වත්මන් මිල දී ගැනීමේ හැසිරීම, පරිභෝජනයේ වෙනස්කම් සහ ඒවාට මුහුණ දීමේ උපාය මාර්ග අවබෝධ කර ගැනීම මෙහි අරමුණ යි . ගෘහස්ථ ආහාර පරිභෝජන රටාවන් ගවේෂණය කිරීම, ගෘහස්ථ ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය කෙරෙහි ආර්ථික අර්බුදයේ බලපෑම් තක්සේරු කිරීම, ආර්ථික අර්බුදවල දී කුටුම්භයන් විසින් අනුගමනය කරන ලද උපාය මාර්ග විමර්ශනය කිරීම සහ ඵලදායී ආහාර සුරක්ෂිතතා ජාල සැකසීමේ දී අවදානම අවම කිරීම සඳහා උපාය මාර්ග යෝජනා කිරීම විශේෂිත අරමුණු අතරට ඇතුළත් විය.

2023 ඔක්තෝම්බර් මාසයේදී, HARTI පර්යේෂණ කණ්ඩායම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් තෝරාගත් දත්ත රැස්කරන්නන් 25 දෙනෙකු පුහුණු කරන ලද අතර, දත්ත රැස් කිරීම 2023 නොවැම්බර් මාසයේදී සිදු විය.

## 2.3. අධ්‍යාපන හා පුහුණු අංශය



### කෘෂිකාර්මික හා ග්‍රාමීය සංවර්ධන ක්ෂේත්‍රයේ පරිවර්තනීය වෙනසක් කරා - 2023

කෘෂිකර්මාන්තයේ සහ ග්‍රාමීය සංවර්ධනයේ ප්‍රගමනය උදෙසා ගන්නා ඕනෑම උත්සාහයක් පවතින සන්දර්භයට හා අපේක්ෂිත වෙනසට ගැළපිය යුතුය. එසේ වුව ද, ග්‍රාමීය සංවර්ධනය මූලික වශයෙන් මිනිසුන් සමඟ මිනිසුන්ගේ සංවර්ධනය යි. ඕනෑම ග්‍රාමීය ප්‍රජාවක සංවර්ධනයක් කෘෂිකාර්මික හෝ වෙනත් ප්‍රජා සංවර්ධනයක් විඳ දරාගැනීමේ ප්‍රශස්ත ලාභාංශ ගෙවීම සඳහා මානව සම්පත් සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වේ. මානව සම්පත් සංවර්ධනය කිරීම යනු අදාළ ප්‍රජාවගේ මෘදු හා දෘඩ කුසලතා යන දෙඅංශයෙන්ම අවධානය යොමු කළ ධාරිතා සංවර්ධනය යි.

මෙම අවශ්‍යතාවය හඳුනාගෙන, අධ්‍යාපන හා පුහුණු අංශය සෑම වසරක ම කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සිටින ප්‍රජාවගේ ධාරිතාව වර්ධනය කිරීම සඳහා ඔවුන්ගේ ම සංවර්ධනයට සහ යහපැවැත්මට මෙන්ම ඒ සමඟ ම දායක වන පරිදි පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් සැලසුම් කරයි. පුහුණුවීම් සහ දැනුවත් කිරීම් ප්‍රමුඛතා තීරණය කිරීමේ දී අධ්‍යාපන හා පුහුණු අංශය ප්‍රවේශමෙන් සැලකිලිමත් වන අතර බොහෝ විට රටේ කෘෂිකර්මාන්තයට සෘජු හා වක්‍ර ප්‍රතිලාභ ලබා දෙන ගොවීන්, රාජ්‍ය සහ රාජ්‍ය නොවන නිලධාරීන් සහ අනෙකුත් ප්‍රජා සංවිධානවලින් සමන්විත ගොවිජන හා ග්‍රාමීය අංශයේ පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සඳහා ප්‍රමුඛත්වය ලබා දෙයි.

2023 වර්ෂය තුළ අධ්‍යාපන හා පුහුණු අංශය මගින් පවත්වනු ලබන වැඩසටහන්වල ප්‍රගතිය පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

1. නාගරික ප්‍රජාවන් සඳහා ගෘහස්ථ ආහාර සුරක්ෂිතතාව වැඩි කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන
2. කෘෂි ව්‍යවසායක අවස්ථා පිළිබඳ ග්‍රාමීය කාන්තාවන් සහ තරුණ ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහන - පළමු අදියර
3. කෘෂි ව්‍යවසායක අවස්ථා පිළිබඳ ග්‍රාමීය කාන්තාවන් සහ තරුණ ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහන - දෙවන අදියර

## 01.අර්ධ නාගරික ප්‍රජාවන්ගේ ආහාර සුරක්ෂිතතාව ඉහළ නැංවීම සඳහා ගෘහ ඒකක මට්ටමින් ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන

**වැඩසටහන සම්බන්ධීකරණය :** මෙම වැඩසටහන සම්බන්ධීකරණය දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහයෝගිතාව ඇතිව හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය (**HARTI** )විසින් සිදු කරන ලදී.

**සම්පත් දායකයින් :**

**HARTI සම්පත් දායකයින් :**

චින්තක ජයසූරිය - සම්බන්ධීකරණ නිලධාරී (අධ්‍යාපන හා පුහුණු අංශය)

එස්. එම්.ඒ. සමරකෝන් - අධි පර්යේෂක

ආචාර්ය චතුර ජයම්පති - අංශ ප්‍රධාන (අධ්‍යාපන හා පුහුණු අංශය)

**බාහිර සම්පත් දායකයින්**

පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් කාර්යාලය

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය

ශ්‍රී ලංකා මහ බැංකුව

**වැඩසටහනෙහි අවශ්‍යතාවය සහ අරමුණ**

අභියෝගාත්මක සමාජ-ආර්ථික තත්ත්වයක් තුළ, පසුගිය වසර දෙක තුළ රට ගමන් කරමින් සිටියේ, බහුතර ජනතාවගේ ආහාර සුරක්ෂිතතාව තර්ජනයට ලක් කරවමිනි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ආහාර ලබා ගැනීමේ හැකියාව, පෝෂණීය, ගුණාත්මක සහ ආරක්ෂිත ආහාර සඳහා ප්‍රවේශය සහ උපයෝගීතාව පවත්වා ගෙන යාමේ ස්ථාවරත්වය වැනි ආහාර සුරක්ෂිතතාවයේ සෑම අංශයකම අවිනිශ්චිතතාවයන් මතු විය. එමඟින් දේශීය ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීමට, නාස්තිය අවම කිරීමට, අඩු වියදම් පෝෂණ ආහාර පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට ප්‍රමුඛත්වය දීමේ අවශ්‍යතාවය උද්ගත විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, දැනුම හා කුසලතා වැඩි දියුණු කිරීම, ආකල්ප වෙනස් කිරීම සහ ගෘහස්ථ ආහාර සුරක්ෂිතතාවය පවත්වා ගැනීමට සූදානම් වීම තුළින් ප්‍රජාවගේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා රජයේ මැදිහත්වීම්වලට සහාය දැක්වීමේ අරමුණින් මෙම දැනුවත් කිරීමේ වැඩසටහන සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී.

**විෂය අන්තර්ගතය**

මෙම වැඩසටහන සැසි හතරකින් සමන්විත විය, එනම්,

1. සමකාලීන ආහාර නිෂ්පාදන අංශයේ අභියෝග සහ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීමේදී ප්‍රජාවේ කාර්යභාරය සහ වගකීම.
2. ගෙවතු වගාව තුළින් ආහාර සුරක්ෂිතතාව වැඩි කිරීම.
3. ආහාර නාස්තිය අවම කිරීම තුළින් ආහාර සුරක්ෂිතතාව වැඩි කිරීම.
4. ආහාර පරිභෝජන රටා වෙනස් කිරීම සහ ආහාර කල් තබා ගැනීමේ ක්‍රම අනුගමනය කිරීම, ආහාර සුරක්ෂිතතාවයේ පෝෂණ අංශය කෙරෙහි අවධානය යොමු කිරීම සහ ගෘහස්ථ ආහාර සුරක්ෂිතතාව (මූල්‍ය ආරක්ෂාව) පවත්වා ගෙන යාම සඳහා යහපත් මූල්‍ය කළමනාකරණ පිළිවෙත් වැඩි දියුණු කිරීම.

**ක්‍රියාත්මක කරන ලද ස්ථාන සහ සහභාගීත්වය**

මුලතිව්, කිලිනොච්චිය, මොනරාගල සහ නුවරඑළිය යන දිස්ත්‍රික්ක හතරක වැඩසටහන් 30ක් පවත්වන ලදී. අර්ධ නාගරික ප්‍රදේශවල ජීවත් වීම සහ වයස අවුරුදු 20ත් 50ත් අතර වයස්වල පසුවන්නන් යන පදනම මත සහභාගීවූවන් තෝරා ගන්නා ලදී. සහභාගි වූ මුළු සංඛ්‍යාව 1394 කි.

**ප්‍රතිලාභ**

ඉලක්කගත ප්‍රදේශයේ ප්‍රජා නායකයින් සැලකිය යුතු ප්‍රමාණයකට දැනුම හා දැනුවත්භාවය ලබාදීමට වැඩසටහන සමත් වූ අතර ප්‍රජා සංවිධාන තුළ කරන ලද සාකච්ඡා තුළින් ඔවුන් තම ප්‍රජා සාමාජිකයින් සමඟ දැනුම බෙදා ගැනීමට අපේක්ෂා කෙරේ. එසේ ම, දැනුවත් කරන ලද අවම කිරීමේ ක්‍රමවේද අනුගමනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, සපයන ලද දැනුම සහභාගිවන්නන්ගේ සහ ඔවුන්ගේ ප්‍රජා සාමාජිකයින්ගේ ආහාර සුරක්ෂිතතාවය සම්බන්ධ ගැටලුවල බරපතළකම සැලකිය යුතු ලෙස අඩු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 02. කාන්තාවන් සහ තරුණයින් කෘෂිකාර්මික ව්‍යවසායකයින් ලෙස ගොඩනැඟීම සඳහා පවතින අවස්ථා හඳුනාගැනීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන

කෘෂිකාර්මික ව්‍යවසායකත්වය වර්ධනය කිරීමේ අරමුණින් සැලසුම් කර ඇති මෙම වැඩසටහන අදියර තුනකින් පැවැත්වීමට සැලසුම් කර ඇත. වැඩසටහනේ පළමු අදියර දිරිගන්වන අදියර වූ අතර දෙවන සහ තෙවන අදියර පිළිවෙළින් ආධාරක අදියර සහ තිරසාර අදියර විය.

දිරිගන්වන අදියරේ දී දැනුවත් කිරීමේ වැඩසටහන මඟින් සාර්ථක ව්‍යවසායකයෙකු වීමට අවශ්‍ය ගුණාංග සහ ලක්ෂණ වර්ධනය කර ගැනීම පිණිස ගොවිබිම් තුළ සහ ඉන් බැහැරව පවතින කෘෂිකර්මාන්තය ආශ්‍රිත ව්‍යවසායක අවස්ථා හඳුන්වාදීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. මීට අමතරව, අභිප්‍රේරණය කිරීම, ව්‍යවසායක ආකල්ප වර්ධනය කිරීම, වෙළඳපළ අවස්ථා පිළිබඳව දැනුවත් කිරීම සහ අංකුර ව්‍යවසායකයින් සඳහා අවශ්‍ය සහාය සේවා සපයන ආයතන පිළිබඳ දැනුම සහභාගිවන්නන්ට ලබා දීම කෙරෙහි ද යොමු විය.

**වැඩසටහන සම්බන්ධීකරණය**

මෙම වැඩසටහනේ සම්බන්ධීකරණ කටයුතු හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය විසින් සිදු කරන ලද අතර, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහයෝගීතාවයෙන් අදාළ ස්ථානවල සිදු කරන ලදී.

**සම්පත් දායකයින් :**

**HARTI සම්පත් දායකයින් :**

චින්තක ජයසූරිය - සම්බන්ධීකරණ නිලධාරී (අධ්‍යාපන හා පුහුණු අංශය)

එස්. එම්.ඒ. සමරකෝන් - අධි පර්යේෂක

ආචාර්ය චතුර ජයම්පති - අංශ ප්‍රධාන (අධ්‍යාපන හා පුහුණු අංශය)

සුසිලා ලූර්දු - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනි, (අධ්‍යාපන හා පුහුණු අංශය)

**බාහිර සම්පත් දායකයින්**

පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව , දිස්ත්‍රික් කාර්යාල

පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

කුඩා ව්‍යාපාර සංවර්ධන ඒකකය (SED)

ජාතික ව්‍යාපාර සංවර්ධන අධිකාරිය (NEDA)

**වැඩසටහනේ අවශ්‍යතාවය සහ අරමුණ**

රටක ආර්ථිකයේ දියුණුව සඳහා හොඳින් ස්ථාපිත ව්‍යවසායකයින් සිටීම ඉතා වැදගත් වේ. රටක වත්කම් ගොඩනගා ගැනීමට ව්‍යවසායකයෝ බොහෝ උපකාර කරති. ඔවුහු රැකියා උත්පාදනය කරති, පවතින සම්පත්

උපරිමයෙන් භාවිතා කරති, රටට දැඩි ලෙස අවශ්‍යා වූ විදේශ විනිමය ඉතිරි කර ගනී. එසේම සාර්ථක ව්‍යවසායකයින් වීමට තරුණයින් සහ රැකියා විරහිත උගත් කාන්තාවන් පෙළඹවීම සහ දිරිගැන්වීම "ඵලදායි පුරවැසියන් සහ ප්‍රීතිමත් පවුල්" ගොඩනැගීමේ රජයේ ප්‍රතිපත්තියට අනුකූල වේ.

**විෂය අන්තර්ගතය**

අන්තර්ගතය ප්‍රධාන දැනුම් ක්ෂේත්‍ර තුනකින් සමන්විත විය

1. ව්‍යවසායකයෙකු ලෙස දියුණු විය යුතු ආකාරය සහ කුසලතා, දැනුම ලබා ගත යුතු, ගුණාංග සහ ආකල්ප අනුගමනය කළ යුතු ආකාරය.
2. කෘෂිකර්මාන්තය, පශු සම්පත් සහ අපනයන බෝග වැනි ක්ෂේත්‍රවල ඇති ගොවිපළ හා ගොවිපළ නොවන ආශ්‍රිත ව්‍යවසායක අවස්ථා.
3. අංකුර ව්‍යවසායකයින්ට ඔවුන්ගේ ව්‍යවසායන් දියුණු කිරීම සඳහා උපකාරක සේවා සහ ඔවුන්ගේ සේවාවන්හි ස්වභාවය සපයන ආයතන.

**ක්‍රියාත්මක කරන ලද ස්ථාන සහ සහභාගිවන්නන්**

මෙම දැනුවත් කිරීමේ වැඩසටහන හම්බන්තොට, ගාල්ල, මාතලේ සහ පොළොන්නරුව දිස්ත්‍රික්කවල පැවැත්විණි. තෝරාගත් දිස්ත්‍රික් ලේකම් හා ග්‍රාම නිලධාරී කොට්ඨාශවල සම්පූර්ණ වැඩසටහන් 27ක් පවත්වන ලද අතර, 1193 දෙනකු මෙම වැඩසටහන්වලට සහභාගී වූහ.

**ප්‍රතිඵල**

මෙම පුහුණු වැඩසටහනේ ප්‍රතිඵලය වූයේ තරුණ සහ කාන්තා සහභාගිවන්නන් සමූහයක් ව්‍යවසායකයින් ලෙස සිතීමට දැනුම, අභිප්‍රේරණය සහ ව්‍යසායකත්වය සම්බන්ධ ධනාත්මක ආකල්ප වෙනසක් ඇති කර ගැනීම යි. දිගු කාලීනව ඔවුන් වඩා හොඳ කාර්ය සාධනයක් සහිත ව්‍යවසායකයින් වනු ඇත.

## 03. කාන්තාවන් සහ තරුණයින් කෘෂිකාර්මික ව්‍යවසායකයින් ලෙස ගොඩනැගීම සඳහා පවතින අවස්ථා හඳුනාගැනීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන - දෙවන අදියර

ඉහත විස්තර කර ඇති පළමු වැඩසටහනෙන් ලැබුණු දැනුම සහ මඟපෙන්වීම තුළින් හැකියාවක් ඇතැයි හඳුනාගත් සහ ව්‍යවසායකත්ව මුලපිරීම් සිදු කරන ලද අය සඳහා උපකාරක අදියර ලෙස මෙම වැඩසටහන පවත්වන ලදී.

**වැඩසටහන සම්බන්ධීකරණය**

මෙම වැඩසටහනේ සම්බන්ධීකරණ කටයුතු හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය විසින් සිදු කරන ලද අතර, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහයෝගීතාවයෙන් අදාළ ස්ථානවල දැවුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

**සම්පත් දායකයින් :**

**HARTI සම්පත් දායකයින් :**

චින්තක ජයසූරිය - සම්බන්ධීකරණ නිලධාරී (අධ්‍යාපන හා පුහුණු අංශය)

එස්. එම්.ඒ. සමරකෝන් - අධි පර්යේෂක

**බාහිර සම්පත් දායකයින්**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (සමාගම් සංවර්ධන දෙපාර්තමේන්තුව)

කුඩා ව්‍යාපාර සංවර්ධන ඒකය (SED)

**අරමුණ:**

අලුතින් ආරම්භ කරන ලද ව්‍යාපාරවල අභියෝගවලට මුහුණ දෙන අංකුර ව්‍යවසායකයින්ට සහාය ලබා දීම සහ ව්‍යාපාරවල සාර්ථකත්වය සහ තිරසාරභාවය සඳහා අවශ්‍ය කුසලතා සහ දැනුම වැඩිදියුණු කිරීම

**විෂය අන්තර්ගතය**

- අංකුර ව්‍යවසායකයෙකු තම ව්‍යවසායකත්වයේ ආරම්භක අවධියේ දී මුහුණ දෙන අභියෝග සහ ඒවා ජය ගැනීමේ මාර්ග.
- ව්‍යවසායකත්ව ප්‍රයත්නවල සාර්ථකත්වය සහ තිරසාර බව සඳහා අවශ්‍ය පරිසරය සහ කුසලතා ගොඩනැගීම.
- ආකර්ෂණීය අලෙවිකරණ උපාය මාර්ග සමඟින් වෙළෙඳපොළ ජයගැනීම.

**ක්‍රියාත්මක කරන ලද ස්ථාන සහ සහභාගීත්වය**

දෙවන අදියරේ වැඩසටහන් කුරුණෑගල සහ බදුල්ල දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක විය. මෙම අදියරේ දී පුහුණුව ලැබූ නව ව්‍යවසායකයින් සංඛ්‍යාව 193කි. ඒ දිස්ත්‍රික්ක හතරෙන්ම පිළිවෙළින් 61ක් සහ 132ක් ලෙසිනි.

**ප්‍රතිඵල :**

1. මෙම වැඩසටහන කුරුණෑගල සහ බදුල්ල දිස්ත්‍රික්කවල ශක්තිමත් සහ සාර්ථක තරුණ ව්‍යවසායකයින් ගොඩනැගීමට අඩිතාලම දැමීය.

2. ඒ අනුව, මෙම වැඩසටහනේ දිගුකාලීන බලපෑම වන්නේ ලාභ උපදවන සහ එමඟින් තම ප්‍රජාවන්ගේ සංවර්ධනයට උපකාර වන සහ රටේ ආර්ථිකයට වඩා හොඳ දායකත්වයක් ලබා දෙන ඵලදායී, වඩා නිර්මාණශීලී සහ අභියෝගාත්මක ජීවනෝපායන් වෙත තරුණ පරම්පරාව යොමු වීමයි.

## 2.4. දත්ත කළමනාකරණ අංශය




### කෘෂිකාර්මික අලෙවි තොරතුරු ව්‍යාපෘතිය (Agriculture Marketing Information System - AMIS)

වෙළඳපොළ මිල හා තොරතුරු එක් රැස් කිරීම, සැකසීම, විශ්ලේෂණය කිරීම හා බෙදාහැරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ. දිවයිනේ ප්‍රධාන නිෂ්පාදන සහ බෙදා හැරීමේ ප්‍රදේශ ආවරණය වන පරිදි වෙළඳපළ ස්ථාන 45කින් ආහාරද්‍රව්‍යවල තොග මිල, සිල්ලර මිල සහ ගොවිපල මිළ ගණන් එකතු කරනු ලැබේ. එම තොරතුරු දෛනිකව, සතිපතා හා මාසිකව ‘ආහාර ද්‍රව්‍ය සහ විවරණිකා’ ලෙස ප්‍රකාශයට පත් කරනු ලබයි. ඊට අමතරව මොබිටෙල් "6666" කෘෂි මිල දර්ශකය මගින් ලංකාවේ ප්‍රධාන ආර්ථික මධ්‍යස්ථාන හා තොග වෙළඳපොළ 10ක තොග මිල තොරතුරු බෙදා හැරේ.

මෙම වෙළඳපොළ තොරතුරු එක් රැස්කිරීම හා බෙදා හැරීම කාර්යක්ෂම හා ඵලදායී කිරීම සඳහා ස්යංක්‍රීය තොරතුරු පද්ධතියක් (Automated Cloud System) නිර්මාණය කර ඇත. මෙම ව්‍යාපෘතියේ තොරතුරු ප්‍රතිපත්ති සම්පාදකයන්, අමාත්‍යාංශ, රාජ්‍ය හා පුද්ගලික ආයතන, විශ්ව විද්‍යාල සිසුන් ඇතුලු තොරතුරු භාවිතා කරන්නන් හට ඔවුන්ගේ ඉල්ලීම්වලට අනුව ලබා දීමේ කටයුතු ද දත්ත කළමණාකරන අංශයේ ප්‍රධාන වගකීම් අතර වේ.

## 2.5 තොරතුරු හා සන්නිවේදන අංශය

**ප්‍රකාශයට පත්කරන ලද පර්යේෂණ වාර්තා**

**01.** ශ්‍රී ලංකාවේ තුළ රසායනික පොහොර සහ අනෙකුත් කෘෂි රසායන ආනයනය තහනම් කිරීම වී වගාවට සිදුකරන ලද කෙටි කාලීන බලපෑම් පිළිබඳ අධ්‍යයනය.

- **'ගොවිමිණ' ජාතික කෘෂිකර්ම ජාතික පුවත්පත (සිංහල මාධ්‍යය)**




01 කාණ්ඩය
08 වැනි කලාපය (පෙබ- මාර්තු)
09 වැනි කලාපය (මාර්-අප්‍රේල්)
10 වැනි කලාපය (අප්‍රේ-මැයි)
11 වැනි කලාපය (මැයි-ජුනි)
12 වැනි කලාපය (ජුනි-ජූලි)

- **'ගොවිමිණ' දමිළ මාධ්‍ය සඟරාව**




2023 වෙළුම 01
1වන කලාපය
2 වන කලාපය
3 වන කලාපය

- **ගොවිකටයුතු පුවත්හසුන**










2023 (වෙළුම 47) 1වන කලාපය
2 වන කලාපය
3 වන කලාපය
4 වන කලාපය

- **ගොවිකටයුතු අධ්‍යයන** 2023 (වෙළුම 14) පළමු කලාපය

- **'ගොවිජනතා' සඟරාව**








2023 වෙළුම 25
පළමු සහ දෙවන කලාපය (ජනවාරි - ජූනි)
ගොවිජනතා විශේෂ කලාපය
තුන්වන සහ හතරවන කලාපය (ජූලි- දෙසැම්බර්)

- **සන්නිවේදන නිපුණතා සහ කුසලතා පුහුණු අත්පොත**



- **දේශගුණික විපර්යාස : නිතර අසන ප්‍රශ්න (අත්පොත)**




- **හෙක්ටර් කොබ්බෑකඩුව නිහඬ විප්ලවය 51වෙනි ගුණ සමරුව වෙනුවෙන් කළ අත් පොත**

- **සමාජ මාධ්‍ය පළකිරීම් 2023**

| | |
|---|---|
| නිල ෆේස්බුක් පෝස්ට් | 88 |
| නිල එක්ස් ගිණුම පෝස්ට් | 45 |
| ඉන්ස්ටග්‍රෑම් ගිණුම පෝස්ට් | 23 |
| යූටියුබ් වැඩසටහන් | 34 ක් උඩුගත කර ඇත. |



- **රූපවාහිනි වැඩසටහන්**

2023 අප්‍රේල් 27 දින ස්වර්ණවාහිනි නාලිකාවේ විකාශය වූ 'මෙහෙවර' වැඩසටහනට අධි පර්යේෂිකා රේණුකා වීරක්කොඩි මහත්මිය සහභාගී වූවා ය. (තේමාව -වනසතුන්ගෙන් ගොවිබිම්වලට සිදු වන හානි අවම කර ගැනීමට යෝජිත වැඩසටහන්)

- **ගුවන්විදුලි වැඩසටහන්**

2023 අගෝස්තු 11 දින සිංහල ස්වදේශීය සේවයේ සුභාරතී වැඩසටහන සඳහා ආයතනයේ අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී ආචාර්ය ජී.ජී. බන්දුල මහතා සහභාගී සහභාගී විය. (තේමාව - ජීවන වියදම, උද්ධමනය සහ සංඛ්‍යා දත්ත)

- **වීඩියෝ සම්මුඛ සාකච්ඡා - බාහිර ආයතන**

DIMO Agribusiness ආයතනය විසින් තිරසාර කෘෂි කර්මාන්තයක් අරමුණු කරගනිමින් පැවැත්වෙන " කෘෂි සෞභාග්‍යා " වැඩසටහන් මාලාවේ වීඩියෝ සම්මුඛ සාකච්ඡා සඳහා පහත සඳහන් තේමා පිළිබඳ පහත එක්එක් පර්යේෂණ නිලධාරීන් අදහස් දැක්වීම සිදුකර තිබේ.

1. කෘෂිකර්මාන්තය තුළ කෘෂියාන්ත්‍රීකරණයේ ව්‍යාප්තිය පිළිබඳව දැනුවත් කිරීම -ජ්‍යෝෂ්ඨ පර්යේෂණ නිලධාරී- සිදත් බණ්ඩාර මහතා.

2. ශ්‍රී ලංකාවේ කිරි ගව පාලනය හා කිරි නිෂ්පාදනයේ ඇති වැදගත්කම - ජ්‍යෝෂ්ඨ පර්යේෂණ නිලධාරිනි සාගරිකා හිටිහාමු මිය.

3. සාර්ථක ව්‍යවසායෙකු වීමේ මග - පර්යේෂණ නිලධාරී චින්තක ජයසූරිය මහතා

4. ක්ෂුද්‍ර මූල්‍ය ණය ඵලදායීව භාවිතා කිරීම - පර්යේෂණ නිලධාරිනි තුෂාරා ධර්මවර්ධන මිය

- **පුවත්පත් ලිපි**

'Crisis made Crises in Poultry'- ආහාර පද්ධති අංශයේ පර්යේෂණයක් පාදක කොට ගෙන 2023 නොවැම්බර් 07 දින ඩේලි මිරර් පුවත්පතට ලිපියක් සම්පාදනය කර තිබේ.

- **ප්‍රදර්ශන කුටි**

ජාතික විද්‍යා දින සැමරුම 2023 වෙනුවෙන් කොළඹ ජාතික කෞතුකාගාර පරිශ්‍රයේ දී නොවැම්බර් මස 8, 9, 10 යන තෙදින පුරා පැවති ප්‍රදර්ශනයට හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අලෙවි කුටියක් විවෘත කිරීම.

- **ප්‍රතිපත්ති සංක්ෂිප්ත**

01. **ශ්‍රී ලංකාවේ තුළ රසායනික පොහොර සහ අනෙකුත් කෘෂි රසායන ආනයනය තහනම් කිරීම වී වගාවට සිදුකරන ලද කෙටි කාලීන බලපෑම් පිළිබඳ අධ්‍යයනය.**

02. **ශ්‍රී ලංකාවේ තුළ රසායනික පොහොර සහ අනෙකුත් කෘෂි රසායන ආනයනය තහනම් කිරීම එළවළු වගාවට සිදුකරන ලද කෙටි කාලීන බලපෑම් පිළිබඳ අධ්‍යයනය.**

03. **ශ්‍රී ලංකාව තුළ රසායනික පොහොර සහ අනෙකුත් කෘෂි රසායන ආනයනය තහනම් කිරීම තෝරාගත් වෙනත් ක්ෂේත්‍ර බෝග සහ අර්තාපල් වගාවට සිදුකරන ලද කෙටි කාලීන බලපෑම් පිළිබඳ අධ්‍යයනය.**

04. **ශ්‍රී ලංකාව තුළ රසායනික පොහොර සහ අනෙකුත් කෘෂි රසායන ආනයනය තහනම් කිරීම විසිතුරු පැළ සහ කැපුම් මල් වගා කරන ගොවි ප්‍රජාවන්ට ඇති කරන ලද කෙටි කාලීන බලපෑම් පිළිබඳ අධ්‍යයනය**

05. ආහාර ද්‍රව්‍යවල මිල ඉහළ යාම ගෘහ ඒකක වල ආහාර සුරක්ෂිතතාව කෙරෙහි ඇති කරන බලපෑම; ග්‍රාමීය, නාගරික, **වතු අංශ කෙරෙහි කර ඇති බලපෑම පිළිබඳ අධ්‍යයනය**

06. ග්‍රාමීය සංවර්ධනය සඳහා තිරසාර ජීවනෝපාය මාර්ගයක් ලෙස ආදායම විවිධාංගීකරණය: ප්‍රශස්ත තත්වයන් හඳුනාගැනීම.

## 2.6. පුස්තකාලය

පුස්තකාලයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ පර්යේෂණ කාර්ය මණ්ඩලයේ සහ අනෙකුත් උනන්දුවක් දක්වන පුද්ගලයින්ගේ සහ සංවිධානවල ප්‍රයෝජනය සඳහා කෘෂිකාර්මික අංශයට අදාළ තොරතුරු එක්රැස් කිරීම, ගොනු කිරීම සහ තොරතුරු අවශ්‍යතා සැපයීම වේ. වර්ෂය තුළ කාර්ය මණ්ඩලයේ විමර්ශන අවශ්‍යතා වෙනුවෙන් ග්‍රන්ථ 256 ක්, ද විමර්ශන කෘති 04ක් සහ වාර ප්‍රකාශන 05ක් ද නිකුත් කර තිබේ. වර්ෂය තුළ පුස්තකාලයට පැමිණි බාහිර පරිශීලකයින්ගේ සංඛ්‍යාව 45 කි.

**පොත්,සඟරා සහ වාර ප්‍රකාශන අත්පත් කර ගැනීම**

වර්ෂය තුළ ග්‍රන්ථ 85ක් පුස්තකාල එකතුවට අත්පත් කර ගෙන ඇත. දේශීය සහ විදේශීය ආයතනවලින් විශාල වාර සඟරා, පුවත් හසුන්, වාර්ෂික වාර්තා ප්‍රමාණයක් හුවමාරු හෝ පරිත්‍යාග වශයෙන් ලැබී තිබේ.

**පුස්තකාල සේවා**

පර්යේෂණ කාර්ය මණ්ඩලයේ සහ බාහිර පාඨක ඉල්ලීම් පරිදි තොරතුරු සහ ප්‍රලේඛන සේවාවන් වන සාහිත්‍ය ගවේෂණය, විමර්ශන සේවා, කාලීන තොරතුරු පිළිබඳ දැනුවත් කිරීම් සහ ඡායා පිටපත් සේවාවන් සපයන ලදී.

පුස්තකාලය තුළ නවීන වයිෆයි පහසුකම ලබා ගැනීමත් සමඟ අන්තර්ජාල පාදක තොරතුරු පහසුකම් සඳහා වූ ප්‍රවේශය පර්යේෂණ කාර්ය මණ්ඩලය සඳහා තව දුරටත් පුළුල් කරන ලදී. පර්යේෂණ කාර්ය මණ්ඩලය සහ බාහිර පාඨකයින් සඳහා විවිධ විෂයන් යටතේ පවත්වා ගෙන යන පුවත්පත් ලිපි එකතුව ක්ෂණික විමර්ශනය සඳහා අඛණ්ඩ අනුක්‍රමණිකගත කොට ඇත.

**පුස්තකාල සේවා**

පර්යේෂණ කාර්ය මණ්ඩලයේ සහ බාහිර පාඨක ඉල්ලීම් පරිදි තොරතුරු සහ ප්‍රලේඛන සේවාවන් වන සාහිත්‍ය ගවේෂණය, විමර්ශන සේවා, කාලීන තොරතුරු පිළිබඳ දැනුවත් කිරීම් සහ ඡායා පිටපත් සේවාවන් සපයන ලදී.

පුස්තකාලය තුළ නවීන වයිෆයි පහසුකම ලබා ගැනීමත් සමඟ අන්තර්ජාල පාදක තොරතුරු පහසුකම් සඳහා වූ ප්‍රවේශය පර්යේෂණ කාර්ය මණ්ඩලය සඳහා තව දුරටත් පුළුල් කරන ලදී. පර්යේෂණ කාර්ය මණ්ඩලය සහ බාහිර පාඨකයින් සඳහා විවිධ විෂයන් යටතේ පවත්වාගෙන යන පුවත්පත් ලිපි එකතුව ක්ෂණික විමර්ශනය සඳහා අඛණ්ඩ අනුක්‍රමණිකගත කොට ඇත.

**අන්තර් පුස්තකාල සහයෝගීතාවය (ILC)**

යම්කිසි පුස්තකාල ද්‍රව්‍යක් අප පුස්තකාලයේ හෝ වෙනත් විශේෂ පුස්තකාලයක නොමැති විට අන්තර් පුස්තකාල සහයෝගීතා ක්‍රමය මඟින් පුස්තකාල ද්‍රව්‍ය හුවමාරු කර ගැනීමේ පහසුකම අප පුස්තකාලය සතුව පවතී. එය ආයතනික මට්ටමින් සිදු විය යුතු අතර අන්තර් පුස්තකාල සහයෝගීතාව සඳහා ඉල්ලුම් කරන පුස්තකාල මුලින්ම එකඟතාවයකට/ නීති පද්ධතියකට යටත්ව අත්සන් කොට පුස්තකාල ද්‍රව්‍ය හුවමාරු කර ගත හැක. තවද, අපගේ පර්යේෂණ අවශ්‍යතාවයන් සඳහා විද්‍යුත් ලිපි මඟින් විශ්වවිද්‍යාල අතර විද්‍යුත් ලිපි විද්‍යුත් ලියකියවිලි හුවමාරු කර ගැනීම ද සිදු කරනු ලබයි.

**පුස්තකාල ප්‍රවර්ධන වැඩසටහන්**

01. අප පුස්තකාලය පිළිබඳ අත් පත්‍රිකාවක් විශ්වවිද්‍යාල සිසුන් හා පුස්තකාලයට පැමිණි පරිශීලකයින් අතර බෙදා හරින ලදී.
02. ආචාර්ය එම්.යූ.ඒ. තෙන්නකෝන් මැතිතුමා ගේ පොත් පරිත්‍යාගය




ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ හිටපු අධ්‍යක්ෂ ජෙනරාල්වරයෙකු හා වියළි කලාපීය කෘෂිකාර්මික හා ග්‍රාමීය සංවර්ධනය සම්බන්ධ ප්‍රාමාණික පර්යේෂකයකු වන ආචාර්ය එම්.යූ.ඒ. තෙන්නකෝන් මැතිතුමා විසින් පරිශීලනය කරන ලද වටිනා ග්‍රන්ථ 650කට අධික සංඛ්‍යාවක් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ පුස්තකාලය වෙත පරිත්‍යාග කිරීම 2023 ජුනි 13 දින සිදුවිය.

කලක් ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපතිවරයෙකු ලෙස ද සේවය කර ඇති ආචාර්ය එම්.යූ.ඒ. තෙන්නකෝන් මහතා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සමඟ පර්යේෂණ අධ්‍යයන හා පුහුණු කටයුතුවල දී ඉතාමත් සමීපව කටයුතු කළ විද්වතෙකි.

## 2.7. බාහිර සහයෝගිතාවන්

බාහිර හවුල්කාරිත්ව සම්බන්ධතා පුළුල් වීම සහ ආයතනය බොහෝ අන්තර්ජාතික ආයතන සමඟ සබඳතා නැවත ගොඩනඟා ගැනීමට හැකි වීම අතින් 2023 වර්ෂය අප ආයතනයට ඉතා වැදගත් වර්ෂයක් විය.

මෙම මුලපිරීම්වල ක්ෂණික ප්‍රතිඵලයක් ලෙස අප ආයතනයට පර්යේෂණ, පුහුණුකිරීම් සහ සමීක්ෂණ පැවැත්වීමේ වගකීම් පැවරුණි. ඒ අනුව වර්ෂය තුළ රුපියල් මිලියන 58ක ව්‍යාපෘති අයවැයක් ක්‍රියාත්මක කරන ලදී.

| | ආයතනයේ නම | යෙද වූ මුදල (රු) |
|---|---|---|
| 01 | ආහාර හා කෘෂිකර්ම සංවිධානය | 32,250,622.75 |
| 02 | එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩසටහන | 9,432,540.16 |
| 03 | Nippon Koei Co., Ltd. (JICA Expert Team) | 4,158,452.89 |
| 04 | DevPro | 3,599,518.06 |
| 05 | වර්ල්ඩ් විෂන් ලංකා | 8,624,196.94 |
| | සමස්ත අයවැය | **58,065,330.80** |

01. ආහාර හා කෘෂිකර්ම සංවිධානය

## ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශය දේශගුණික කම්පනවලට ගොදුරු වීමේ හැකියාව අවම කිරීම සඳහා ඒකාබද්ධ ඊ ව්‍යාප්ති සේවාවන් භාවිතා කිරීම.

**අරමුදල් ප්‍රභවය :** එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය

**පර්යේෂණ කණ්ඩායම :**

එම්.ඒ.සී.එස්. බණ්ඩාර - සම්බන්ධීකරණ නිලධාරී
ටී.පී. මුණවීරගේ - සම පර්යේෂිකා
ජී.ජී.ද.එල්.ඩබ්. සමරසිංහ - සම පර්යේෂිකා
ඩබ්.එච්.ඒ. ශාන්ත - සම පර්යේෂක
එච්.ජේ.සී. ජයසූරිය - සම පර්යේෂක
ඩී.ටී.පී.එස්. ධර්මවර්ධන - සම පර්යේෂිකා
ආර්.එම්.ඩී.එච්. රත්නායක - සම පර්යේෂිකා




**තිරසාර සංවර්ධන ඉලක්ක:** කුසගින්න නිමා කිරීම, ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය වැඩිදියුණු කිරීම සහ තිරසාර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම (SDG 2)

**ප්‍රධාන අරමුණ**

ශ්‍රී ලංකාවේ වී ගොවීන්ගේ බහු කම්පනවලට ගොදුරු වීමේ අවදානම සහ ග්‍රාමීය ප්‍රදේශවල දරිද්‍රතාවය අඩු කිරීමට දායක වීම පිණිස SEED hub (Smart Extension and Efficient Decision-making Hub) ඊ ව්‍යාප්ති මෙවලම භාවිතා කිරීම හා බෙදා හැරීම සඳහා මූල්‍ය හා තාක්ෂණික සහය සහය ලබා දීම.

**ප්‍රගතිය**

මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා, සැසි 110කින් සමන්විත පුළුල් පුහුණු වැඩසටහන් මාලාවක් ප්‍රමිතිගත ක්‍රමවේදයකට අනුව සංවිධානය කර පවත්වන ලදී. එම අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් පුහුණු සැසි සංවිධානය කර ඇති අතර S.E.E.D. Hub ඊ ව්‍යාප්ති වේදිකාවේ මූලිකාංග හඳුන්වා දීම, එහි විවිධ මොඩියුල පැහැදිලි කිරීම, ඊට ප්‍රවේශ වන ආකාරය සහ එය භාවිතා කරන ආකාරය තේරුම් ගන්නේ කෙසේද යන්න පිළිබඳව සහභාගීවන්නට මගපෙන්වීම, ගොවීන්ගේ ප්‍රශ්නවලට පිළිතුරු දෙන ආකාරය වැනි කරුණු පැහැදිලි කිරීම මෙම පුහුණු සැසිවලින් සිදු කෙරේ.

පුහුණු වැඩසටහන දිස්ත්‍රික්ක 10ක් පුරා සිදු කරන ලද අතර විශේෂයෙන්ම වී ගොවීන් ඉලක්ක කරගෙන සකස් කළ වැඩසටහනකි. එහි අරමුණ ගොවීන් බහුවිධ කම්පනවලට ගොදුරු වීම අවම කර ගැනීම, ග්‍රාමීය ප්‍රදේශවල දරිද්‍රතාව අවම කිරීමට දායක වීම, ව්‍යවසායක ගොවියෙකු වීමට නිසි ව්‍යාප්ති සේවා නොමැති ගොවීන්ව බලගැන්වීම ආදිය යි.

ගොවීන්ට තම ගොවිබිම් ලාභදායී ව්‍යාපාර බවට පරිවර්තනය කිරීමට සහාය වීම, ගොවි ප්‍රජාවන් සහ අගයදාම ක්‍රියාකාරීන් අතර සම්බන්ධතා ගොඩ නැඟීම, නිරන්තරයෙන් ඇති වන දේශගුණික කම්පන සහ ස්වභාවික උවදුරුවලට ඔවුන් ගොදුරු වීමේ අවදානම අවම කිරීම සඳහා අවදානම් කළමනාකරණ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමයි.

## 02. එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩසටහන - වෙළඳපොළ ක්‍රියාකාරීත්ව දර්ශකය ගණනය කිරීම (MFI)

**මූල්‍ය ප්‍රභවය :** ලෝක ආහාර වැඩසටහන (WFP)

**පර්යේෂණ කණ්ඩායම :**

එන්.පී.ජී. සමන්ත
අයි.පී.පී.එම්. විජේසිංහ
එස්.පී. ප්‍රනාන්දු
ආර්.එන්.කේ. රඹුක්වැල්ල
පී.ඒ.ජේ. චම්පිකා
ඒ.කේ.ඒ. දිසානායක

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ ආහාර පද්ධති අංශය හා දත්ත කළමනාකරණ අංශය සහයෝගයෙන් ලෝක ආහාර වැඩසටහන සමඟ (WFP) සහයෝගයෙන් මෙම සමීක්ෂණය සිදු කර තිබේ.

වෙළඳපොළ ක්‍රියාකාරීත්ව දර්ශකය යනු වෙළඳපොළ ක්‍රියාකාරීත්වයේ මානයන් 9ක් පදනම් කරගනිමින් ලෝක ආහාර වැඩසටහන විසින් දියුණු කරන ලද දර්ශකයකි. 2023 මැයි සිට 2023 සැප්තැම්බර් දක්වා දිවයිනේ සියලුම වෙළඳපොළ නියෝජනය කරමින් මධ්‍යස්ථාන 37කින් දත්ත රැස් කිරීම 2023 මැයි මස සිට 2023 සැප්තැම්බර් දක්වා සිදු කරන ලදී. වෙළඳපොළ ක්‍රියාකාරීත්ව දර්ශකය මඟින් මනිනු ලබන්නේ වෙළඳපොළේ ක්‍රියාකාරීත්ව මට්ටමයි. දර්ශකයේ අගය 0-3 නම්, වෙළඳපොලේ ක්‍රියාකාරීත්වය අඩු වන අතර එය තුළ සහනාධාරයක් ලබා දීම නිර්දේශ කෙරේ.

අගය පවතින්නේ 3-6 ට නම්, වෙළඳපොළ මධ්‍යස්ථව ක්‍රියාත්මක වන අතර ඔවුන් ඔවුන්ගේ සහනාධාරය සඳහා වවුචර් ක්‍රමයක් නිර්දේශ කරයි. දර්ශක අගය 6-9 නම්, වෙළඳපල හොඳින් ක්‍රියාත්මක වන අතර මුදල් ප්‍රදාන නිර්දේශ කරනු ලබයි.

2022 වසරට සාපේක්ෂව වෙළඳපොළේ ක්‍රියාකාරීත්වය 2023 වර්ෂයේ සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත.

## 03. නිපොන් කොයි සමූහ සමාගම (ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ඒජන්සිය JICA)

ශ්‍රී ලංකාවේ සැපයුම් දාම ව්‍යුහය ශක්තිමත් කිරීම තුළින් කුඩා හා මධ්‍ය පරිමාණ කෘෂි නිෂ්පාදකයින්ගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා වන අගය දාම විශ්ලේෂණය

**මූල්‍ය ප්‍රභවය :** නිපොන් කොයි සමූහ සමාගම

**පර්යේෂණ කණ්ඩායම :**

එන්.පී.ජී. සමන්ත
ආර්.පී. විදානපතිරණ
ආර්.එන්.කේ. රඹුක්වැල්ල
ඩබ්.ඒ.එන්. විජේසූරිය
පී.ඒ.ජේ. චම්පිකා
එස්.පී. ප්‍රනාන්දු
එම්.ඩී.ඩී. පෙරේරා
යූ.ඩී.ආර්. උදාරි
ඒ.කේ.ඒ. දිසානායක

ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (JICA) සමඟ සහයෝගයෙන් නිපොන් කොයි සමූහ සමාගමේ උපදේශකයින් සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (DoA) විසින් ශ්‍රී ලංකාවේ අගය දාම ව්‍යුහය ශක්තිමත් කිරීම

තුළින් කුඩා හා මධ්‍ය පරිමාණ කෘෂිකාර්මික නිෂ්පාදකයින්ගේ ජීවනෝපාය වැඩි දියුණු කිරීම පිණිස මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. මෙම පර්යේෂණය සිදු කිරීම සඳහා ලංසු තැබීමේ අදියරේ දී හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය සාර්ථක වූ අතර 2023 ජනවාරි සිට මැයි දක්වා අධ්‍යයනය සිදු කරන ලදී. අධ්‍යයනයෙන් ශ්‍රී ලංකාවේ පලතුරු හා එළවළු වටිනාකම් දාමයේ ප්‍රධාන ගැටලු හඳුනා ගන්නා ලද අතර ඒවා සඳහා විභව විසඳුම් යෝජනා කරන ලදී.

මෙම අධ්‍යයනයේ මූලික පරමාර්ථය වූයේ කෘෂි දේශගුණික කලාප තුනක් (පහතරට, උඩරට සහ අතරමැද කලාපය) නියෝජනය කරන තෝරා ගත් ප්‍රධාන බෝග කිහිපයක අගය දාම පිළිබඳ විශ්ලේෂණයක් සිදු කර එම කෘෂිකාර්මික අගය දාමවල ව්‍යුහය සහ ක්‍රියාකාරිත්වය, ඒවායේ ප්‍රවණතා, අභියෝග සහ වඩා හොඳින් ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම මත ව්‍යාපෘතිය පිළිබිඹු කළ හැකි විසඳුම් සොයා බැලීමයි.

**ප්‍රධාන සොයා ගැනීම්**

1. පලතුරු සහ එළවළු වටිනාකම් දාමයේ ගැටලු නිෂ්පාදක සහ අතරමැදි ගැටලු ලෙස වර්ගීකරණය කර ඇත. නිෂ්පාදක මට්ටමේ අභියෝග අතර බීජ සම්බන්ධ ගැටලු, පොහොර සහ කෘෂි රසායන සම්බන්ධ ගැටලු, යහපත් කෘෂිකාර්මික භාවිතයන් පිළිබඳ දැනුම නොමැතිකම, බෝග තෝරා ගැනීම සහ තාක්ෂණය අනුගමනය කිරීම, වන සතුන් ප්‍රහාර වැනි ප්‍රශ්න සමඟ ආධාරක කණුවල ඉහළ මිල, නවීන වටිනාකම් දාමයන් සම්බන්ධයෙන් සීමා සහිත ඉල්ලුම, සහ මූල්‍යකරණයට ප්‍රමාණවත් ප්‍රවේශයක් නොමැත.
2. අතරමැදි ගැටලු යටතට පසු අස්වනු පාඩු, ගොවීන්ගේ සීමිත කේවල් කිරීමේ හැකියාව, අධික ප්‍රවාහන වියදම් සහ මුදල් නිරවුල්කරණයේ ගැටලු හඳුනා ගත හැකිය.
3. ක්‍රියාත්මක කළ හැකි විසඳුම් අතර බීජ නිෂ්පාදනය සඳහා අරමුදල් වැඩි කිරීම, පොහොර සහ කෘෂි රසායන සැපයුම් සම්බන්ධ ගැටලුවලට විසඳුම් සෙවීම, යහපත් කෘෂිකාර්මික භාවිතයන් ප්‍රවර්ධනය කිරීම, බෝග තෝරා ගැනීම සහ තාක්ෂණය අනුගමනය කිරීම පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම, වන සතුන්ගේ ප්‍රහාර වැළැක්වීම සඳහා පියවර ගැනීම, මිල අධික ආධාරක කණු සඳහා විකල්ප සොයා ගැනීම, බෝග රක්ෂණ ක්‍රමය වැඩිදියුණු කිරීම, මූල්‍ය පහසුකම් සඳහා ප්‍රවේශය වැඩි කිරීම, වෙළඳපල තොරතුරු සැපයීම සහ පසු අස්වනු පාඩු අවම කිරීම සඳහා ප්‍රවාහන ක්‍රම ප්‍රතිව්‍යුහගත කිරීම දැක්විය හැකිය.

## 4. ගොවිමිණ පුවත්පත සහ ගොවිමිණ සඟරාව (DevPro)

**මූල්‍ය ප්‍රභවය** : DevPro

**කණ්ඩායම :**

| | |
|---|---|
| ඩබ්.එච්.ඒ ශාන්ත | - සම්බන්ධීකරණ නිලධාරී |
| ඩබ්.ටී.ඩී. සිරිතුංග | - ප්‍රධාන සංස්කාරක |
| ආර්.ඩී.ඩබ්.සී රාජපක්ෂ | - නියෝජ්‍ය සංස්කාරක |

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් DevPro Guarantee Limited ආයතනය විසින් සිදු කරන ලද කාර්යය හඳුනා ගනිමින් ගොවිමිණ පුවත්පතේ (සිංහල මාධ්‍ය) මෙන්ම ගොවිමිණ සඟරාවේ ව්‍යාපෘතිය සමඟ (දෙමළ මාධ්‍ය) සහයෝගිතා කටයුතු ආරම්භ කරන ලදී. DevPro Guarantee Limited පිළිබඳව නිසි අවබෝධයක් ලබා දීම සඳහා ගොවි ප්‍රජාවන්ට සහ අනෙකුත් පාර්ශවකරුවන්ට, ජීවනෝපාය සඳහා එහි ක්‍රියාකාරකම් සංවර්ධන, කෘෂිකාර්මික සහ සත්ව පාලන අංශයන්ට අමතර මාධ්‍ය අවකාශයක් පුවත්පතේ සහ සඟරාවේ ලබා දිය හැකිය.

### ගොවිමිණ පුවත්පත

ගොවිජන ප්‍රජාවට උපකාර කිරීම සහ සේවය කිරීම සඳහා ගොවිමිණ පුවත්පතේ කලාප 05ක් පිටපත් 23,200ක් මුද්‍රණය කර ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික ප්‍රදේශ ආවරණය වන පරිදි ගොවීන් සහ කෘෂිකාර්මික අලෙවිකරුවන්, ගොවි සංවිධාන අතර නොමිලේ බෙදා හැරීම සිදු කරන ලදී. අතිරේකව, පුවත්පත අදාළ සියලුම අමාත්‍යාංශවලට, රාජ්‍ය ආයතනවලට, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සහ පාසල් පුස්තකාල සහ මහජනතාවට බෙදා හරිනු ලැබිය.

### ගොවිමිණ දෙමළ සඟරාව

එසේම ගොවිමිණ සඟරාවේ කලාප 3ක පිටපත් 1500ක් මුද්‍රණය කර ප්‍රධාන වශයෙන් දමිළ කතා කරන ගොවි ප්‍රජාවන් අතර බෙදා හැර ඇත. එය ගොවිජන සමාජය, ප්‍රාදේශීය සහ ග්‍රාමීය මට්ටම ඇතුළු අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන් සහ කෘෂිකර්මාන්තයේ නියුතු ගොවිජන හා ග්‍රාමීය සංවර්ධන අංශවල නිලධාරීන් වෙත දැනුම හා තාක්‍ෂණ ව්‍යාප්තිය අපේක්ෂා කරයි. තව ද, කෘෂිකාර්මික සමාජයේ කාන්තාවන් බලගැන්වීම සහ ගොවි පවුල්වල ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණ මට්ටම ඉහළ නැංවීම ආරක්ෂිත සහ පෝෂණීය ආහාර නිෂ්පාදනය කිරීම ද මාසික සඟරාවේ ද සාකච්ඡා කරනු ඇත.

**ගොවිජනතාව කෙරෙහි මුද්‍රිත මාධ්‍ය ද්විත්වයේ බලපෑම පිළිබඳ කෙටිකාලීන ඇගයීම**

ඉලක්කගත ස්ථානවල ගොවි ප්‍රජාවන් අතර ධනාත්මක බලපෑමක් ඇති කිරීමට දැනුම බෙදා හැරීමේ මෙවලම් දෙකට (ගොවිමිණ පුවත්පත සහ සඟරාව) හැකි වී තිබේ. මෙම නාලිකා දෙක හරහා බෙදාගත් තාක්ෂණය සහ නවෝත්පාදනයන් බෝග නිෂ්පාදනය සහ සත්ත්ව පාලනය වැඩිදියුණු කිරීම සඳහා ගොවි පජාවන් විසින් අනුගමනය කර තිබේ. එබැවින් ගොවිජනතාව කෙරෙහි මුද්‍රිත මාධ්‍ය ද්විත්වයේ බලපෑම පිළිබඳ කෙටිකාලීන ඇගයීම තුළින් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයට සහ ඩෙව් ප්‍රෝ ආයතනයට තම මුද්‍රිත මාධ්‍යයන්හි අන්තර්ගතයන් සහ ආකෘතිය යළි සකස් කර ගැනීම කෙරෙහි නව දැක්මක් ඒ තුළින් සපයා තිබේ.

ව්‍යාපෘති කාලය තුළ ගොවිමිණ පුවත්පත සහ ගොවිමිණ සඟරාව අනුරාධපුරය, අම්පාර, මඩකලපුව, කිලිනොච්චිය, වවුනියාව, කුරුණෑගල, බදුල්ල, මාතලේ, කෑගල්ල, ගාල්ල, මාතර, හම්බන්තොට, මොනරාගල, රත්නපුර සහ කොළඹ වැනි රටේ ප්‍රධාන කෘෂිකාර්මික දිස්ත්‍රික්කවල ගොවි ප්‍රජාව අතර විවිධ බෙදා හැරීම් නාලිකා ඔස්සේ බෙදා හරිනු ලැබුණි.

ව්‍යාපෘතිය 2023 වසරේ පෙබරවාරි-ජූනි මාස පහක කාලයක් සඳහා ක්‍රියාත්මක කරන ලද අතර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ඩෙව් ප්‍රෝ ආයතනය විසින් රුපියල් මිලියන 4.3 ක මූල්‍ය ආධාර ලබා දී ඇත.

## 05. වර්ල්ඩ් විෂන් ලංකා

### ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ දේශගුණික අවදානම් කණ්ඩායම්වල දේශගුණික අනුහුරුතාවය සහ දේශගුණික අනුහුරු ගොවිතැන් පිළිවෙත් පිළිබඳ අධ්‍යයනය

**මූල්‍ය ප්‍රභවය : වර්ල්ඩ් විෂන් ලංකා**

**පර්යේෂණ කණ්ඩායම :**

| | |
|---|---|
| **ඩබ්.ඒච්.ඒ. ශාන්ත -** | **සම්බන්ධීකරණ නිලධාරී** |
| **එම්.ඒ.සී.එස්. බණ්ඩාර -** | **සම පර්යේෂක** |
| **ජී.ජී.ද.එල්. සමරසිංහ -** | **සම පර්යේෂක** |
| **ටී.පී. මුණවීරගේ -** | **සම පර්යේෂක** |
| **එච්.ජී.සී. ජයසූරිය -** | **සම පර්යේෂක** |
| **ඩී.ටී.පී.එස්. ධර්මවර්ධන -** | **සම පර්යේෂක** |
| **ආර්.එම්.ඩී.එස්. රත්නායක -** | **සම පර්යේෂක** |

**තිරසාර සංවර්ධන ඉලක්ක අංක 2 :** කුසගින්න නිමා කිරීම, ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය වැඩිදියුණු කිරීම සහ තිරසාර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම

**ප්‍රධාන අරමුණ :** දේශගුණික විපර්යාස හමුවේ ආන්තික කණ්ඩායම්වල දුර්වලතා අවබෝධ කර ගැනීම සහ අදාළ ප්‍රජාවන් විසින් සිදු කරනු ලබන දේශගුණයට අනුවර්තනය වන ගොවිතැන් පිළිවෙත් හඳුනා ගැනීම.

**ප්‍රධාන සොයා ගැනීම් :**

1. සුරක්ෂිත පානීය ජලය සහ කෘෂිකාර්මික ජලය යන දෙකටම ප්‍රවේශ වීම සහ එම ප්‍රවේශය දේශගුණික විපර්යාස ආශ්‍රිත වැදගත්ම ප්‍රශ්නය ලෙස සලකනු ලැබූ අතර එය කාන්තා ගොවීන්ට ආදායමක් ඉපැයීමේ අවස්ථාව අහිමි වූ අතර ගෙදර දොරේ වැඩ කටයුතු සඳහා වැඩි දායකත්වයක් ලබා දීමට සිදුවිය. පිරිමි ගොවීන්ට ගොවිපළෙන් බැහැරව සහ නිවසින් බැහැර ගොවිපල නොවන ක්‍රියාකාරකම් වලට සහභාගී වීමට හැකි විය.
2. මෙම කලාපවල ගොවීන් වෙනස් වන දේශගුණික රටා, විශේෂයෙන් දේශගුණික විපර්යාස නියෝජනය කරන වර්ෂාපතනය සහ උෂ්ණත්වය යන දෙකෙහිම උච්චාවචනයන් පිළිබඳව විශාල ලෙස දැනුවත් ය. ඔවුන්ගේ සංජානනීය නිරීක්ෂණ සහ ක්ෂේත්‍රයේ අත්දැකීම් මෙම වෙනස්කම් මගින් එල්ල වන අභියෝග සාමූහිකව හඳුනා ගැනීමකි.
3. බොහෝ දුරට, ප්‍රාදේශීය ප්‍රජාවන් අඩු වියදම් අනුවර්තන පියවරයන්, දේශගුණික තොරතුරු උත්තේජනය කිරීම, දැනුවත් කිරීම සහ අනුවර්තන වැඩසටහන් සඳහා ක්‍රියාකාරීව සහභාගී වීම අතින් සාර්ථක වී ඇත. කෙසේ වෙතත්, බොහෝ ප්‍රජාව විසින් මෙහෙයවන ප්‍රයත්නයන් දිගු කාලීන තිරසාර උපාය මාර්ගවලට වඩා ක්ෂණික, කෙටි කාලීන විසඳුම් සඳහා ප්‍රමුඛත්වය දීමට නැඹුරු වේ.

**ප්‍රධාන නිර්දේශ :**

1. ප්‍රජාව විසින් මෙහෙයවන අනුවර්තන මුලපිරීම් දිරිමත් කිරීම සහ සහාය දීම. ගොවීන්ගේ අවශ්‍යතා සහ ප්‍රමුඛතා සමඟ සමපාත වන සන්දර්භ-විශේෂිත අනුවර්තන උපාය මාර්ග සංවර්ධනය කිරීම සඳහා රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන සංවිධාන සහ ප්‍රාදේශීය ප්‍රජාවන් අතර සහයෝගීතාව වර්ධනය කිරීම.අනුවර්තන පියවරයන් ක්‍රියාත්මක කිරීමේදී ගොවීන්ට සහාය වීම සඳහා මූල්‍ය යාන්ත්‍රණ සහ ආධාරක පද්ධති හඳුන්වා දීම.
2. ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්තිවල සඵලතාවය තක්සේරු කිරීම සඳහා ශක්තිමත් අධීක්ෂණ සහ ඇගයීම් රාමුවක් ස්ථාපිත කිරීම. නිත්‍ය තක්සේරු කිරීම් මගින් ප්‍රතිපත්ති සම්පාදකයින්ට තත්‍ය කාලීන ප්‍රතිපෝෂණ සහ විකාශනය වන දේශගුණික තත්ත්වයන් මත පදනම්ව උපාය මාර්ග වැඩිදියුණු කිරීමට හැකි වේ.
3. යහ භාවිතයන්, තාක්ෂණයන් සහ මූල්‍ය සම්පත් බෙදා ගැනීමට ජාත්‍යන්තර සහයෝගීතාවයේ නිරත වීම. දේශගුණික විපර්යාසය යනු ගෝලීය අභියෝගයක් වන අතර අනෙකුත් ජාතීන් සමඟ සහයෝගීතාවයෙන් අනුවර්තනය වීමේ ප්‍රයත්නවල සඵලතාවය වැඩි දියුණු කළ හැකිය.

# 03 වැනි පරිච්ඡේදය

## වාර්ෂික මූල්‍ය කාර්යසාධනය

### 3.1. අවසන් ගිනුම්

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය — රු.

| වත්කම් | සටහන් | 2023 | 2022 |
|---|---|---|---|
| ජංගම වත්කම් | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 2 | 45,903,450 | 23,265,388 |
| ලැබිය යුතු-ණයගැතියෝ | 3 | 28,064,472 | 32,886,372 |
| ලැබිය යුතු - හැන්පත් | 4 | 764,370 | 763,070 |
| අවසන් තොග | 5 | 7,568,596 | 6,464,913 |
| ඉදිරි ගෙවීම් | 6 | 24,654 | 26,613 |
| අනෙකුත් ජංගම වත්කම් | 7 | 17,126 | 10,212 |
| | | **82,342,668** | **63,416,567** |
| ජංගම නොවන වත්කම් | | | |
| අනෙකුත් මූල්‍ය වත්කම් | 8 | 4,630,965 | 4,485,371 |
| යටිතල පහසුකම්, පිරියත හා උපකරණ | 9 | 15,686,367 | 13,517,556 |
| ඉඩම් හා ගොඩනැගිලි | 10 | 32,826,222 | 34,179,749 |
| | | **53,143,554** | **52,182,676** |
| මුළු වත්කම් | | **135,486,222** | **115,599,243** |
| වගකීම් | | | |
| ජංගම වගකීම් | | | |
| ගෙවිය යුතු දෑ | 11 | **28,959,096** | **24,244,463** |
| | | **28,959,096** | **24,244,463** |
| ජංගම නොවන වගකීම් | | | |
| සේවක ප්‍රතිලාභ | 12 | 55,008,475 | 58,189,008 |
| | | **55,008,475** | **58,189,008** |
| මුළු වගකීම් | | **83,967,571** | **82,433,470** |
| ශුද්ධ වත්කම් | | **51,518,651** | **33,165,772** |
| ශුද්ධ වත්කම් හා හිමිකම් | | | |
| රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන | 13 | 28,908,768 | 31,195,361 |
| මාලින්ද සෙනෙවිරත්න මහතාගෙන් ලැබුණු ප්‍රදාන | | 445,200 | 593,600 |
| ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලැබුණු ප්‍රදාන | | 526,500 | |
| සංචිත | 14 | 5,619,846 | 3,376,907 |
| ප්‍රත්‍යාගණිත සංචිත | | 26,450 | 26,450 |
| දිරි දීමනා හා පුහුණු අරමුදල | 15 | - | 8,611 |
| ප්‍රාග්ධන ප්‍රදාන - බාහිර ආයතන අරමුදල් යෙදූ ව්‍යාපෘති | | 1,497,645 | 498,853 |
| සමුච්චිත අතිරික්තය/ (ඌනතාවය) | 17 | 14,494,242 | (2,534,011) |
| | | | |
| මුළු වත්කම්/ හිමිකම් | | **51,518,651** | **33,165,772** |

පිටු අංක 5 සිට 8 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 9 සිට 16 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවලට අදාල වේ. රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අවශ්‍යතාවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇති බව සහතික කරමි.

..........................

කුමාරි වෙදගේ

ගණකාධිකාරිණී

දිනය ..........................

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වගකීමකි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශ අනුමත කර ඇති අතර ඔවුන් වෙනුවෙන් අත්සන් තබා ඇත.

..........................  ..........................

සභාපති  පාලක මණ්ඩල සාමාජික

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය

රුපියල්

| ආදායම් | සටහන් | 2023 | 2022 |
|---|---|---|---|
| මහා භාණ්ඩාගාරයෙන් ලද අරමුදල් | | 162,227,000 | 188,000,000 |
| පර්යේෂණ හා පුහුණු කිරීම් සඳහා බාහිර ආයතනවලින් ලද අරමුදල් | | 58,065,331 | 41,409,992 |
| පර්යේෂණ හා පුහුණු ක්‍රියාකාරකම් සඳහා හිමි වූ ප්‍රාග්ධන ප්‍රදාන | | 15,990,000 | 12,827,890 |
| අනෙකුත් ආදායම් | 17 | 50,326,537 | 23,809,386 |
| බොල් ණය අඩි වෙන් කිරීම් | | 782,510 | |
| මුළු ආදායම් | | **287,391,378** | **266,047,267** |
| වියදම් | | | |
| වැටුප් වේතන හා සේවක ප්‍රතිලාභ | 18 | (144,467,293) | (162,775,856) |
| පර්යේෂණ හා පුහුණු ක්‍රියාකාරකම් | 20 | (19,645,376) | (12,827,890) |
| පර්යේෂණ හා පුහුණු ක්‍රියාකාරකම් සඳහා බාහිර පාර්ශවයන්ට සිදු කළ | 21 | (58,065,331) | (41,409,992) |
| ක්ෂයවීම් | 9, 10 | (5,655,619) | (4,787,504) |
| වෙනත් වියදම් | 19 | (43,275,695) | (38,563,389) |
| බොල් ණය ඌන වෙන් කිරීම් | | | (180,265) |
| බැංකු ගාස්තු | | (153,705) | (110,750) |
| මුළු වියදම් | | **(271,263,019)** | **(260,655,645)** |
| අදාළ කාලය සඳහා අතිරික්තය/ හිඟය | | **16,128,359** | **5,391,622** |

..........................
ගණකාධිකාරිනී

..........................
අධ්‍යක්ෂ

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| 2,022 | | සටහන් | 2023 | |
|---|---|---|---|---|
| | මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහය | | | |
| 5,391,622 | වර්ෂය සඳහා ශුද්ධ හිඟය/ අතිරික්තය | | | 16,128,359 |
| | ගැලපීම් | | | |
| 4,787,504 | ක්ෂය වීම් | | 5,647,929 | |
| (4,787,504) | ක්‍රමක්ෂය | | **(5,647,929)** | |
| 5,066,363 | පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | | 4,377,657 | |
| (1,297,991) | ආයෝජන ආදායම් | | (1,343,155) | |
| 279,789 | පෙර වර්ෂයේ ගැලපීම් | | 899,895 | |
| | බොල් ණය සඳහා වෙන් කිරීම් | | (782,510) | |
| 16,333 | අබලි ද්‍රව්‍ය විකිණීමෙන් ලද ලාභය/ පාඩුව | | - | |
| | | | | 3,151,887 |
| **9,456,116** | | | | **19,280,246** |
| | කාරක ප්‍රාග්ධන වෙනස්කම් | | | |
| 1,273,997 | ණයගැතියෝ | | 4,820,600 | |
| 75,600 | අවසන් තොග | | (1,103,683) | |
| (26,613) | ඉදිරි ගෙවීම් | | 1,959 | |
| 534,556 | අනෙකුත් ජංගම වත්කම් | | (6,914) | |
| 4,562,809 | ගෙවිය යුතු දෑ | | 4,714,633 | 8,426,595 |
| **15,876,464** | මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ මුදල් ප්‍රවාහය | | | **27,706,841** |
| **(8,073,475)** | පාරිතෝෂික ගෙවීම් | | | (7,558,190) |
| **7,802,989** | මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | | **20,148,651** |
| | ආයෝජන ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහය | | | |
| (191,087) | අනෙකුත් මූල්‍ය වත්කම් | | (145,594) | |
| (2,107,135) | දේපළ, පිරියත හා උපකරණ | | (4,594,039) | |
| 1,297,991 | ආයෝජන ආදායම් | | 1,343,155 | |
| 1,196 | නැති වූ පුස්තකාල පොත් සඳහා පිරිවැය අය කර ගැනීම | | - | |
| **(999,036)** | ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | | **(3,396,478)** |
| | මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ මුදල් ප්‍රවාහය | | | |
| 14,000,000 | රජයේ ප්‍රදාන- ප්‍රාග්ධන ලැබීම් | | 18,334,000 | |
| 1,321,100 | ස්ථාවර වත්කම් සඳහා බාහිර ව්‍යාපෘතිවලින් ලද ප්‍රාග්ධන ප්‍රදානය | | 2,767,990 | |
| (12,827,890) | පර්යේෂණ හා පුහුණු ක්‍රියාකාරකම් සඳහා හිමි වූ ප්‍රාග්ධන ප්‍රදාන | | (15,990,000) | |
| | බොල් ණය වෙන් කිරීම් | | 782,510 | |
| (16,333) | අබලි ද්‍රව්‍ය අලෙවිය | | - | |
| | | | - | |
| - | දිවිදිමනා අරමුදල-ආයතනයේ දායකත්වය 10% | | (8,611) | |
| **2,476,877** | මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | | **5,885,889** |
| 9,280,831 | මුදල් හා මුදල් සමාන අයිතමයන්ගේ ශුද්ධ වැඩිවීම | | | 22,638,062 |
| 13,984,557 | වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන අයිතමයන් | I | | 23,265,388 |
| **23,265,388** | වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල් සමාන අයිතමයන් | II | | **45,903,450** |
| | සටහන්: | | | |
| | මුදල් හා මුදල් සමාන අයිතමයන් | | 1 | 11 |
| | | | **01.01.2023** | **31.12.2023** |
| 23,245,388 | බැංකු ශේෂය | | 23,245,388 | 45,875,260 |
| 20,000 | අතැති මුදල් | | 20,000 | 28,190 |
| **23,265,388** | එකතුව | | **23,265,388** | **45,903,450** |

හෙක්ටර් කොබ්බැකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා
ශුද්ධ වත්කම්/වගකීම් වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය

රු.

| | රජයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන | සංචිත | මාලින්ද මහතාගෙන් ලද ප්‍රදාන | ප්‍රාග්ධන ප්‍රදාන ජනාධිපති ලේකම් කාර්යාලය | අරමුදල් ව්‍යාපෘති තුළින් ලද ප්‍රාග්ධන ප්‍රදාන | ප්‍රත්‍යාගණිත සංචිත | දිරි දීමනා සහ පුහුණු අරමුදල | සමුච්චිත අතිරික්තය/(හිඟය) | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2023 ජනවාරි 01 දිනට ශේෂය | 31,195,361 | 3,376,907 | 593,600 | | 498,853 | 26,450 | 8,611 | (2,534,011) | 33,165,771 |
| ලැබුණු ප්‍රදාන/වත්කම් | | 2,682,177 | | 585,000 | 1,369,990 | | | | 4,637,167 |
| භාණ්ඩාගාරයෙන් ලද අරමුදල් | 18,334,000 | | | | | | | | 18,334,000 |
| වර්ෂය ස□දහා ක්‍රමක්ෂය | (4,630,593) | (439,238) | (148,400) | (58,500) | (371,198) | | | | (5,647,929) |
| ගෙවිය යුතු දිරි දීමනා | | | | | | | (8,611) | | (8,611) |
| බාහිර අරමුදල් ව්‍යාපෘති ආයතන දායකත්වය 40% | | - | | | | | | | - |
| පර්යේෂණ සහ පුහුණු ක්‍රියාකාරකම් සඳහා ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන | (15,990,000) | | | | | | | | (15,990,000) |
| පෙර වසරේ ශේෂය මාරු කිරීම් | | | | | | | | | - |
| පෙර වර්ෂයට ගැලපීම් | | | | | | | | 899,895 | 899,895 |
| ආදායම් සහ වියදම් | | | | | | | | 16,128,359 | 16,128,359 |
| 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය | 28,908,768 | 5,619,846 | 445,200 | 526,500 | 1,497,645 | 26,450 | - | 14,494,243 | 51,518,652 |

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

1. ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1 පොදු

පොදුවේ පිළිගත් ගණකාධිකරණ මූලධර්ම හා පිළිවෙත්වලට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුතු නිකුතු ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධානයන්ට අදාළව ඓතිහාසික පිරිවැය මත මූල්‍ය ප්‍රකාශ පිළියෙල කොට ඇත. මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි උද්ධමන සාධක සඳහා ගැලපීම් සිදු කර නැත. උපචිත පදනම මත ගණකාධිකරණ මූලධර්ම නිරන්තරයෙන් භාවිතා කර තිබේ.

1.2 සන්සන්දනාත්මක තොරතුරු

පසුගිය වසරේ උපයෝගී කර ගනු ලැබූ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුව මෙම වසරේ ද එම ප්‍රතිපත්තීන් යොදාගෙන ඇත. අවශ්‍ය සෑම අවස්ථාවකදීම පවත්නා වර්ෂයේ ඉදිරිපත් කිරීම තහවුරු කිරීම සඳහා පසුගිය වර්ෂයේ අගයන් නැවත සකසා ඉදිරිපත් කර ඇත.

1.3 ආයතනයට ඉදිරි අනාගත කාලයක් පුරා මෙහෙයුම් ඉතා හොඳින් සිදු කිරීමට ප්‍රමාණවත් සම්පත් තිබේ. එබැවින් එම ආයතන මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දී ආයතනය දිර්ඝ කාලයක් පවතී යන සංකල්පය මත ගිණුම් තබනු ලබයි.

1.4 ශේෂ පත් දිනයට පසුව හටගන්නා සිද්ධි

ශේෂ පත්‍ර දිනෙන් පසු හට ගන්නා ප්‍රමාණවත් සිද්ධීන් සම්බන්ධයෙන් මූල්‍ය වාර්තාවල අදාළ හෙළිදරව් හා ගැලපීම් සිදු කර ඇත.

1.5 වත්කම් තක්සේරු

(i) දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීමට හෝ ඉදිකිරීමට වැය වූ වියදම එහි පිරිවැය ලෙස සැලකේ. ආයතනයේ පැවැත්මට හෝ ආයතනයේ ධාරිතාවය වැඩි කිරීමට යම් වත්කමක් මිල දී ගැනීමක් හෝ පවතින වත්කමක් වැඩි දියුණු කිරීමට යම් වියදමක් දරන්නේ නම් එම වියදම ප්‍රාග්ධන වියදමක් ලෙස සැලකේ. අලුත්වැඩියා හා නඩත්තු පිරිවැය පුනරාවර්තන වියදමක් ලෙස සැලකේ. දේපළ, පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේ දී පිරිවැයෙන් හෝ ප්‍රත්‍යාගණන අගයෙන් සමුච්චිත ක්ෂය අඩු කර ඉදිරිපත් කරනු ලබන අතර එය පහත පරිදි වේ.

a) පහත සඳහන් වාර්ෂික ක්ෂය අනුපාත යටතේ සරල මාර්ග ක්‍රමයට ක්ෂය කර තිබේ.

| | |
|---|---|
| ගොඩනැගිලි | වාර්ෂික 2 ½ % |
| උපකරණ/ගෘහභාණ්ඩ | වාර්ෂික 10% |
| පරිගණක | වාර්ෂික 20% |
| සුභසාධක උපකරණ | වාර්ෂික 10% |
| පොත් | වාර්ෂික 10% |
| වාහන | වාර්ෂික 20% |

මිල දී ගත් වර්ෂයේ දී සමස්ත වර්ෂයටම ක්ෂය කරනු ලැබේ.

a) ක්‍රමක්ෂය වටිනාකම හඳුනාගැනීම හා ගිණුම් තැබීම ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක LKAS-20 විකල්ප ක්‍රමය අනුව සිදු කර ඇත.

**b) පැල්වෙහෙර නිල නිවාසය**

පැල්වෙහෙර බංගලාව 2019.11.01 වන විට දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත මාරු කර යවා ඇති අතර එහි භූවමාරු වටිනාකම රුපියල් 1,962545.66 ක් විය.

**1.6 ණයගැතියෝ**

**i) ශිෂ්‍යත්වලාභී ණයගැතියෝ**

වර්තමානයේ විදේශ ශිෂ්‍යත්වලාභී ණයගැතියන් හය දෙනෙකුගේ ශේෂයන් පවතී. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 (SLIPSAS 08) අනුව අවදානම හා අවිනිශ්චිතතාව සැලකිල්ලට ගනිමින් අඩමාන ණය වෙන් කිරීමේ ප්‍රතිශතය මෙම වර්ෂයේ දී තීරණය කර ඇත.

**ii) අනෙකුත් ණයගැතියෝ**

උපලබ්ධි වේ යැයි අපේක්ෂිත අගය ණයගැති වටිනාකම ලෙස සඳහන් කර ඇත. බොල් සහ අඩමාන ණය වෙනුවෙන් ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන්කර ඇත. එය පහත පරිදි වේ.

1. අවුරුදු 5ට වැඩි ණයගැති ශේෂය මත - 100%
2. අවුරුදු 1 වැඩි අවුරුදු 05 අඩු ණයැති ශේෂය මත - 5%

**III) ගිණුම්ගත නොකළ නේවාසිකාගාර ආදායම**

වාර්තාගත නොකළ නේවාසිකාගාර ආදායම රු.8,895,470/- වන අතර මෙම වටිනාකම 2015 මැයි මස සිට 2018 ජූලි මස දක්වා නේවාසිකාගාර ක්‍රියාකාරකම්වලින් ජනනය වී ඇත. මෙම වටිනාකම හඳුනාගැනීම අධ්‍යක්ෂවරයා විසින් පත් කළ විශේෂ කමිටුවක් මඟින් සිදු කර ඇත. මෙම මුදල ගිණුම්ගත කර නැති අතර එම තීරණය පාලක මණ්ඩලය විසින් ගෙන ඇත.

6

IV) දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලැබිය යුතු

මෙම මුදලට පැල්වෙහෙර බංගලාවේ පැවරුම් වටිනාකම ඇතුළත් වූ අතර, බංගලාවේ නියමිත කුලියට ගත් මුදල මත සම්පූර්ණ මාරු වටිනාකම පියවා නොතිබුණි.

1.7 තොගය

පාරිභෝජන තොගය පිරිවැය මත අගය කොට ඇත. අනෙකුත් තොගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මත අගය කර ඇත. තොගයෙහි පිරිවැය ගණනයේ දී පළමු ලැබීම් පළමු නිකුතු FIFO ක්‍රමය යොදා ගනී.

1.8 ආයෝජන

ස්ථාවර තැන්පතු එම බැංකුවලම නැවත ආයෝජනය කර ඇත.

1.9 වගකීම් හා වෙන් කිරීම්

1.9.1 පාරිතෝෂික

1983 අංක 12 දරන පාරිතෝෂික පනතට අනුව පාරිතෝෂික ගෙවීම් සඳහා වෙන් කිරීම් සිදු කොට ඇත.

2023 වර්ෂයේ පාරිතෝෂිකය 2023.12.31 දිනට මූලික වැටුප සහ ජීවන වියදම් දීමනාව පදනම් කරගෙන සකස් කර ඇත.

1.9.2 *අසම්භාව්‍ය බැරකම්*

තීන්දු ලැබීමට නියමිත නඩු සඳහා අසම්භාව්‍ය බැරකම් වෙන් කර ඇත.

1.9.3 *අසම්භාව්‍ය වත්කම්*

ශිෂ්‍යත්වලාභී ණයගැතියන්ගෙන් අයකර ගැනීම සඳහා තීන්දු ලැබීමට නියමිත නඩු මත අසම්භාව්‍ය වත්කම් අගය සැකසී ඇත. එම තොරතුරු පහත පරිදි වේ.

පී.ඩී.ජේ.ආනන්ද මහතා

ලබා දී ඇති ලිපිනයෙහි නොමැති වීම හේතුවෙන් උසාවි නඩුවක් පවරා ඇත. ඇපකරුවන්ගෙන් රු. *1,250,000.00*ක් අය කරගෙන ඇතත් ඉතිරි මුදල වන රු. *2,759,754.28*ක් පී.ඩී.ජේ.ආනන්ද මහතාගෙන් අයකර ගැනීමට නියමිතය.

7

*එම්.එස් ගෞරි ශංකර් මහතා*

***එන්තරවාසි යැවීම සඳහා ඔහුගේ ලිපිනය සොයා ගත නොහැකි වී ඇත. කෙසේ නමුත් ඇපකරුවන් මේ වනවිට රු.1,250,000.00 ක් ගෙවා ඇත. රු.3,634,110.07ක ශේෂය එම්.එස් ගෞරි ශංකර් මහතාගෙන් අයකර ගත යුතුව ඇත.***

*ආචාර්ය ගාමිණී වික්‍රමසිංහ මහතා*

*ඔහු දෙවරක් අභියාචනා ඉදිරිපත් කර ඇත. නමුත් ආයතනයට වාසිදායක ලෙස නඩු තීන්දු ඉදිරිපත් කර තිබේ. ඊට ආඥාවක් ලබා ගැනීම සඳහා නීතිපති වෙත ලිපියක් යොමු කර ඇත. පිස්කල් ක්‍රියාමාර්ග සඳහා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් සිටී.* ඔහු 2021 දී රුපියල් 140,000.00 ක් තැන්පත් කර ඇති නමුත් මෙම තැන්පතුව හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් අනවසර තැන්පතුවක් ලෙස සඳහන් කර ඇත.

*ආර්.අතුකෝරල මිය*

*ආර්. අතුකෝරල මහත්මියගේ ඇප බැඳුම්කරයේ වටිනාකම රු2,181,521/-ක් වේ. ඇපකරුවන් විසින් රු. 1,250,000/- මේ වන විට ගෙවා ඇත. ඇයගෙන් අයකර ගැනීමට පවතින ශේෂය රු.931,521/- ක් වන අතර එය අයකර ගැනීමට නොහැකි වී ඇත. ඇයට එන්තරවාසි යැවීම සඳහා ලිපිනය සොයාගැනීමට නොහැකි වී ඇත.*

*පී.ඩී.ආර් කුමාරසිරි මහතා*

*පී.ඩී.ආර්.කුමාරසිරි මහතාගේ බැඳුම්කරයේ වටිනාකම වූ රු.332,868.56* මුදලින් එක් ඇපකරුවෙකු විසින් රු.166,433.49 ගෙවන ලදී. අනෙක් ඇපකරු වෙත 166,433.44 ක මුදලක් අයකර ගැනීමට ඇත.

*ඒ.සී.කේ සේපාල මිය*

*ඒ.සී.කේ සේපාල මහත්මියගේ ඇප බැඳුම්කර වටිනාකම රු.1,249,641.11ක් වේ. උසාවියේ තීන්දුව අනුව රු.1,200,000 ක් ඇයගෙන් අයවිය යුතුය. ඇය රු. මේ දක්වා 900,000.00/- ගෙවා ඇත.*

### 1.9.4 අනිවාර්ය දායකත්ව සැලසුම

සේවකයින්ගේ මාසික වැටුපෙන් පිළිවෙළින් 15% සහ 3% බැගින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට ආයතනය විසින් දායකත්වය දරනු ලබයි. මෙම දායකත්වයන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ.

8

## 2.0 මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය කාර්යසාධනය පහත ගැළපීම් සිදු කිරීමෙන් පසු ගණනය කොට ඇත.

a. බොල් හා අඩමාන ණය සහ වෙන් කිරීම් සිදු කිරීම සහ ආයතනයේ එදිනෙදා මෙහෙයුම් වෙනුවෙන් වන අනාගත අසම්භාව්‍යයන් වෙනුවෙන් වෙන් කිරීම් සිදු කර තිබේ. ආයතනයේ දේපොළ, පිරියත සහ උපකරණ එලදායී ලෙස නඩත්තු කෙරෙයි.

b. ආදායම් යන්නට ඇතුළත් වන්නේ රජයේ භාණ්ඩාගාරයෙන් ලද අරමුදල්, නේවාසිකාගාර ආදායම්, ශ්‍රවණාගාර ආදායම් සහ අනෙකුත් ආදායම්ය.

## 2.1 ප්‍රවාහන හා මුද්‍රණ වියදම්

පර්යේෂණ හා පුහුණු අංශ ද ඇතුළුව සියලුම අංශ සඳහා ප්‍රවාහන හා මුද්‍රණ වියදම් ගිණුම්ගත කිරීමට සිදු වේ. එබැවින් එම වියදම් අනුමත අනුපාතයකට ගණනය කොටඑම වියදම එකී අදාළ වියදම් අතර ප්‍රතිශතයකට ගළපා ඇත.

අරමුදල් සපයන ව්‍යාපෘති සඳහා විශේෂ මිලකට ප්‍රවාහන පහසුකම් සපයා ඇත. අරමුදල් සපයන ව්‍යාපෘති සඳහා සැපයූ  ප්‍රවාහන පහසුකම් වෙන වෙනම ගණනය කර ඇති අතර එම මුදල අනෙකුත් ආදායම යටතේ අනාවරණය කර ඇත.

## 2.2 පර්යේෂණ හා පුහුණු කිරීමේ ක්‍රියාකාරකම් සඳහා ප්‍රාග්ධන ලැබීම.

**පර්යේෂණ හා පුහුණු කිරීමේ ක්‍රියාකාරකම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් වෙන්කළ ප්‍රතිපාදන ප්‍රාග්ධන ප්‍රදාන ශීර්ෂය යටතේ ලබා දී ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 38** (LKAS - 38) අනුව පර්යේෂණ පිරිවැය අස්පෘෂ්‍ය වත්කමක් ලෙස සැලකිය හැකිය. නමුත් අප ආයතනයේ පර්යේෂණ පිරිවැය අස්පෘෂ්‍ය වත්කමක් ලෙස සැලකිය නොහැකිය. මන්ද යත් අප ආයතනයේ පර්යේෂණවල අවසාන නිමැවුම ගිණුම්කරණ ප්‍රමිතියේ සඳහන් කර ඇති අවශ්‍යතා සම්පූර්ණ නොකරන බැවිනි. එම නිසා මෙම පර්යේෂණ හා පුහුණු මුළු පිරිවැය මූල්‍ය තත්ත්ව වාර්තාව භර කරමින් එම වියදම පුනරාවර්තන වියදමක් ලෙස සලකනු ලබයි. මෙම ක්‍රියාකාරකම් සඳහා ලද ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකම ද මූල්‍ය තත්ත්ව වාර්තාවෙහි ආදායමක් ලෙස සටහන් කර මෙම වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කර ඇත.

9

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
2023 දෙසැම්බර් 31න් අවසන් වන වර්ෂය සඳහා සටහන්

LKR

2 මුදල් හා මුදල් සමාන අයිතමයන්

| | 2023 | 2022 |
|---|---|---|
| අතැති මුදල් | 28,190 | 20,000 |
| බැංකුවේ ඇති මුදල් - ගිණුම් අංක 2323292 | 41,208,178 | 14,521,834 |
| බැංකුවේ ඇති මුදල් - ගිණුම් අංක 2323293 | 1,133,289 | 5,814,146 |
| බැංකුවේ ඇති මුදල් - ගිණුම් අංක 2323315 | 2,298,960 | 807,905 |
| බැංකුවේ ඇති මුදල් - ගිණුම් අංක 2323317 | 1,234,833 | 2,101,504 |
| | **45,903,450** | **23,265,389** |

3 ලැබිය යුතු මුදල්

කාර්යමණ්ඩල ණයගැතියෝ

| | | |
|---|---|---|
| නිවාස ණය | 143,257 | 177,144 |
| ඒකාබද්ධ ණය | 20,155,566 | 21,495,623 |
| උත්සව අත්තිකාරම් | - | 2,500 |
| ලැබිය යුතු ශ්‍රවණාගාර ආදායම් | 529,600 | 35,875 |
| ලැබිය යුතු නේවාසිකාගාර ආදායම් | 833,114 | 100,114 |
| ශිෂ්‍යත්වලාභී ණයගැතියෝ | 17,965,464 | 18,131,898 |
| | **36,627,001** | **39,943,154** |
| වෙනත් ණයගැතියෝ | | |
| ලැබිය යුතු ආයෝජන ආදායම් | 39,446 | 105,758 |
| ඉවත් වූ සේවකයන්ගෙන් අය කර ගත යුතු | 340,151 | 610,106 |
| වෛද්‍ය රක්ෂණයෙන් අයකර ගත යුතු | - | 2,500 |
| ණයගැති - මොබිටෙල් (පුද්) ආයතනය | 125,928 | 400,659 |
| R-582 ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වල දේශගුණයට අනුවර්තනය වූ ගොවිතැන් පිළිවෙත් සහ දේශගුණික අනුභූරුතාව | - | 2,134,678 |
| පරිපාලන අංශයෙන් අයවිය යුතු | 14,234 | 14,234 |
| රශ්මිනි මියගෙන් අයවිය යුතු | 70,725 | |
| ලැබිය යුතු ගොවිමිණ ආදායම | | 50,000 |
| මෙට්‍රොපොලිටන් (පුද්) සමාගමෙන් අයකර ගත යුතු | 70 | 70 |
| රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු | 44,800 | 44,800 |
| සැපයුම් ලියාපදිංචිකිරීම - හඳුනා නොගත් | | 85,000 |
| දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 1,962,546 | 1,962,546 |
| R 585 ලෝක ආහාර වැඩසටහන - ශ්‍රී ලංකාවේ ගෘහස්ථ ආහාර සුරක්ෂිතතාවයට ආහාර මිල ඉහළ යාමේ බලපෑම් පිළිබඳ අධ්‍යයනය | 103,534 | 592,010 |
| T 452 - වැඩමුළු සංවිධානය කිරීම<br>පුහුණු ද්‍රව්‍ය සහ මෙවලම් වැඩිදියුණු කිරීම සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම | | 1,981,655 |
| T 453 | | 5,676 |
| | **2,701,434** | **7,989,691** |
| | | |
| | **42,328,435** | **47,932,845** |
| අඩු කළා | | |
| බොල් සහ අඩමාන ණය සඳහා වෙන් කිරීම් | (232,017.85) | (848,094) |
| ශිෂ්‍යත්වලාභීන් සඳහා වෙන් කිරීම | (14,031,945.88) | (14,198,379) |
| | **28,064,471** | **32,886,372** |

4 ලැබිය යුතු

තැන්පතු

| | | |
|---|---|---|
| ස්ථාවර තැන්පතු - භෝජනාගාර භාරකරු | 70,000 | 70,000 |
| විවිධ - ශ්‍රී ලංකා ටෙලිකොම් (අන්තර්ජාල පහසුකම්) | 3,125 | 3,125 |
| විවිධ- තැපැල්පති | 24,945 | 24,945 |
| විවිධ- කොළඹ ගෑස් සහ ජල සමාගම | 4,750 | 4,750 |
| විවිධ- ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 500 | 500 |
| විවිධ-සී/ස සෙල්ටෙල් ලංකා සමාගම | 3,500 | 3,500 |
| විවිධ- ලංකා විදුලිබල මණ්ඩලය | 407,550 | 406,250 |
| විවිධ- ඉන්ධන තැන්පතු | 250,000 | 250,000 |
| | **764,370** | **763,070** |

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා සටහන්

LKR

| 5 | තොගය | 2023 | 2022 |
|---|---|---|---|
| | ප්‍රකාශන සහ සඟරා | 2,971,457 | 3,015,309 |
| | පරිභෝජන භාණ්ඩ | 2,888,667 | 1,999,294 |
| | පොත් අලෙවිසැල | 1,708,473 | 1,450,309 |
| | | 7,568,596 | 6,464,913 |

| 6 | පූර්ව ගෙවීම් | | |
|---|---|---|---|
| | ගොඩනැගිලි රක්ෂණය | 24,654 | 26,613 |
| | | 24,654 | 26,613 |

| 7 | අනෙකුත් ජංගම වත්කම් | | |
|---|---|---|---|
| | මිල දී ගැනීම් අත්තිකාරම් | 17,126 | 10,212 |
| | | 17,126 | 10,212 |

| 8 | අනෙකුත් මූල්‍ය වත්කම් | | |
|---|---|---|---|
| | ඇමතුම් තැන්පතු | 1,500 | 1,500 |
| | ස්ථාවර තැන්පතු - රා.උ.ආ.බැංකුව | 1,500,000 | 1,500,000 |
| | ස්ථාවර තැන්පතු | 3,129,465 | 2,983,871 |
| | අනෙකුත් මූල්‍ය වත්කම් | 4,630,965 | 4,485,371 |

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සටහන්

9 ගොඩනැගිලි, පිරියත හා උපකරණ

වත්කම් ක්ෂයවීම පිළිබඳ ප්‍රකාශය - 2023 දෙසැම්බර් 31

රුපියල්

| අයිතම | 01.01.2023 දිනට පිරිවැය රු. | 2023 වර්ෂය තුළ මිල දී ගැනීම්/ අපහරණය | 31.12.2023 දිනට සමස්ත පිරිවැය | 2023.01.01 දිනට සමුච්චිත ක්ෂය | 2023 වර්ෂයට සමුච්චිත ක්ෂය | 31.12.2023 න් අවසන් දිනට සමුච්චිත ක්ෂය | 31.12.2023 දිනට ශුද්ධ වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| උපකරණ/ ලී බඩු | 61,777,195 | 1,433,865 | 63,211,060 | 53,250,241 | 2,115,421.99 | 55,365,663 | 7,845,397 |
| පරිගණක සවිකිරීම | 34,413,534 | 5,050,990 | 39,464,523 | 31,177,825 | 1,689,614.59 | 32,867,439 | 6,597,084 |
| මෝටර් රථවාහන | 71,888,647 | - | 71,888,647 | 71,844,594 | 44,052.50 | 71,888,646 | 1 |
| පොත් | 16,589,966 | 39,885 | 16,629,851 | 14,879,127 | 506,838.66 | 15,385,966 | 1,243,885 |
| සුළු සාධන උපකරණ | 3,735 | (0) | 3,735 | 3,734 | - | 3,734 | 1 |
| **එකතුව** | **184,673,076** | **6,524,739** | **191,197,815** | **171,155,519** | **4,355,927.74** | **175,511,447** | **15,686,368** |

11

10 ඉඩම් හා ගොඩනැගිලි

වත්කම් ක්ෂයවීම පිළිබඳ ප්‍රකාශය - 2023 දෙසැම්බර් 31

| අයිතම | 01.01.2023 දිනට පිරිවැය රු. | 2023 වර්ෂය තුළ මිල දී ගැනීම්/ අපහරණය | 31.12.2023 දිනට සමස්ත පිරිවැය | 2023.01.01 දිනට සමුච්චිත ක්ෂය | 2023 වර්ෂයට සමුච්චිත ක්ෂය | 31.12.2023 න් අවසන් දිනට සමුච්චිත ක්ෂය | 31.12.2023 දිනට ශුද්ධ වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| ඉඩම් | 1,857,387 | | 1,857,387 | | - | - | 1,857,387 |
| ගොඩනැගිලි | 56,330,265 | (61,526) | 56,268,739 | 24,015,592 | 1,299,692 | 22,715,900 | - |
| (ගැලපුම්) | | | - | (7,691) | (7,691) | - | |
| ගොඩනැගිලි | **56,330,265** | **(61,526)** | **56,268,739** | **24,007,902** | **1,292,001** | **25,299,903** | **30,968,836** |
| | **58,187,652** | **(61,526)** | **58,126,126** | **24,015,592** | **1,292,001** | **25,299,903** | **32,826,222** |

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ සටහන්

LKR

| | ණයහිමියෝ | 2023 | 2022 |
|---|---|---|---|
| 11 | උපචිත වියදම් | 8,113,188 | 8,751,980 |
| | ගෙවිය යුතු පර්යේෂණ හා පුහුණු වියදම් | 1,819,666 | 2,876,942 |
| | ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු | 183,462 | 130,462 |
| | ආපසු ගෙවිය යුතු භෝජනාගාර තැන්පතු- උපනිශ්ශ පරණමිත | 50,000 | 50,000 |
| | නොගෙවූ වියදම් | 35,774 | 11,826 |
| | ඉවත් වූ සේවකයන් සඳහා ගෙවිය යුතු මුදල් | 690,551 | 688,051 |
| | ගෙවිය යුතු මුද්දර ගාස්තු | 14,350 | 16,700 |
| | රැඳවා ගත් මුදල | 136,526 | 136,526 |
| | ණයහිමියෝ | 1,369,904 | 429,124 |
| | සුබසාධක සංගමය | - | 2 |
| | ගෙවිය යුතු පාරිතෝෂික මුදල් | 126,913 | 126,913 |
| | අමාත්‍යාංශයට ගෙවිය යුතු | 1,550 | 94,358 |
| | කළමනාකරණ සංවර්ධන ආයතන | 8,000 | 8,000 |
| | විශේෂ අත්තිකාරම් | 1,600 | |
| | දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවිය යුතු | 1,000,000 | 1,000,000 |
| | භාරයකාර මහතාට ගෙවිය යුතු | 10,800 | 10,800 |
| | ගෙවිය යුතු - කුඩා වතු හිමියන් සඳහා වූ කෘෂි ව්‍යාපාර හවුල්කාරීත්ව වැඩසටහන. | | 38,550 |
| | අනවසර තැන්පතු | 430,000 | 330,000 |
| | ගෙවිය යුතු වෛද්‍ය රක්ෂණය | - | 53,900 |
| | සේවක අංක 828 සමන්මලී පොදු සේවක සංගමය | 9,500 | |
| | 2022 ගෙවිය යුතු දිරි දීමනා | 117,115 | |
| | ගෙවිය යුතු මුදල් - විලයන්ස් PLC | 2,000 | |
| | ගෙවිය යුතු බැංකු ණය සහ ඉතිරි කිරීම | 0 | |
| | ගෙවිය යුතු වෘත්තීය සමිති | - | |
| | P G D L W සමරසිංහ මහත්මියට ගෙවිය යුතු | 4,991 | |
| | H චන්ද්‍රිකා මියට ගෙවිය යුතු | 4,991 | |
| | විජේකෝන්ට ගෙවිය යුතු | 1,814 | |
| | වාර්තා ලිවීම වෙනුවෙන් ගෙවිය යුතු | 642,000 | |
| | ව්‍යාපෘති ණයහිමියෝ | | |
| | කඩිනම් ආහාර සුරක්ෂිතතාවය සහ අවශ්‍යතා ඇගයුම | 7,774 | 7,774 |
| | R-512 ගෝලීය විචලතා හා තිරසාරබව පිළිබඳ කෘෂිකාර්මික පර්යේෂණ තාක්ෂණික නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය | 22,831 | 22,831 |
| | R-530 ශ්‍රී ලංකාවේ තෝරාගත් කලාපවල කෙසෙල්, අඹ සහ අන්නාසි බෝග සඳහා අගය දාමය ශක්තිමත් කිරීම සඳහා වූ පාදක අධ්‍යයනය | | 2,518,787 |
| | R-535 මහවැලි ගංගා දෝණියේ ජීවත්වන ආන්තික ගොවිප්‍රජාව මුහුණ දෙන දේශගුණික විපර්යාසමය බලපෑම්වලට විසඳුම් සෙවීම | | 440,981 |
| | සේවා ගිවිසුම 03-2017 | | 245,902 |
| | R-559 ශ්‍රී ලංකාවේ විවිධ බෝග සඳහා බිංදු ජල සම්පාදනය භාවිතා කිරීමේ බලශක්ති /ජල ඵලදා තක්සේරුව | 648,588 | 648,588 |
| | R-561 -2 | 11,825 | 11,825 |
| | සේවා ගිවිසුම 01-2019 | | 783,850 |
| | සේවා ගිවිසුම 01-2020 | | 488,404 |
| | R-540 එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ 'සම්පත් සුරකිමින් වගා කිරීමේ ප්‍රවේශය ("Save and Grow") ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා පදනම් සොයාගැනීම | | 700,000 |
| | R -581 ශ්‍රී ලංකාවේ විවිධ සහල් වර්ග සඳහා පාරිභෝගික රුචිකත්වය | 542,635 | 1,994,858 |
| | SC- 01/2022 කාලගුණ දර්ශක පදනම් රක්ෂණ වැඩසටහනකට ගොවීන්ගේ සහභාගී වීමේ කැමැත්ත විමසීම සඳහා වන සමීක්ෂණය | 0 | 249,431 |
| | SC - 02/2022 වෙළඳපල ක්‍රියාකාරී දර්ශකය නිමානය කිරීම සඳහා දත්ත එක්රැස් කිරීම (WFP) | 2,040,635 | 537,408 |
| | PR 586 පොහොර සහ අනෙකුත් කෘෂි රසායන ආනයනයේ මෑත කාලීන ප්‍රතිපත්ති වෙනස් කිරීම: කෘෂිකාර්මික නිෂ්පාදනයට සහ ගොවි ජීවනෝපායට බලපෑම සම්බන්ධ අධ්‍යයනය | 1,946,835 | 623,881 |
| | T-442කෘෂි නිෂ්පාදන හා සම්බන්ධ අලෙවි තොරතුරු - බදුල්ල | | 27,881 |
| | T-444 කෘෂි නිෂ්පාදන හා සම්බන්ධ අලෙවි තොරතුරු - මොණරාගල | | 58,109 |
| | Media 01/2023 - 'ගොවිමඟ' පුවත්පත සහ 'ගොවිමඟ' සඟරාව | 721,032 | |
| | R 587 ශ්‍රී ලංකාවේ සැපයුම් දාම ව්‍යුහය ශක්තිමත් කිරීම තුළින් කුඩා හා මධ්‍ය පරිමාණ කෘෂි නිෂ්පාදකයින්ගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා වන අගය දාම විශ්ලේෂණය | 2,653,918 | |
| | SC 01/2023 වෙළඳපල ක්‍රියාකාරී දර්ශකය නිමානය කිරීම සඳහා දත්ත එක්රැස් කිරීම (MFI) | 3,224,750 | |
| | CR 588දේශගුණික කම්පනවලට ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ අවදානම අවම කිරීම සඳහා ඒකාබද්ධ විද්‍යුත් ව්‍යාප්ති සේවාවන් භාවිතා කිරීම.(FMM/GLO/MUL) | 1,987,017 | |
| | R 599 ඒකාබද්ධ ඊ ව්‍යාප්ති සේවාවන් ශක්තිමත් කිරීම හරහා ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දේශගුණික කම්පන සඳහා වන අවදානම අවම කිරීම පිළිබඳ අධ්‍යයනය | 146,122 | |
| | T 452 ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ අවදානම් ගොවි කණ්ඩායම්වල දේශගුණික විපර්යාසයන්ට අනුවර්තනය සඳහා ගොවීන් ගත් ක්‍රම පිළිබඳ අධ්‍යයනය | 230,440 | |
| | T 456 ව්‍යවසායකත්ව සංවර්ධනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන, කෘෂි ව්‍යවසායකයින් ලෙස ගොඩනැගීම සඳහා පවතින අවස්ථා සම්බන්ධයෙන් ග්‍රාමීය ගොවි කාන්තා සහ තරුණ පරපුර දැනුවත් කිරීමේ වැඩසටහන | - | |
| | T-450 කෘෂි ව්‍යාපාර කළමනාකරණය සඳහා අලෙවි තොරතුරු භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන- [illegible] | | 58,219 |
| | T-451 කෘෂි ව්‍යාපාර කළමනාකරණය සඳහා අලෙවි තොරතුරු භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන- මාතලේ | | 71,600 |
| | | **28,959,096** | **24,244,463** |
| | සේවක ප්‍රතිලාභ | | |
| 12 | ජනවාරි 01 දිනට ශේෂය | 58,189,008 | 61,196,120 |
| | වර්ෂය තුළ ගෙවීම් | (7,558,190) | (8,073,475) |
| | වර්ෂය සඳහා වෙන් කිරීම | 4,377,657 | 5,066,363 |
| | දෙසැම්බර් 31දිනට ශේෂය | **55,008,475** | **58,189,008** |
| | රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන | | |
| 13 | ජනවාරි 01 දිනට ශේෂය | 31,195,361 | 34,582,108 |
| | වර්ෂය තුළ ප්‍රාග්ධන දායකත්වය | 18,334,000 | 14,000,000 |
| | පර්යේෂණ හා පුහුණු ක්‍රියාකාරකම් සඳහා ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන | (15,990,000) | (12,827,890) |
| | වර්ෂය සඳහා ක්ෂයවීම | (4,640,694) | (4,558,857) |
| | දෙසැම්බර් 31දිනට ශේෂය | **28,908,768** | **31,195,361** |
| | සංචිත | | |
| 14 | ප්‍රාග්ධන සංචිත | 1,675,000 | 1,675,000 |
| | දීමනා අරමුදල - ආයතනික කොටස | 3,944,846 | 1,701,907 |
| | | **5,619,846** | **3,376,907** |
| | දීමනා සහ පුහුණු අරමුදල | | |
| 15 | දීමනා අරමුදල ව්‍යාපෘති - 10% | | 8,611 |
| | | - | **8,611** |

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

LKR

| | සමුච්චිත ඌනතාව | 2023 | 2022 |
|---|---|---|---|
| 16 | ජනවාරි 01දිනට ශේෂය | (2,534,012) | (8,042,573) |
| | පෙර වර්ෂ ගැලපීම - මාරුකළා | 899,895 | 116,939 |
| | පෙර වර්ෂ ගැලපීම - වර්ෂය සඳහා | | |
| | දෙසැම්බර් 31දිනට ආදායම ඉක්ම වූ වියදම | 16,128,359 | 5,391,622 |
| | දෙසැම්බර් 31දිනට ශේෂය | **14,494,242** | **(2,534,011)** |

| | අනෙකුත් ආදායම් | | |
|---|---|---|---|
| 17 | නේවාසිකාගාර ගාස්තු | 15,301,880 | 7,809,244 |
| | සම්මන්ත්‍රණ ශාලා ගාස්තු | 10,655,800 | 5,176,275 |
| | ප්‍රකාශන අලෙවිය | 44,740 | 156,780 |
| | අආයෝජන පොලී | 375,542 | 271,100 |
| | කාර්යමණ්ඩල ණය පොලී | 967,613 | 1,026,891 |
| | ව්‍යාපෘති තුළින් ලද පුනරාවර්තන දායකත්වය | 465,731 | 783,151 |
| | නිල නිවාස ගාස්තු සහ කාමර කුලී | 225,789 | 270,058 |
| | මිනිස්බල ආදායම් | 27,543 | |
| | වෙනත් ආදායම් | 149,605 | 57,623 |
| | විලම්භිත වියදම් | 5,655,619 | 4,787,504 |
| | සැපයුම්කරුවන් ලියාපදිංචිය - හඳුනා නොගත් | 128,000 | |
| | වෙළඳ දැන්වීම් ආදායම් | | 294,260 |
| | පරිපාලන පිරිවැය | 5,784,745 | |
| | 50වන සංවත්සර ආදායම | | 89,925 |
| | මොබිටෙල් ආදායම | 147,150 | 131,051 |
| | සටහන් පොත් සහ බෑග් අලෙවිය | 2,725 | |
| | ටෙන්ඩර් ගාස්තු | 9,000 | 23,000 |
| | ගොවිමිණ ප්‍රකාශනය | | 2,932,525 |
| | මූල්‍යාධාර ව්‍යාපෘති සඳහා යෙදවූ ප්‍රවාහන පහසුකම් | 10,385,054 | |
| | | **50,326,537** | **23,809,386** |

| | වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ | | |
|---|---|---|---|
| 18 | වැටුප්- ස්ථිර කාර්ය මණ්ඩලය | 76,333,555 | 85,076,103 |
| | වැටුප්- අනියම් විමර්ෂක | 10,995,020 | 13,992,273 |
| | ජීවන වියදම් දීමනාව, විශේෂ දීමනාව හා වෙනත් දීමනා | 31,532,911 | 35,588,790 |
| | සේවක අර්ථ සාධක අරමුදල | 14,920,770 | 16,969,691 |
| | සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල | 2,977,490 | 3,387,937 |
| | අතිකාල දීමනා | 3,329,890 | 2,724,698 |
| | පාරිතෝෂික | 4,377,658 | 5,066,363 |
| | | **144,467,293** | **162,775,856** |

හෙක්ටර් කොබ්බැකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

LKR

| අනෙකුත් වියදම් | 2023 | 2022 |
|---|---|---|
| ගමන් වියදම් හා යැපීම් දීමනා | 6,723,599 | 2,813,979 |
| විදේශීය ගමන් වියදම් | 175,608 | |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 2,184,317 | 1,866,855 |
| ඉන්ධන සහ ලිහිසි තෙල් | 2,284,337 | 1,986,646 |
| නිල ඇඳුම් | 251,702 | 616,014 |
| වාහන අලුත් වැඩියා | 2,712,797 | 1,689,884 |
| ගොඩනැගිලි නඩත්තු කටයුතු | 978,748 | 1,167,050 |
| යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා | 2,809,556 | 3,061,051 |
| දුරකථන ගාස්තු | 3,101,855 | 4,241,254 |
| විදුලිය | 6,633,572 | 3,243,284 |
| ජල බිල්පත් | 1,052,192 | 1,018,994 |
| බදු සහ වරිපනම් | 566,928 | 579,456 |
| තැපැල් ගාස්තු | 351,900 | 168,905 |
| ප්‍රවාහන | 1,161,759 | 734,370 |
| ණය පැහැර හැරී අය මත නීතිමය කටයුතු | | 1,000 |
| වාහන සඳහා කාර්මික උපදෙස් | 75,000 | 30,000 |
| ඉදිකිරීම් සඳහා කාර්මික උපදෙස් | 15,000 | 30,000 |
| පුවත්පත් | 55,870 | 92,850 |
| බලපත්‍ර සහ රක්ෂණය | 292,140 | 1,607,743 |
| ආරක්ෂක ගාස්තු | 4,318,856 | 4,583,635 |
| පිරිසිදු කිරීමේ ගාස්තු | 1,297,673 | 1,108,971 |
| රෙදි සේදීම් | 389,995 | 234,555 |
| විගණන ගාස්තු | 800,000 | 840,000 |
| වෛද්‍ය රක්ෂණ | 781,600 | 874,500 |
| ආපනශාලා ගාස්තු | 966,757 | 257,403 |
| විවිධ වියදම්- අනෙකුත් | 187,757 | 46,765 |
| නීති ගාස්තු | 50,000 | 700 |
| සුබසාධක | | |
| දැන්වීම් | 151,685 | 707,230 |
| සම්මුඛ පරීක්ෂණ ගාස්තු | 14,520 | 4,125 |
| පාලක මණ්ඩලය | 437,255 | 498,290 |
| මුද්‍රණ හා ප්‍රකාශන | 931,374 | 364,871 |
| විනෝදාත්මක | 13,073 | 29,593 |
| තොරතුරු බෙදා හැරීම | 251,729 | 1,079,672 |
| අලෙවි වියදම් - ප්‍රකාශන | 54,169 | 155,670 |
| රඳවා ගැනීමේ බදු | 23,887 | - |
| විගණන හා කළමනාකරණ කමිටු | 126,275 | 128,235 |
| කාර්ය මණ්ඩල සංවර්ධනය | 841,740 | 139,762 |
| කාර්යක්ෂමතා කඩඉම් විභාග ගාස්තු | | |
| සේවක වන්දි | | |
| පරිවර්තන ගාස්තු | 88,965 | 107,904 |
| උපකරණ සහ අනෙකුත් දෑ මත තාක්ෂණික උපදෙස් | | 37,500 |
| මුද්‍රිත පොත් මත අලාභය | | |
| තොග ඌනතා | | |
| අබලි භාණ්ඩ විකිණීම | | 16,333 |
| දත්ත මිල දී ගැනීම | 60,375 | 72,250 |
| ගොවිමිණ ප්‍රකාශනය | | 2,326,094 |
| වැටුප් පාලනය | (1) | |
| අනෙකුත් අංශ සඳහා මුද්‍රණ කටයුතු | | |
| අනෙකුත් අංශ සඳහා ප්‍රවාහන පහසුකම් | | |
| කපා හැරි වියදම් | 54,086 | |
| හානි වූ තොග | 7,047 | |
| අනෙකුත් අංශ සඳහා මුද්‍රණ කටයුතු 1905-17 | - | |
| | 43,275,695 | 38,563,389 |

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සටහන්**

LKR

20 පර්යේෂණ හා පුහුණු - භාණ්ඩාගාර අරමුදල **2023**

| | |
|---|---|
| T 460 | 584,151 |
| Research Forum 2023 | 260,525 |
| Monitoring Research | 166,131 |
| WS 01/2023 | 104,116 |
| T 461 | 742,848 |
| R 589 | 1,158,907 |
| R 591 | 1,585,424 |
| R 593 | 1,208,272 |
| Meadia 03/2023 | 1,522,127 |
| R 590 | 1,708,858 |
| T 462 | 568,812 |
| R 592 | 805,021 |
| R 594 | 528,579 |
| ES 01/2023 | 723,094 |
| T 463 | 556,605 |
| WS 02/2023 | 53,240 |
| R 595 | 1,141,608 |
| R 596 | 1,709,312 |
| Meadia 02/2023 | 353,262 |
| R 598 | 1,176,570 |
| T 464 | 239,958 |
| T 466 | 699,137 |
| T 467 | 529,144 |
| WS 03/2023 | 20,249 |
| Institute Publication | 165,687 |
| T 465 | 625,103 |
| PR 600 | 186,716 |
| WS 04/2023 | 240,246 |
| WS 05/2023 | 11,768 |
| WS 06/2023 | 228,830 |
| Publication 01/2023 | 41,078 |
| | **19,645,376** |

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සටහන්**

21 බාහිර අරමුදල් ඇති ව්‍යාපෘති **-2023**

LKR

| ව්‍යාපෘති අංක | ව්‍යාපෘතියේ නම | වියදම් කළ මුදල | අරමුදල් සපයන ආයතනය |
|---|---|---|---|
| PR 585 | ආහාර ද්‍රව්‍යවල මිල ඉහළ යාම ගෘහ ඒකක වල ආහාර සුරක්ෂිතතාව කෙරෙහි ඇති කරන බලපෑම | 880,634 | WFP |
| PR 586 | පොහොර සහ අනෙකුත් කෘෂි රසායන සම්බන්ධ මෑතකාලීන ප්‍රතිපත්ති විචලතා කෘෂිකාර්මික ක්ෂේත්‍රය කෙරෙහි බලපා ඇති ආකාරය. | 27,226 | WFP |
| T 452 | කෘෂිකාර්මික ව්‍යාප්ති පද්ධතියේ කාර්යක්ෂමතාව සහ ඵලදායිතාවය වැඩි කිරීම ජාතික කෘෂිකාර්මික ව්‍යාප්ති සේවයේ කාර්ය මණ්ඩල ධාරිතා වර්ධනය සඳහා වන දෙදින නේවාසික පුහුණු වැඩසටහන | 2,187,905 | FAO |
| CR 582 | ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ දේශගුණික අවදානම් කණ්ඩායම්වල දේශගුණික අනුහුරුතාව සහ දේශගුණික අනුහුරු ගොවිතැන් පිළිවෙත් පිළිබඳ අධ්‍යයනය | 8,624,197 | World Vision |
| SC 02/2022 | වෙළඳපල ක්‍රියාකාරීත්ව දර්ශකය සකස් කිරීම | 1,796,123 | WFP |
| CR 587 | ශ්‍රී ලංකාවේ සැපයුම් දාම ව්‍යුහය ශක්තිමත් කිරීම තුළින් කුඩා හා මධ්‍ය පරිමාණ කෘෂි නිෂ්පාදකයින්ගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා වන අගය දාම විශ්ලේෂණය | 4,158,453 | JICA |
| SC 01/2023 | වෙළඳපල ක්‍රියාකාරීත්ව දර්ශකය සකස් කිරීම | 4,804,090 | WFP |
| CR 588 | දේශගුණික කම්පනවලට ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ අවදානම් අවම කිරීම සඳහා ඒකාබද්ධ විද්‍යුත් ව්‍යාප්ති සේවාවන් භාවිතා කිරීම | 5,132,020 | FAO |
| CR 597 | අනුරාධපුර දිස්ත්‍රික්කයේ බඩඉරිඟුවල පසු අස්වනු හානිය පිළිබඳ තක්සේරුවක් | 1,924,467 | Ministry of Agriculture |
| CR 599 | දේශගුණික කම්පනවලට ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ අවදානම් අවම කිරීම සඳහා ඒකාබද්ධ ඊ-ව්‍යාප්ති සේවාවන් භාවිතා කිරීම පිළිබඳ අධ්‍යයනය - දෙවන අදියර | 24,930,698 | FAO |
| Media 01/2023 | ගොවිමිණ' ජාතික කෘෂිකාර්මික පුවත්පත ' ගොවිමිණ' දෙමළ මාධ්‍ය සහරා | 3,599,518 | DevPro |
| | | 58,065,331 | |

## 3.2. විගණන නිරීක්ෂණ

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. ARI/B/HAR/FA/01/23/08   ඔබේ අංකය / உமது இல. / Your No.   දිනය / திகதி / Date 2024 මැයි 21 දින

සභාපති
හෙක්ටර් කොබ්බැකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

**හෙක්ටර් කොබ්බැකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

හෙක්ටර් කොබ්බැකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1972 අංක 5 දරන ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, හෙක්ටර් කොබ්බැකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 69 ඡේදයට පටහැනිව 2024 වර්ෂයේදී මිලදී ගත් රු. 1,804,500 ක් වටිනා වත්කම් හා ඒ සඳහා වූ රු. 302,350 ක ක්ෂය වියදම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර තිබුණි.

(ආ) පිරිවැය රු. 71,753,647 ක් වූ සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද මෝටර් වාහන 20 ක් ආයතනය විසින් තවදුරටත් භාවිතා කරමින් පැවතියද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 92 (ආ) ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති අංක 11 ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ ප්‍රදානයන් වශයෙන් ලද රු. 4,298,900 ක් හා ඉකුත් වර්ෂවලදී ලද රු. 32,287,814 ක ශේෂය අයභාර ලෙස ගැලපීමට කටයුතු නොකර ප්‍රාග්ධන සංචිත ලෙස ගිණුම්ගත කර තිබුණි.

1

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

(ඈ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ස්ථාවර වත්කම් අත්පත් කරගැනීම රු. 4,594,039 ක් වුවද රු. 4,135,240 ක් ලෙස රු. 458,799 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) ලැබිය යුතු ශේෂයන්ගේ වෙනස රු. 5,604,410 ක් වුවත් රු. 782,510 ක් වූ අඩමාන ණය වෙන් කිරීම ගැලපීමෙන් පසු ශේෂයන්ගේ වෙනස ගණනය කර රු. 4,820,600 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්වීම නිසා කාරක ප්‍රාග්ධනය රු. 782,510 කින් වැඩිවී තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ මිල දී ගත් රු. 136,687 ක් වූ ජංගම නොවන වත්කමක් යන්ත්‍ර උපකරණ අලුත්වැඩියා වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(උ) රු. 27,607,208 ක් වූ ලී බඩු හා කාර්යාල උපකරණ, රු. 34,413,533 ක් වූ පරිගණක උපකරණ හා රු. 49,701,404 ක් වූ ගොඩනැගිලි සඳහා විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොවීය

(ඌ) 2020 පෙබරවාරි 07 දින සිට 2022 නොවැම්බර් දක්වා වී අලෙවි මණ්ඩලයේ උප සභාපති තනතුර සඳහා පත්කර තිබුණු මෙම ආයතනයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරියා වෙනුවෙන් ඉහත සඳහන් කාලය සඳහා ගෙවන ලද රු. 4,256,574 ක වැටුප් හා දීමනා වී අලෙවි මණ්ඩලයෙන් ලැබිය යුතු මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 ආයතනයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් ආයතනයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක ආයතනයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව

4

ජාතික විගණන කාර්යා
தேசிய கணக்காய்வு அலுவ
NATIONAL AUDIT OFFI
NAOSL

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව

| නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 104(2)(ආ) | 2011 වර්ෂයේදී රු. 1,067,150 ක වැයකර ආරම්භ කළ ජීව වායු ව්‍යාපෘතිය 2016 වර්ෂයේ සිට අක්‍රිය වී තිබුණු අතර 2022 ජූනි 23 දින ඉදිරිපත් කළ පරීක්ෂණ වාර්තාව අනුව හිටපු අධ්‍යක්ෂකවරයා විසින් ටෙන්ඩර් පටිපාටිය උල්ලංඝනය කර එම ව්‍යාපෘතියට අවශ්‍ය අමතර කොටස් මිළදී ගෙන යෙදීම හා අනෙකුත් නිලධාරීන්ද සම්බන්ධ කරගෙන එහි ක්‍රියාකාරීත්වයට බාධා වන පරිදි ක්‍රියාකර ඇති බවට නිගමනය කර ඇතත් සිදුවූ එම අලාභයන් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| (i). IX පරිච්ඡේදයේ 2.2 වගන්තිය | රාජ්‍ය සේවයෙන් ලබා ගත් පුහුණුව භාවිතා කරමින්, කාර්යාල වේලාවන් තුලම කරනු ලබන වැඩ වෙනුවෙන් නිලධාරියාට පෞද්ගලික වනලෙස ගෙවනු ලබන ගාස්තු වෙනුවෙන් සියයට 25 ක් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවත් 2017 සිට 2022 දක්වා ආයතනයේ නිලධාරීන් 38 දෙනෙකුට රු. 3,707,770 ක දීමනා ගෙවා ඇතත් ඒ සඳහා වූ රජයේ ආදායම වූ රු. 926,943 ක් අඩුකර ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. |
| (ii). XIX පරිච්ඡේදයේ 6.3 වගන්තිය | ලේඛකාධිකාරී විසින් ආයතන සංග්‍රහයට පටහැනිව තම නිල නිවසේ කාමර පෞද්ගලික පාර්ශවයන්ට ලබාදීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කර ඔවුන්ගේ නිර්දේශ අනුව කටයුතු කළ යුතු බව මුදල් රෙගුලාසි 104 පරීක්ෂණ වාර්තාවෙහි දක්වා තිබුණ ද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

5

2.3 වෙනත් කරුණු

(අ) 2021 අගෝස්තු මස ආයතනයෙන් ඉවත්ව ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.5,272,016 ක මුදල අයකර ගෙන නොතිබුණි.

(ආ) රු. 17,965,464 ක් වූ විදේශ ශිෂ්‍යත්ව ණයගැති ශේෂයෙන් රු. 12,693,448 ක මුදලක් හා රු. 24,387,625 ක් වූ අනෙකුත් ණයගැති ශේෂයෙන් රු. 2,192,602 ක ශේෂයක් වර්ෂ 05 කට වැඩි කාලයක සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද රු.28,959,096 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂයෙන් රු.2,365,048 ක ශේෂයක් වර්ෂ 05 කට වැඩි කාලයක සිට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2019 මැයි 02 දිනැති ප්‍රධාන පොත් ගබඩාවේ අපහරණය කළ යුතු පොත් හඳුනාගැනීමට පත්කරන ලද කමිටු වාර්තා අනුව රු. 2,191,598 ක් වටිනා පොත් 12,475 ක් ඉවත් කළ යුතු බව දක්වා තිබුණද 2023 දෙසැම්බර් 31 දින වන විටත් අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් එම පොත් වේයන් කා දිරාපත් වෙමින් පැවතුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

## 3.3. විගණන පිළිතුරු

Fin/Aud/Qry/2023 2024-06-11

<u>හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහාවූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්ති ප්‍රකාරව විගණකාධිපතිගේ වාර්තාව</u>

1.1 මතය

1.2 මතය සඳහා පදනම

(අ) පිලිගනිමි
වර්ෂයට අදාල මිලදී ගැනිම් ගිණුම් ගතකර ඇති අතර ක්ෂය නිවැරදිකිරිම කටයුතු කරමි.

(ආ) පිලිගනිමි
ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 හි 92 (ආ) ඡේදය පරිදි මෙම තොරතුරු මූල්‍ය ප්‍රකාශන වලින් ඉදිරියේදි හෙලිදරව් කිරිමට කටයුතු කරමි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 20 (LKAS 20) අනුව 2023 වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම් ගතකර ඇත. නමුත් ඉදිරි වර්ෂයේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති අංක 11 ප්‍රකාරව ගිණුම්ගත කිරිමට කටයුතු කරමි.

(ඈ) පිලිගනිමි

(ඉ) ඉදිරියේදි අඩමානණය වෙන්කිරිමේ ගැලපිමෙන් වන බලපෑම කාරක ප්‍රාග්ධනයෙන් ඉවත් කිරිමට කටයුතු කරන අතර මෙම අඩමානණය වෙන්කිරිම අසම්භාවය බැරකමක් ලෙස හෙලිදරවු කරමි.
